
ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව



වාර්ෂික වාර්තාව

2015

පටුන

	පිටු අංකය
ආයතනික තොරතුරු	2
සංස්ථාවේ දැක්ම සහ මෙහෙවර ප්‍රකාශය	3
ඉලක්කයන් සහ හර වටිනාකම්	3
සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය	4
ආයතනික කළමනාකරණය	5
ජ්‍යෙෂ්ට කළමනාකරණය	6
සභාපතිතුමාගේ ප්‍රකාශය	7
අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව	8
විගණන කමිටු වාර්තාව	9-10
මෙහෙයුම් පිළිබඳ ප්‍රගති සමාලෝචනය	11-16
ආංශික කාර්යසාධනය	
● ඉදිකිරීම්	17-21
● ඉදිකිරීම් උපාංග	22-23
● යාන්ත්‍රික හා විදුලි	24-25
● උපදේශාත්මක	26-29
● විශේෂ මෙහෙයුම්	30
● යන්ත්‍රෝපකරණ	31-32
● මානව සම්පත් හා පාලන	33-35
● අභ්‍යන්තර විගණන	36
● මූල්‍ය	37
විගණකාධිපති වාර්තාව	38-70
මූල්‍ය ප්‍රකාශය	71-121

-

ආයතනික තොරතුරු

සංස්ථාවේ නාමය

ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව

නෛතික තත්ත්වය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ ආණ්ඩුවේ පූර්ණ අයිතිය සතු ව්‍යවසායකි.

අමාත්‍යාංශය

නිවාස හා සමෘද්ධි - 2015.09.20

නිවාස හා ඉඳිකිරිම් (2015.09.21 දින සිට මේ දක්වා)

ලියාපදිංචි කාර්යාලය

130, ඩබ්ලිව්.ඒ.ඩී. රාමනායක මාවත, කොළඹ 02.

දුරකථන : 011-2434691

ෆැක්ස් : 011-2421262

විද්‍යුත් තැපෑල : chairman@secsl.lk www.secsl.lk

ජාතිය ගොඩනැගීමේ නිර්මාණකරුවෝ

දැක්ම

නිර්මාණ කාර්යයෙහි ප්‍රමුඛයා බවට පත්වීම.

මෙහෙවර

සමෘද්ධිමත් ව්‍යාපාරයක් තුළ සේවාදායක සන්තුෂ්ටිය පවත්වා ගනිමින්, තරගකාරී සහ උද්යෝගිමත් ශ්‍රම බලකායක සහභාගිත්වයෙන් යුතුව පර්යේෂණය සහ සංවර්ධනය තුළින් සහාය වන අතිවිශිෂ්ට උපදේශක සේවා, ඉදිකිරීම් නිෂ්පාදන සහ ව්‍යාපෘති කළමනාකරණ සේවා තුළින් නිර්මාණශීලී සහ චිකාබද්ධ ඉංජිනේරුමය විසඳුම් සම්පාදකයා ලෙස ජාතික සංවර්ධනයට දායකත්වය සැලසීම.

අපගේ ඉලක්කයන්

- තාක්ෂණික ප්‍රමිතින්ගේ සහ වෘත්තිමයභාවයේ ඉහළම මට්ටම අත්කර ගැනීම.
- වාණිජමය ඉලක්ක සහිත, මූල්‍ය වශයෙන් ස්ථායී, ස්වයංපෝෂිත, රාජ්‍ය ව්‍යවසායක් බවට පත්වීම.
- සංස්ථාවේ ව්‍යාපාර කටයුතු විවිධාංගීකරණය කිරීම.
- දේශීය තාක්ෂණය සහ දේශීය අමුද්‍රව්‍ය භාවිතය සංවර්ධනය කර ප්‍රවර්ධනය කිරීම.
- ජාතික සංවර්ධන වැඩසටහන් වල ප්‍රමුඛ සහකරුවා බවට පත්වීම.
- සංස්ථාවේ කළමනාකාරිත්වය සහ මානව සම්පත් වැඩි දියුණු කිරීම.

අපගේ හර වටිනාකම්

- සේවාදායක සන්තුෂ්ටිය
- ඒකාබද්ධතාවය
- සමාජ මෙහෙවර
- සේවක සන්තුෂ්ටිය
- සුරක්ෂිතභාවය
- ගුණාත්මකභාවය

අධ්‍යක්ෂ මණ්ඩලය -2015



ආචාර්ය වී.ඊ. ජෝකිම් මහතා
සභාපති



පී.ජේ.වී.පැල්පොල මහතා
උප සභාපති



සරත් පේ.ජයතිලක මහතා
ක්‍රියාකාරී අධ්‍යක්ෂ



ඩබ්ලිව්.එම්.ගැමුණු සිල්වා මහතා
අධ්‍යක්ෂ



පාලිත වල්පොල මහතා
අධ්‍යක්ෂ



එස්.ඩී.එච්.ඩී. ද සිල්වා මෙනෙවිය
අධ්‍යක්ෂ



ඒ.එච්.සුනිල් ගුණවර්ධන මහතා
අධ්‍යක්ෂ



අයි. වික්‍රමනායක ඇලෙක්සන්ඩර් මහත්මිය
අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

ආයතනික කළමනාකරණය

එම්.ඩී.පත්මසිරි මහතා	- සාමාන්‍යාධිකාරි (2015.08.03 දක්වා)
ඩී.ටී. රාජසේකරන් මහතා	- වැඩබලන සාමාන්‍යාධිකාරි
ඒ.ඒ. පියදාස මහතා	- අතිරේක සාමාන්‍යාධිකාරි - ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම්
කේ.ඒ.ශාන්ත කුමාර මහතා	- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි - ඉදිකිරීම් (2015.10.13 දක්වා)
පී.ඩී. කරවිට මහත්මිය	- වැඩ බලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි - ඉදිකිරීම්
ඒ.පී. තෙන්නකෝන් මහතා	- වැඩබලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි - ඉදිකිරීම් උපාංග
කේ.ඊ.එච්.ඒ. රණසිංහ මහතා	- වැඩබලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි - උපදේශාත්මක
ඩබ්.ඒ.පී.කේ. නිශාන්ත මහතා	- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි - යාන්ත්‍රික හා විදුලි
ඩබ්.ඒ.පී.කේ. නිශාන්ත මහතා	- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි - යන්ත්‍රෝපකරණ
යු.ආර්.හෙට්ටිආරච්චි මහතා	- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි - විශේෂ මෙහෙයුම් (2015.10.01 දක්වා)
එම්.එච්. සේනාවීර මහතා	- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි - මූල්‍ය
එස්.පී.ලොකුහැන්නැදිගේ මහතා	- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි - මානව සම්පත් හා පාලන (2015.02.25 දක්වා)
ඩබ්.ඒ.ජේ.ඊ. ප්‍රනාන්දු මහතා	- උපදේශක - මාර්ග හා පාලම්

ජ්‍යෙෂ්ඨ කළමනාකරණය

පී.එම්.ඒ. කරුණාසිංහ මහතා	- කළමනාකරු (මුල්‍ය)
පී.ඩී. කරවිට මහත්මිය	- කළමනාකරු (ඉදිකිරිම්)
ඒ.පී.කේ. මනම්පේරී මහතා	- වැඩ බලන කළමනාකරු (ඉදිකිරිම්)
ඩබ්ලිව්.ජී.ඒ. ගජසිංහ මහතා	- වැඩ බලන කළමනාකරු (ඉදිකිරිම්)
ඒ.එම්.එස්.ටී.බී. අලහකෝන් මහතා	- වැඩ බලන කළමනාකරු (ඉදිකිරිම්)
එස්.පී.එස්. සිරිසේන මහතා	- වැඩ බලන කළමනාකරු (ඉදිකිරිම්)
ටී.විජයකුමාර් මහතා	- වැඩ බලන කළමනාකරු (ඉදිකිරිම්)
සී.ඒ.එස්. හෙට්ටිආරච්චි මහතා	- වැඩ බලන කළමනාකරු (ඉදිකිරිම් උපාංග)
එම්.කේ.එන්. ජයසේකර මහතා	- කළමනාකරු (තොරතුරු තාක්ෂණ)
එල්.එස්.ටී.ලියනගේ මෙනවිය	- කළමනාකරු (මානව සම්පත් / අලෙවි ප්‍රවර්ධන)
ඩබ්ලිව්.ඒ.ඩී.පී. වික්‍රමසිංහ මහතා	- ප්‍රධාන ඉංජිනේරු (යාන්ත්‍රික)
ඩී.ටී. රාජසේකරන් මහතා	- ප්‍රධාන ඉංජිනේරු (නිර්මාණ)
සී.එම්.එස්.ආර්.ප්‍රනාන්දු මහතා	- ප්‍රධාන ඉංජිනේරු (කොන්ත්‍රාත් හා සැලසුම්) (2015.12.08 දක්වා)
පී.එස්.ඩී. රාජනී මහත්මිය	- ප්‍රධාන ඉංජිනේරු (කොන්ත්‍රාත් හා සැලසුම්)
ඩී.එන්.ඒ. ගලප්පත්ති මහතා	- ප්‍රධාන ප්‍රමාණ සම්ක්ෂක
කේ.ඊ.එච්.ඒ. රණසිංහ මහතා	- වැඩ බලන ගෘහ නිර්මාණ ශිල්පී
පී. කුරුවිට මහතා	- ප්‍රධාන අභ්‍යන්තර විගණක
ඊ.එස්.එස්. ද සිල්වා මහතා	- ප්‍රධාන ආරක්ෂක නිලධාරි
ටී.ආර්.ප්‍රේමදාස මහතා	- ප්‍රධාන සැපයුම් නිලධාරි (2015.04.24 දක්වා)
අයි.බී.සිවරත්නම් මහත්මිය	- වැඩ බලන ප්‍රධාන සැපයුම් නිලධාරි



සභාපතිතුමාගේ පණිවුඩය




ආචාර්ය එම්.ඊ. ජෝකිම් මහතා
සභාපති
(ධූර කාලය 2015.02.06 - 2016.09.07)

ආචාර්ය ටී.ඒ.ජී. ගුණසේකර මහතා
වර්තමාන සභාපති
(ධූර කාලය 2016.09.08 දින සිට))

,

බහු විෂයගත ඉංජිනේරුමය හා ඉදිකිරීම් ආශ්‍රිත සංවිධානයක් වශයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ 2015 වර්ෂය සඳහා වූ කාර්ය සාධනය එය මුහුණ දුන් විවිධ දුෂ්කරතා මධ්‍යයේ වුව ද සාමාන්‍ය මට්ටමක පැවතියේය. ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව ස්වකීය ඉංජිනේරුමය හා ඉදිකිරීම් කාර්යයන් පිළිබඳව ප්‍රමුඛ විෂය ක්ෂේත්‍රවලට අයත් ජ්‍යෙෂ්ට වෘත්තීය වේදීන් ද පුද්ගලයන් 3000කට ආසන්න ප්‍රමාණයේ පුහුණු හා නුපුහුණු ශ්‍රම බලකායක් ද සහය කරගනිමින් මතුව පැවැති දුෂ්කර තත්වය මධ්‍යයේ වුවද බොහෝ ව්‍යාපෘති ගණනාවක් සම්පූර්ණ කළේය.සමාලෝචිත වසර තුළ රාජ්‍ය පාලනයෙහි සිදුවූ වෙනසත්, එහි ප්‍රතිඵලයක් වශයෙන් ක්‍රියාවට නැංවෙන රජයේ නව ආර්ථික ප්‍රතිපත්ති හා උපාය මාර්ගවල මුල පිරීමේ කාර්යය සඳහා යම් කාලයක් ගතවීම අවශ්‍ය වීමත් යන හේතූන් මත අනෙකුත් බොහෝමයක් ඉදිකිරීම් ආයතන මෙන්ම ශ්‍රී ලංකා ඉංජිනේරු සංස්ථාවටද විශාල පරිමාණයේ ව්‍යාපෘති ලබාගැනීමෙ කිසියම් පසුබෑමක් පැවතියද, සංස්ථාව ස්වකීය තිරසාර පැවැත්ම වෙනුවෙන් තම කාර්ය සාධනය සතුටුදායක ලෙස මෙහෙයවිය.

ආචාර්ය එම්.ඊ. ජෝකිම් මහතා (නැසිගිය)
සභාපති



ආචාර්ය ටී.ඒ.ජී. ගුණසේකර මහතා
සභාපති



ක්‍රියාකාරී අධ්‍යක්ෂකගේ වාර්තාව

ලංකාවේ මහා පරිමානයේ කර්මාන්ත ශාලා සහ විවිධ සංවර්ධන යෝජනා ක්‍රම ආරම්භක අවධියේදී එම කර්මාන්ත හා යෝජනා ක්‍රම සඳහා අවැසි වූ තැනීම් ආශ්‍රිත ඉංජිනේරු කාර්යයන්හි අවශ්‍යතාවය සපුරාලමින් 1960 දශකය මුල් භාගයේදී ආරම්භ කල ඉංජිනේරු සංස්ථාව 2015 දෙසැම්බර් 31 දින වන විට ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථා නාමය සහිතව සිය අඛණ්ඩ ව්‍යාපාරික පිවිත කාලයේ 53 වසර පසු කරයි. පුරා වසර 53 ක දිගු පිවිත ගමනේදී ශ්‍රී ලාංකික ඉංජිනේරු ක්ෂේත්‍රයට නොමැකෙන පිය සටහන් තබමින් ජාතික ආර්ථිකයට, සංස්කෘතියට මහත් අභිමානයක් ගෙනදුන් තැනීම් කාර්යයන්හි නියැලීය. 2015 න් ආරම්භ වූ වසර තුල තම මෙහෙයුම් ක්ෂෙත්‍රය තුලින් ප්‍රමාණවත් ආර්ථික ප්‍රතිඵල දැක්වීමට අවකාශය නොලද සංස්ථාව සිය ඉදිරි දීර්ඝ ගමන් මාර්ගයේ ශක්තිමත්ව ඉදිරියට යාම පිණිස අවැසි සම්පත් රැස් කරමින්ද, නව ව්‍යාපාරික ක්ෂේත්‍ර කරා යොමු වීමට හැකිවන පරිදි ව්‍යුහාත්මකව වෙනස්කම් මඟින් පුනර්පිවනයක් සඳහා කටයුතු සම්පාදනය කරමින් සිටි.

සරත් පී. ජයතිලක
ක්‍රියාකාරී අධ්‍යක්ෂක

විගණන කමිටු වාර්තාව

සංයුතිය

ඒ.එච්. සුනිල් ගුණවර්ධන මහතා(විධායක නොවන අධ්‍යක්ෂ)- කමිටු සභාපති(භාණ්ඩාගාර නියෝජිත)
ශාස්ත්‍රපති (ආර්ථික) / පශ්චාත් උපාධි ඩිප්ලෝමා (ආර්ථික) / ශ්‍රාස්ත්‍රවේදී(ආර්ථික් 2වන පංතිය) / අධ්‍යක්ෂ (අයවැය) - ජාතික අයවැය දෙපාර්තමේන්තුව

එස්.ඩී.එච්. ද සිල්වාමහත්මිය(විධායක නොවන අධ්‍යක්ෂ)- කමිටු සමාජික(අමාත්‍යාංශ නියෝජිත)
විද්‍යාවේදී (ඉංජිනේරු)/වරලත් ඉංජිනේරු
අතිරේක ලේකම් (වැඩ) නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය

පී.ජේ.එම්. පැල්පොල මහතා(විධායක අධ්‍යක්ෂ)- කමිටු සමාජික
උප සභාපති, ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව

කමිටුවේ කාර්යභාරය

විගණන කමිටුව අධ්‍යක්ෂක මණ්ඩල උප කමිටුවක් වන අතර එය අධ්‍යක්ෂ මණ්ඩලයට වගකීමට බැඳේ.

සංස්ථාවේ මූල්‍ය ප්‍රතිඵල, අභ්‍යන්තර පාලනය සහ අවදානම් කළමනාකරණය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයේ ගිණුම්කරණ ප්‍රමිති සහ වෙනත් අදාළ නීති රෙගුලාසි වලට අනුකූලව මනා පරිචයකින් යුතුව චිලදායී ලෙස කළමනාකාරණය කෙරෙන බවට වගබලා ගැනීම පිණිස අධ්‍යක්ෂ මණ්ඩලයට සහය වීම මෙම කමිටුවේ වගකීම වේ.

★ විගණන කමිටු රැස්වීම්

සාමාන්‍යාධිකාරිගේ දැනුම්දීම මත, 2015 වර්ෂය සඳහා කමිටු රැස්වීම් 04 ක් පවත්වන ලදී. කමිටු ආරාධනය මත සාමාන්‍යාධිකාරි, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මුදල්) සහ ප්‍රධාන අභ්‍යන්තර විගණක සියලුවිගණක කමිටු රැස්වීම් සඳහා සහභාගි වූ අතර රජයේ විගණන අධිකාරි සහ අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක මෙම සියලු රැස්වීම් සඳහා කැඳවුම් ලැබූහ.

කමිටු සාකච්ඡා සටහන් අධ්‍යක්ෂක මණ්ඩලය වෙත යොමු කරන ලද අතර වැදගත් කරුණු අධ්‍යක්ෂ මණ්ඩල රැස්වුම්වලට ඉදිරිපත් කරනු ලැබ සාකච්ඡාවට භාජනය කෙරිණි.

★ ප්‍රධාන ක්‍රියාකාරකම්

2015 වර්ෂය තුළ විගණන කමිටුව පහත දැක්වෙන ප්‍රධාන ක්‍රියාකාරකම් ඉටු කරන ලදි.

- ඉහළ කළමනාකරණයේ මග පෙන්වීම අනුව ශක්තිමත් සහ ඵලදායී පාලනය, අවදානම් කළමනාකරණය සහ අභ්‍යන්තර පාලනය යන කාර්ය ක්ෂේත්‍ර සාක්ෂාත් කර ගැනීම උදෙසා මුළු මහත් ආයතනයේ කැපවීම අරබයා සහය විම.

- අදාළ නීතිරීති, රෙගුලාසි, ආචාර ධර්ම, බැඳියාව පිළිබඳ ගැටුම් සහ විෂමාචාර හා වංචා විමර්ශන යනාදියට අනුකූලව කටයුතු කිරීම හා සම්බන්ධ සංස්ථාවේ ප්‍රතිපත්ති සමාලෝචනය කිරීම.

- මූල්‍ය ප්‍රකාශ වටහාගත හැකි බවටත්, විනිවිදභාවයෙන් සහ විශ්වාසනීයත්වයෙන් පවත්වාගනු ලබන බවටත් සහතික වීම.

- යථා තත්ත්වය, ප්‍රගතිය හා නව ප්‍රවනතා සහ ප්‍රශ්නාන්විත ක්ෂේත්‍ර පිළිබඳව ජ්‍යෙෂ්ඨ කළමනාකරණය සමඟ සංනිවේදනය පවත්වා ගැනීම.

- අභ්‍යන්තර විගණන සැලසුම්, වාර්තා සහ වැදගත් අනාවරණ පිළිබඳ සමාලෝචනය.

- රජයේ විගණන නිලධාරීන් සමඟ සෘජු වාර්තාකරණ සම්බන්ධතාවක් ස්ථාපිත කර ගැනීම.

විගණන කමිටුව වෙනුවෙන්,




විගණන කමිටුවේ සභාපති.
2016 ඔක්තෝබර් 17

මෙහෙයුම් පිළිබඳ ප්‍රගති සමාලෝචනය

පිරිවැටුම හා ලාභය

2015 මුදල් වර්ෂයේදී සංස්ථාව රු.මි. 3,168 ක් වූ පිරිවැටුමක් වාර්තා කර ඇත. ජාතික ආදායම කෙරෙහි ඉදිකිරීම් අංශයෙන් ලද දායකත්වය 2014 වර්ෂයේ 6.6% ක් වූ ප්‍රමාණයේ සිට 0.9% ක් දක්වා 2015 වසර තුළ පහත වැටී තිබූ බව නිරීක්ෂණය විය. මෙම තත්වය සංස්ථාවේ කාර්ය සාධන කෙරෙහි මෙන්ම එහි ප්‍රතිඵලය කෙරෙහිද සමාන බලපෑමක් එල්ල කළේය.



වගුව I (2011 - 2015 සංස්ථාවේ සංසන්දනාත්මක පිරිවැටුම හා ලාභය)


රු. මිලියන

	2011	2012	2013	2014	2015
පිරිවැටුම (ශුද්ධ)	5,473	7,951	7,965	7,403	3168
දළ ලාභය	527	653	522	195	(799)
බදු අඩු කිරීමට පෙර ලාභ/(අලාභය)	252	225	148	46.6	(708)

ඉදිකිරීම් අංශය

2015 මුල්‍ය වර්ෂය තුළ ඉදිකිරීම් කණ්ඩායම රු. මි. 1,608 ක පිරිවැටුමක් වාර්තා කර ඇති අතර ඊට රු. මි. 44.1 ක් වූ එහි අභ්‍යන්තර බිල්පත් වටිනාකමද ඇතුළත් විය. ඉකුත් වසර හා සසඳන කළ පහත දක්වා ඇති පරිදි වර්ෂය තුළ ආදායමෙහි දැඩි කඩාවැටීමක් විද්‍යාමාන වූයේය.

පිරිවැටුම හා ශුද්ධ මෙහෙයුම් ලාභය / (අලාභය)



වගුව II- ඉදිකිරීම් කණ්ඩායමේ පිරිවැටුම සහ ශුද්ධ මෙහෙයුම් ලාභය / (අලාභය)


වසර තුළ කාර්ය සාධනයේ විශේෂ ලක්ෂණ :

- නිමකළ ව්‍යාපෘතිවල වටිනාකම - රු. මි. 765.64
- ප්‍රදානය කරන ලද ව්‍යාපෘතිවල වටිනාකම - රු. මි.1,357.19
- ආරම්භ කරන ලද ව්‍යාපෘතිවල වටිනාකම-රු. මි. 988.13

ඉදිකිරීම් උපාංග අංශය

2015 මූල්‍ය වර්ෂය තුළ ඉදිකිරීම් උපාංග කණ්ඩායම රු. මි. 803.6 ක පිරිවැටුමක් වාර්තා කර ඇත. එය වසර ආරම්භයේදී රු. මි. 2,024 ක් හෙවත් වාර්ෂික ඇස්තමේන්තුගත ආදායම විල්ලේ 40% ක් ලෙස වාර්තා වූ කාර්යඵලයකි. කණ්ඩායමේ කාර්ය සාධනය හා එහි ප්‍රතිඵලය මෙහි පහත දක්වා ඇත.

පිරිවැටුම හා ශුද්ධ මෙහෙයුම් ලාභය / අලාභය




වගුවIII - 2011 - 2015 ඉදිකිරීම් කණ්ඩායමේ පිරිවැටුම සහ ශුද්ධ මෙහෙයුම් ලාභය / (අලාභය)

යාන්ත්‍රික හා විදුලි අංශය

2015 වසර තුළ මෙම අංශයේ පිරිවැටුම රු. මි. 205.6ක් වූයේ ය. මෙය 2014 මූල්‍ය වර්ෂයේ පිරිවැටුම වූරු. මි. 739 හා සසඳන කළ තියුණු පිරිහීමක් වූයේය.

මේ හා සමානවම අංශයේ ශුද්ධ කාර්ය ඵලය තුළ අහිතකර ප්‍රතිඵලයක් විද්‍යාමාන වූ අතර එය රු. මි 160 ක ශුද්ධ අලාභයක් ලෙස ගණනය වුයේය.

පිරිවැටුම සහ ශුද්ධ මෙහෙයුම් ලාභය / (අලාභය)




වගුව ෂV - යාන්ත්‍රික හා විදුලි අංශයේ පිරිවැටුම සහ ශුද්ධ මෙහෙයුම් ලාභය / (අලාභය)

උපදේශක කණ්ඩායම

උපදේශක කණ්ඩායම වෙහි ආදායම රු. මි. 170.4 ක් ලෙස වාර්තා කළ අතර ඒ අනුව කණ්ඩායම වසර තුළ රු.මි.29.9 ක් වූ ශුද්ධ අලාභයක් අත්විඳිදේය.

පිරිවැටුම හා ශුද්ධ මෙහෙයුම් ලාභය / (අලාභය)




වගුව V- උපදේශක කණ්ඩායමේ පිරිවැටුම සහ ශුද්ධ මෙහෙයුම් ලාභය / (අලාභය)

විශේෂ මෙහෙයුම් අංශය

මෙම කාණ්ඩය පළාත්බද මාර්ග අංශයේ තනි ක්‍රියාකාරකම් වෙනුවෙන් ස්ථාපිත කළ අතර අදාළ සේවාදායක ආයතනය විසින් ලබා දී තිබූ මාර්ග සංවර්ධන ව්‍යාපෘති දැඩි ලෙස අඩු කිරීම හේතු කොටගෙන කාණ්ඩායමේ වාර්ෂික පිරිවැටුම සහ ශුද්ධ මෙහෙයුම් ලාභය පසුගිය දෙවසර තුළ පහත දැක්වෙන පරිදි පසුබෑමට ලක්විය.

පිරිවැටුම හා ශුද්ධ මෙහෙයුම් ලාභය / (අලාභය)




වගුව VI - විශේෂ මෙහෙයුම් කණ්ඩායමේ පිරිවැටුම සහ ශුද්ධ මෙහෙයුම් ලාභය / (අලාභය)

යන්ත්‍රෝපකරණ අංශය

ඉදිකිරීම් ක්ෂේත්‍රයේ බර යන්ත්‍රෝපකරණ යොදා ගනිමින් මෙහෙයුම් කටයුතු කරන මෙම අංශයේ කටයුතු 2015 වසර තුළද පසු බෑමක් සිදු වූ අතර අංශය මගින් ලද ආදායම රු.මි. 150 ක් වුවද, 2015 වසර තුළ අත්වූ අලාභය රු.මි. 279 ක් වූයේය.

පිරිවැටුම හා ශුද්ධ මෙහෙයුම් ලාභය / (අලාභය)




වගුව VII - යාන්ත්‍රික හා විදුලි කණ්ඩායමේ පිරිවැටුම සහ ශුද්ධ මෙහෙයුම් ලාභය / (අලාභය)

මුදල් ප්‍රවාහය

2015 වර්ෂය තුළ සේවාදායකයන් විෂයයෙහි මුදල් එකතු කිරීම් තුළ පසුගිය වසර හා සංසන්දනාත්මකව 53% ක් වූ දැඩි පහත බැසීමක් විද්‍යාමාන විය.


සංස්ථාවේ මුදල් එකතු කිරීම.



වගුවVIII – මූදල් ප්‍රවාහ

වත්කම්

2015 වසර තුළ සංස්ථාවේ මුළු වත්කම් 2014 වසර හා සංසන්දනාත්මකව17% කින් ඛාදනයකට ලක් විය. සංස්ථාවට එහි ජංගම වත්කම් ප්‍රමාණය 2014 වසරේ ගණනය වූ රු.මි.11.464 සිට 2015 දී රු.මි. 8.292ක් දක්වා පහත යාමක්ද දක්නට ලැබිණ.



වගුව IX - වත්කම් තත්වය

	2011	2012	2013	2014	2015
ජංගම නොවන වත්කම්	312	8011	8612	8783	8541
ජංගම වත්කම්	7703	9857	10431	11464	8292

වෙනත් ආදායම්

	2011 (රු. 000)	2012 (රු. 000)	2013 (රු. 000)	2014 (රු. 000)	2015 (රු. 000)
කුලිය	7,911	8,480	8,152	8,875	12,975
ස්ථාවර වත්කම් විකිණීම (සේවා කළ නොහැකි වත්කම්)	60	14,895	4,187	4,469	-
වෙනත් (2004 ප්‍රතිපාදන හැර)	14,216	-	-	-	-
ප්‍රතිපාදනය ඉක්මවූ ප්‍රත්‍යාවර්ත තොග	-	-	31,308	-	1,258
බොල් ණය ප්‍රතිපාදන ප්‍රත්‍යාවර්තනය (අධි ප්‍රතිපාදනය)	-	-	18,056	130,538	-
වෙනත් ප්‍රතිපාදන ප්‍රත්‍යාවර්තනය	-	-	22,541	-	-
ප්‍රදාන ක්‍රමක්ෂය කිරීම	-	-	33,343	147,131	397,130
ලියාපදිංචි ගාස්තු ආදායම	-	1,898	2,879	8,193	3,477
විවිධ ආදායම්	-	637	1,249	217	11,595
	22,187	**25,910**	**121,715**	**299,423**	**426,437**

වගුවX –වෙනත් ආදායම

ඉදිකිරීම් කාණ්ඩය

කළමනාකරණයේ ප්‍රධාන සාමාජිකයන්

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ඉදිකිරීම්)	-	ඉංජිනේරු කේ.ඒ. ශාන්ත කුමාර මහතා
කළමනාකරු	-	ඉංජිනේරු පී.ඩී. කරවිට මහත්මිය
වැඩ බලන කළමනාකරු	-	ඉංජිනේරු ඒ.පී.කේ. මනම්පේරි මහතා
වැඩ බලන කළමනාකරු	-	ඉංජිනේරු ඒ.ඩබ්.එස්.ටී.බී. අලහකෝන් මහතා
වැඩ බලන කළමනාකරු	-	ඉංජිනේරු ඩබ්ලිව්.ජී.ඒ. ගජසිංහ මහතා
වැඩ බලන කළමනාකරු	-	ඉංජිනේරු එස්. පී. සුනන්ද සිරිසේන මහතා
වැඩ බලන කළමනාකරු	-	ඉංජිනේරු සී. එල්. මුණසිංහ මහතා
ගණකාධිකාරී	-	එච්.කේ. බන්දුල යෝධීෂ්වර මහතා



ඉදිකිරීම් කාණ්ඩයේ ප්‍රගතිය සමාලෝචනය

ඉදිකිරීම් කාණ්ඩය වසර තුළ රු.මි. 1608 ක ආදායමක් වාර්තා කළ අතර ඉන් 97% ක්ම නියෝජනය වුයේ එහි ප්‍රමුඛ ව්‍යාපාරික කටයුතු වලින් ජනනය වූ ආදායමයි. ඉදිකිරීම් ක්ෂේත්‍රයේ පැවති පසුබට තත්වයක් මධ්‍යයේ වුවද, පසුගිය වර්ෂය හා සංසන්දනාත්මකව 4.5 % ක් වූ සමාන දළ ලාභ අනුපාතයක් පවත්වා ගැනීමට කණ්ඩායමට හැකි විය.

සුපුරුදු අයුරින්ම ඉදිකිරීම් කණ්ඩායම පහත සඳහන් ව්‍යාපෘති ආශ්‍රිත කාර්යයන් නිමකර ඇත. ඒ අනුව 2015 වසරේදී සම්පූර්ණ කරන ලද ව්‍යාපෘති වල මුළු වටිනාකම රු.මි.765.64 ක් වුයේය.

- අදාළව්‍යාපෘති සම්පූර්ණ කිරීම සඳහා පහත සඳහන් කළමනාකරුවන් ඔවුන්ගේ පූර්ණ සහයෝගය ලබා දුන්නේය.

	කළමනාකරුගේ නම	සම්පූර්ණ කළ ව්‍යාපෘති වටිනාකම (රු. මිලියන)
කළමනාකරු	- ඉංජිනේරු පී.ඩී. කරවිට මහත්මිය	531.92
වැඩ බලන කළමනාකරු	- ඉංජිනේරු ඒ.පී.කේ. මනම්පේරි මහතා	17.26
වැඩ බලන කළමනාකරු	- ඉංජිනේරු ඒ.එම්.එස්.ටී.බී. අලහකෝන් මහතා	205.57
වැඩ බලන කළමනාකරු	- ඉංජිනේරු ඩබ්ලිව්.ජී.ඒ. ගජසිංහ මහතා	10.89
		765.64

2015 වසර තුළ භාර ගන්නා ලද ප්‍රධාන ව්‍යාපෘතිවල විස්තර පහත දැක්වේ.

- කටුනායක පිහිටි සිවිල් ගුවන් සේවා අධිකාරියට අයත් ගොඩනැගිල්ල වෙනුවෙන් යෝජිතව පැවති මහල් හයකින් සමන්විත ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ඉදිකර නිම කිරීම.

- පිඹුර මුලික රෝහල සඳහා ළමා රෝග හා එක්ස් කිරණ ඒකකයක්ද, රෝග සායන හා බාහිර රෝගී අංශයක්ද, වාට්ටු සංකීර්ණයක්ද සහිත මහල් තුනකින් සමන්විත ගොඩනැගිල්ලක් ඉදිකිරීම.

2015 වසර තුළ නිමකළ ව්‍යාපෘති

අංකය	වැඩබිම් අංකය	ව්‍යාපෘතියේ නම	කොන්ත්‍රාත් මුදල (රු.මිලියන)
1	1742	කෑගල්ල විද්‍යාලය සඳහා ක්‍රිකට් ක්‍රීඩාංගනය ඉදිකිරීම	156.25
2	1933	ඉංගිරිය ආයුර්වේද ප්‍රතිකාර මධ්‍යස්ථානය ඉදි කිරීම	26.47
3	1980	රත්මලාන විශ්ව විද්‍යාලය සඳහා යෝජිත තෙමහල් ගොඩනැගිල්ල ඉදිකිරීම හා නිම කිරීම	157.67
4	1982	කටුබැද්ද විශ්ව විද්‍යාල විද්‍යායතනය සඳහා යෝජිත තෙමහල් ගොඩනැගිල්ල ඉදිකිරීම හා නිම කිරීම	144.92
5	1985	මාතර විශ්ව විද්‍යාලය සඳහා යෝජිත තෙමහල් ගොඩනැගිල්ල ඉදිකිරීම හා නිම කිරීම	155.06
6	2046	වළවුල්ල, දෙහිඕවිට යෝජිත සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය	8.93
7	2050	යටියන්තොට නෙස්මියර් ගොඩනැගිල්ල ඉදිකිරීම	8.93
8	2070	දිප්පිටිය, අරණායක සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය ඉදිකිරීම	10.7
9	2093	යෝගියාන මාතෘ සායන ගොඩනැගිල්ල ඉදිකිරීම	8.58
10	2140	නාත්තන්ඩිය ඇවිදීමේ මංතීරු ඉදිකිරීම	12.18
11	2153	මොරටුව විශ්ව විද්‍යාලයේ යෝජිත ශිෂ්‍ය මධ්‍යස්ථානය හා ආපන ශාලා ගොඩනැගිලි දිගුව (අතිරේක සිසුන් බඳවා ගැනීම සඳහා) ඉදිකිරීම	47.8
12	2233	කඩුවෙල අවිස්සාවේල්ල පාරේ අංක 603/10/1, දරන ස්ථානයේ පිහිටි ලංකා බැංකු ශාඛා ගොඩනැගිල්ල වැඩිදියුණු කිරීම	10.89
13	2238	යෝධකණ්ඩිය දේවානන්ද මහා විද්‍යාලීය රැස්වීම් ශාලාව ඉදි කිරීම	17.26
එකතුව			**765.64**

2015 වසර තුළ ආරම්භ කළ ව්‍යාපෘති

අංකය	වැඩ බිම් අංකය	ව්‍යාපෘතියේ නම	කොන්ත්‍රාත් මුදල (රුපියල්)
1	2097	ගම්පහ උද්භිද උද්‍යානයේ ඕකිඩ් මල් වගාව සඳහා යෝජිත හරිතාගාරය ඉදිකිරීම	23.76
2	2232	ශ්‍රී ලංකා රුහුණු විශ්ව විද්‍යාලීය ප්‍රධාන පරිපාලන පරිශ්‍රය ඉදිරිපස මායිම් වැට සහ තාප්පය ඉදිකිරීම	10.12
3	2236	කැකුනදුර සති පොළ - අදියර I ඉදිකිරීම	10.24
4	2237	කුඹල්ගමුව සති පොළ - අදියර I ඉදිකිරීම	10.86
5	2238	හ/ දේවානන්ද මහා විද්‍යාලයේ රැස්වීම් ශාලාව ඉදිකිරීම	17.26
6	2241	ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ නීතිගත සංස්ථාවේ ගබඩා සංකීර්ණයේ පිහිටි සිවි මහල් ගොඩනැගිල්ලෙහි තෙවන මහලේ ඉතිරි වැඩ ඉදිකර නිම කිරීම	11.82
7	2243	පොල්ගොල්ල ජාතික සමූපකාර සංවර්ධන ආයතනයේ "ජී" නේවාසිකාගාරය අලුත්වැඩියා කර වැඩි දියුණු කිරීම	9.47
8	2244	පොල්ගොල්ල ජාතික සමූපකාර සංවර්ධන ආයතනයේ මලපවාහන මාර්ගය හා රත්නායක ශාලාව අලුත්වැඩියා කර වැඩි දියුණු කිරීම	7.01
9	2245	පොල්ගොල්ල ජාතික සමූපකාර සංවර්ධන ආයතනයේ "ඩී" නේවාසිකාගාරය අලුත්වැඩියා කර වැඩි දියුණු කිරීම	7.89
10	2246	පොල්ගොල්ල ජාතික සමූපකාර සංවර්ධන ආයතනයේ සභාපතිවරිය සඳහා සේදුම් කාමරයක් ඉදිකිරීම	0.56
11	2249	ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්ව විද්‍යාලයේ උප මහෝපාධ්‍යාය හිමි සඳහා නිල නිවසක් ඉදි කිරීම	34.23
12	2251	ගම්පහ ප්‍රධාන විදුලි ඉංජිනේරු කාර්යාලය සඳහා යෝජිත සිවිමහල් ගොඩනැගිල්ලෙහි මායිම් තාප්පය ඉදිකිරීම	3.83
13	2252	කරමැටිය සති පොළ ඉදිකිරීම	37.71
14	2256	කටුනායක සිවිල් ගුවන් සේවා අධිකාරියේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල සඳහා යෝජිත සය මහල් ගොඩනැගිල්ල ඉදිකර නිම කිරීම	803.37
එකතුව			**988.13**

2015 වසර තුළ ප්‍රදානය කළ ව්‍යාපෘති

අංකය	වැඩබිම් අංකය	ව්‍යාපෘතියේ නම	කොන්ත්‍රාත් මුදල (රු.මිලියන)
01	2232	ශ්‍රී ලංකා රුහුණු විශ්ව විද්‍යාලීය ප්‍රධාන පරිපාලන පරිශ්‍රය ඉදිරිපස මායිම් වැට සහ තාප්පය ඉදිකිරීම	10.12
02	2236	කැකුනදුර සති පොළ - අදියර I ඉදිකිරීම	10.24
03	2237	කුඹල්ගමුව සති පොළ - අදියර I ඉදිකිරීම	10.86
04	2238	හ/ දේවානන්ද මහා විද්‍යාලයේ රැස්වීම් ශාලාව ඉදිකිරීම	17.26
05	2241	ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ නීතිගත සංස්ථාවේ ගබඩා සංකීර්ණයේ පිහිටි සිවි මහල් ගොඩනැගිල්ලෙහි තෙවන මහලේ ඉතිරි වැඩ ඉදිකිරීම කිරීම	11.82
06	2243	පොල්ගොල්ල ජාතික සමූපකාර සංවර්ධන ආයතනයේ "ඡ" නේවාසිකාගාරය අලුත්වැඩියා කර වැඩි දියුණු කිරීම	9.47
07	2244	පොල්ගොල්ල ජාතික සමූපකාර සංවර්ධන ආයතනයේ මලපවාහන මාර්ගය හා රත්නායක ශාලාව අලුත්වැඩියා කර වැඩි දියුණු කිරීම	7.01
08	2245	පොල්ගොල්ල ජාතික සමූපකාර සංවර්ධන ආයතනයේ "ඞ" නේවාසිකාගාරය අලුත්වැඩියා කර වැඩි දියුණු කිරීම	7.89
09	2246	පොල්ගොල්ල ජාතික සමූපකාර සංවර්ධන ආයතනයේ සභාපතිවරිය සඳහා සේදුම් කාමරයක් ඉදිකිරීම	0.56
10	2249	ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්ව විද්‍යාලයේ උප මහෝපාධ්‍යාය හිමි සඳහා නිල නිවසක් ඉදි කිරීම	34.23
11	2251	ගම්පහ ප්‍රධාන විදුලි ඉංජිනේරු කාර්යාලය සඳහා යෝජිත සිවිමහල් ගොඩනැගිල්ලෙහි මායිම් තාප්පය ඉදිකිරීම	3.83
12	2252	කරමැටිය සති පොළ ඉදිකිරීම	37.71
13	2256	කටුනායක සිවිල් ගුවන් සේවා අධිකාරියේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල සඳහා යෝජිත සය මහල් ගොඩනැගිල්ල ඉදිකර නි කිරීම	803.37
14	2258	හම්බන්තොට මාගම් රුහුණුපුර කෞතුකාගාරය සඳහා යෝජිත ගොඩනැගිල්ල	13.07
15	2260	මීගහතැන්න දිසා රෝහලේ බාහිර රෝගී අංශය සහ කාර්යාලය සඳහා යෝජිත ගොඩනැගිල්ල ඉදි කිරීම (II වන අදියර)	60
16	2261	පිඹුර මූලික රෝහල සඳහා ළමා රෝග හා එක්ස් කිරණ ඒකකයක් රෝග සායන හා බාහිර රෝගී අංශයක්ද, වාට්ටු සංකීර්ණයක්ද ස මහල් තුනකින් සමන්විත ගොඩනැගිල්ලක් ඉදිකිරීම.	139.95
17	2262	කටුගහතැන්න රෝහල සඳහා බාහිර රෝගී අංශයක්, හදිසි ප්‍රතිකාර ඒකකයක් සහ වාට්ටු සංකීර්ණයක් සඳහා තෙමහල් ගොඩනැගිල්ල ඉදිකිරීම	95
18	2263	පිඹුර මූලික රෝහලේ වෛද්‍ය නිල නිවාසය සඳහා තෙමහල් ගොඩනැගිල්ල ඉදිකිරීම	64.8
19	2268	කිරිඳිඔය නේවාසික ව්‍යාපෘතියේ කළමනාකරණ කාර්යාලය සඳහා වන නව ගොඩනැගිල්ල ඉදිකිරීම	20
එකතුව			**1357.19**

ඉදිකිරීම් උපාංග කාණ්ඩය

ප්‍රධාන සාමාජිකයෝ

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී	- ඒ.ඒ. පියදාස මහතා
කළමනාකරු	- ඒ.පී. තේන්නකෝන් මහතා
කළමනාකරු	- සී.ඒ.එස්. හෙට්ටිආරච්චි මහතා
ජ්‍යෙෂ්ඨ ව්‍යාපෘති කළමනාකරු (ලුනාව)	- ඒ.ආර්.එල්. විජේබණ්ඩාර මහතා
වැඩ කළමනාකරු (ඒකල)	- බී.ජේ.පී.එදිරිසිංහ මහතා
සහකාරවැඩ කළමනාකරු (රත්මලාන)	- ආර්.එම්.ඕ.බී. රාජකරුණා මහතා
ව්‍යාපෘති කළමනාකරු (සිල්පර අංගනය, දෙමටගොඩ)	- සී.ඒ.එස්. හෙට්ටිආරච්චි මහතා
ගණකාධිකාරී	- කේ.බී.ජී.එච්.එන්. කාරියවසම් මහතා

ප්‍රගති සමාලෝචනය - ඉදිකිරීම් උපාංග කාණ්ඩය

2015 වසර තුළ රටේ යටිතල පහසුකම් සංවර්ධනය මන්දගාමී මට්ටමක පැවති අතර ඊට හේතුව වුයේ ආණ්ඩු මාරුවෙන් පසුව රාජ්‍ය පාලනයේ සංක්‍රමණික අදියර සඳහා වඩාත් දිගු කාලයක් ගතවීමයි. එමගින් ඉදිකිරීම් කර්මාන්ත ක්ෂේත්‍රයේ කටයුතුවලටද පසුබෑම්වලට ලක් වීමට සිදුවිය. සමාලෝචිත වසර තුළ නව ව්‍යාපෘති කිසිවක් භාර නොගැනුනු අතර කෙරෙමින් පැවති ව්‍යාපෘතිවල වැඩ කටයුතු පමණක් ඉටු විය.

මෙම අංශය රු.මිලියන 2024 ක අගයෙන් යුත් ආදායමක් සාක්ෂාත් කර ගැනීමට සැලසුම් කළද, 2015 වසර තුළ ඊට නියමාකාරවම උපදවා ගත හැකි වුයේ රු.මිලියන 803.6 ක් වටිනාකමැති ආදායමක් පමණි. බොහෝමයක් පෙර සවි නිෂ්පාදන අංගන වලින් හා එහි ව්‍යාපෘතිවලින් අපේක්ෂිත කාර්ය සාධනය මුදුන් පමුණුවා ගත නොහැකි වීමට හේතු වුයේ ඊට අවශ්‍ය කාරක ප්‍රාග්ධනය නොමැති වීම හා වෙනත් මූල්‍ය අවහිරතා පැවතීමය.

මෙම වසර තුළ ඉටු කර ගත හැකි වූ ප්‍රධාන කාර්යඵලය වුයේ, චයිනා හාබර් ඉංජිනියරින් සමාගමට අයත් අතුරුගිරිය අධිවේගී මාර්ග අන්තර් හුවමාරුවේ පිහිටි ගාස්තු අය කිරීමේ ද්වාරය හා ඊට අදාළ අනෙකුත් ගොඩනැගිලි පහසුකම් වල ඉදිකිරීම් නිමකර භාර දීමේ කටයුත්තයි. මෙම ව්‍යාපෘතිය ඊට නියමිත සියලු ප්‍රමිතීන් සපුරාලමින් අදාළ කාල රාමු තුළ නිමකර භාර දී ඇත.



2015 වසර තුළනිමකරන ලද ව්‍යාපෘති සමහරක් පහත දැක්වේ.

සේවාලාභියා		ව්‍යපෘතියේ නම	මුදල (රු. මිලියන) (නිම කළ වැඩ ප්‍රමාණය)
1.	චයිනා හාබර් ඉංජිනියරිං සමාගම	අතුරුගිරිය ගාස්තු ද්වාර හා එහි ගොඩනැගිලි පහසුකම්	316.28
2.	කැළණිය විශ්ව විද්‍යාලය	සමාජ විද්‍යා පීඨයේ සය මහල් ගොඩනැගිලි සංකීර්ණය	79.46
3.	කැළණිය විශ්ව විද්‍යාලය	නවීන භාෂා පීඨයේ සිව් මහල් ගොඩනැගිල්ල	52.80
4.	ජාතික නිවාස සංවර්ධන අධිකාරිය	යෝජිත සොයිසාපුර පස් මහල් අඩු ආදායම් ලාභී නිවාස යෝජනා ක්‍රමයේ ඉදිකිරීම් - II වන අදියර	44.64
5.	කැළණිය විශ්ව විද්‍යාලය	වාණිජ හා කළමනාකරණ පීඨයේ තෙමහල් ගොඩනැගිල්ල	22.64


2015 වසර තුළ නිම කළ ව්‍යාපෘති .

ව්‍යාපෘතියේ නම හා එහි කෙටි විස්තරය	දරන ලද වියදම (රු. මි.)	භාරදුන් දිනය	ප්‍රතිලාභියා
කැළණිය විශ්ව විද්‍යාලයේ වාණිජ හා කළමනාකරණ පීඨය සඳහා යෝජිත තෙමහල් ගොඩනැගිල්ල	22.64	20.01.2015	සරසවි සිසු සිසුවියන් සඳහාය
කැළණිය විශ්ව විද්‍යාලයේ භාෂා පීඨය සඳහා යෝජිත සිව්මහල් ගොඩනැගිල්ල	52.8	05.05.2015	සරසවි සිසු සිසුවියන් සඳහාය
යෝජිත සොයිසාපුර මහල් නිවාසයේ අඩු ආදායම්ලාභී නිවාස යෝජනා ක්‍රමයේ ඉදිකිරීම් - II වන අදියර	44.64	15.06.2015	අඩු ආදායම්ලාභී ජනතාව සඳහාය
අතුරුගිරිය අන්තර් හුවමාරුවේ ගාස්තු ද්වාර හා එහි ගොඩනැගිලි පහසුකම් ඉදිකිරීම	316.28	24.07.2015	මගී ජනතාව සඳහාය
කැළණිය විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යා පීඨය සඳහා යෝජිත පස් මහල් ගොඩනැගිල්ල ඉදිකිරීම	79.46	20.12.2015	සරසවි සිසු සිසුවියන් සඳහාය
එකතුව	**515.82**		

යාන්ත්‍රික හා විදුලි කාණ්ඩය

කළමනාකරණයේ ප්‍රධාන සාමාජිකයෝ

ඩබ්ලිව්.ඒ.ඩී.පී. වික්‍රමසිංහ මහතා	- ප්‍රධාන ඉංජිනේරු(යාන්ත්‍රික හා විදුලි)
එච්.එස්.එන්.ජේ. හේවාසිලියන්මහතා	- වැඩ කළමනාකරු (ඒකල වැඩබිම)
එම්.එස්. ඇහැලියගොඩ මහතා	- වැඩ කළමනාකරු (ඩොලමයිට් වැඩබිම)
සන්ජය ධර්මසේන මහතා	- වැඩ කළමනාකරු (රත්මලාන වැඩබිම)
ඊ.එම්.ඩී. ඒකනායක මහතා	- සහකාර වැ. කළ. (පෑලියගොඩ වැඩබිම)
කේ.එන්.එස්. කරුණාරත්න මහතා	- සහකාර වැ.කළ. (රත්මලාන වැඩබිම)
කේ.ජී.ආර්. පුෂ්පකුමාර මහතා	- වැඩබිම් කළමනාකරු. (ගිනි ආරක්ෂණ සේවා)
ඉමන්ත ජයරත්න මහතා	- වැඩබිම් කළමනාකරු. (ඇලුමිනියම් වැඩ)
ඊ.කේ.සී.එස්.මධුරංගමහතා	- වැඩබිම් කළමනාකරු. (රේගු පරිශ්‍රය)
එම්.එම්.ඩබ්ලිව්.එස්. මුහන්දිරම් මහතා	- වැඩබිම් කළමනාකරු. (සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගණය)
ප්‍රදීප් රත්නායක මයා	- කාර්මික ඉංජිනේරු
එස්.ඒ.එන්. ච්‍යාමි මෙනවිය	- විදුලි ඉංජිනේරු
ටී.එස්.අප්සරා රොහාන් මිය	- ගණකාධිකාරී



ප්‍රගති සමාලෝචනය

අඩු ආදායම් මට්ටමක් සනිටුහන් කරමින් මෙම අංශය ස්වකීය ස්ථිර වැඩබිම් හරහා රු.මිලියන 205.6 ක ඉපැයුම් ප්‍රමාණයක් වාර්තා කර ඇති අතර 2015 වසර තුළ අත්කර ගන්නා ලද මුළු ආදායම් ප්‍රමාණයෙන් 80% ක් වූ ප්‍රමාණයක් සඳහා දායකවී ඇත්තේ ඉදිකිරීම් හා නඩත්තු ආශ්‍රිත ව්‍යාපෘති කාර්යයෝය. ඒ හා සමානවම, මෙම දෙඅංශයම රු.මි. 10.2 ක දළ ලාභයක් දක්වා ඇති අතර අනෙකුත් අංශ දැඩි අලාභ අත්විඳිමින් අසතුටුදායක කාර්යකරණයක් විද්‍යාමාන කර ඇත.

ප්‍රධාන ක්‍රියාකාරකම්

- වානේ ව්‍යුහ නිර්මාණය හා ඉදිකිරීම සහ යාන්ත්‍රික හා විදුලි මෙහෙයුම් කටයුතු
- ඉදිකිරීම් කර්මාන්තයට අදාළ බර යන්ත්‍ර සහ උපකරණ කුලියට දීම සහ නඩත්තු කිරීම.
- ඩොලමයිට් පොහොර, හුණු කුඩු සහ ස්ලයිම් ආස්තර නිෂ්පාදනය
- ගොඩනැගිලි පහසුකම් නඩත්තු කිරීම.
- නල එලීමේ ව්‍යාපෘති
- ගිනි ආරක්ෂණය පිළිබඳ ව්‍යාපෘති
- ඇලුමිනියම් වැඩ
- ගොඩනැගිලි පියස් සෙවලි වැඩ

2015 වසර තුළ ප්‍රදානය කරන ලද ව්‍යාපෘති

1. දේවස්ථාන පාර මංසන්ධියේ සිට කැළණි ගඟ දක්වා ෆර්ගසන් පාර ඔස්සේ වැසි ජලය ගලා බැස්සවීමේ ව්‍යාපෘතියේ ඉදිකිරීම්- රු.මි.31.12 (අදියර I)

2015 වසර තුළ නිම කළ ව්‍යාපෘති.

විෂයාංකය	ව්‍යාපෘතියේ නම හා එහි කෙටි විස්තරය	ව්‍යාපෘති වටිනාකම (රු. මි.)	භාරදුන් දිනය
1	කාසල්රී වේල්ල සඳහා ප්‍රතිසංස්කරණ කටයුතු - සිවිල් වැඩ	34.34	30.05.3015
2	කාසල්රී වේල්ල සඳහා ප්‍රතිසංස්කරණ කටයුතු - විද්‍යුත් යාන්ත්‍රික වැඩ - යාන්ත්‍රික හා විදුලි වැඩ	48.02	30.05.3015
3	මැතිවරණ කොට්ඨාශ මට්ටමේ නිවාස යෝජනා ක්‍රමය	9.02	16.01.2015
4	කොතලාවල තාවකාලික ගාස්තු ද්වාරය	63.47	09.09.2015
		154.85	

උපදේශක කාණ්ඩය

කළමනාකරණයේ ප්‍රධාන සාමාජිකයෝ

හයසින්ත් රණසිංහ මහතා	- වැඩ බලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
ඩී.ටී. රාජසේකරන් මහතා	- ප්‍රධාන ඉංජිනේරු (සැලසුම්)
හයිසින්ත් රණසිංහ මහතා	- ප්‍රධාන ගෘහ නිර්මාණ ශිල්පි
ඩී.එම්.ඒ. ගලප්පත්ති මහතා	- ප්‍රධාන ප්‍රමාණ සමීක්ෂක
	- ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු (විදුලි)
මානෙල් ප්‍රියන්ති ද සිල්වා මෙනෙවිය	- ගණකාධිකාරී
රංගිකා අල්විස් මෙනෙවිය	- ජ්‍යෙෂ්ඨ ගෘහ නිර්මාණ ශිල්පි
ඩබ්ලිව්.පී. සුදර්ශන මහතා	- ජ්‍යෙෂ්ඨ ගෘහ නිර්මාණ ශිල්පි
වර්නන් ප්‍රනාන්දු මහතා	- ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු
එන්.ජේ. ජයකොඩි මහත්මිය	- ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු
උදේනි තලගලආරච්චි මහත්මිය	- ජ්‍යෙෂ්ඨ ප්‍රමාණ සමීක්ෂක

ප්‍රධාන ක්‍රියාකාරකම්

ගොඩනැගිලි, සිවිල් ඉංජිනේරු කටයුතු හා යටිතල පහසුකම් පිළිබඳ උපදේශාත්මක සේවා සැපයීම.



ප්‍රගති සමාලෝචනය

උපදේශන අංශය රු.මිලියන 194 ක පිරිවැටුමක් උපදවා ඇති අතර 2015 වසර තුළ මෙම අංශය සිය ඇස්තමේන්තුගත ආදායමෙන් 65% ක්වූ ප්‍රමාණයක් සාක්ෂාත් කරගනු ලැබ තිබේ.

කොළඹ නගරය පුනර්ජනනීය ව්‍යාපෘතිය යටතේ කොළඹගේ මාවතේ නිවාස ඒකක 615 ක් සඳහා නේවාසික අධීක්ෂණ වැඩ II වන අදියර කාර්යයත්, කොළඹ නගරය නාගරික පුනර්ජන ව්‍යාපෘතිය යටතේ අලුත් මාවත නිවාස ඒකක 672 ක් ඉදිකිරීම සඳහා වූ නේවාසික අධීක්ෂණ හා ව්‍යාපෘති කළමනාකරණ වැඩ (04,05 සහ 06 දරන ගොඩනැගිලි කුළුණු) ආශ්‍රිත කාර්යයත්2015 වසර තුළ උපදේශාත්මක අංශය විසින් ඉටු කිරීම සඳහා භාර ගන්නා ලද ප්‍රධාන ව්‍යාපෘති වූයේය.

එසේ භාර ගන්නා ලද උපදේශාත්මක ව්‍යාපෘතිවලින් බොහොමයක් වාස්තු විද්‍යාත්මක, ව්‍යුහාත්මක, විදුලි, ප්‍රමාණ සමීක්ෂණ සහ වායු සමීකරණ හා ගිනි ආරක්ෂණ වැනි විශේෂිත ආකාරයේ සේවා ඇතුළත් සමූහ උපදේශාත්මක සේවා සපයාදීම සඳහා වූ ඒවා වූයේය. එසේ වුවද, නාගරික සංවර්ධන අධිකාරිය වැනි සේවාලාභීන් විසින් ව්‍යුහාත්මක හා විදුලි ඉංජිනේරු සේවා ඇතුළත් ඉංජිනේරුමය සේවා අපේක්ෂා කරන ලද ව්‍යාපෘති ගණනාවක්ද ඒ අතර වූයේය.

2015 වසර තුළ මෙම අංශය ස්වකීය ආයතනික සමාජ වගකීම් ලෙස ආගමික, අධ්‍යාපනික හා සෞඛ්‍ය යන ක්ෂේත්‍රවල සේවා රැසක් ද ඉටුකර දී ඇත.

2015 වර්ෂය තුළ නිමකරන ලද ව්‍යාපෘති

අනු අංකය	ව්‍යාපෘතියේ විස්තරය	ඇස්තමේන්තුගත ඉදිකිරීම් වියදම (රු.මි.)	මුළු උපදේශන ගාස්තුව (රු.මි.)
1	ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලයේ ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය සඳහා වූ ගොඩනැගිල්ල ඉදිකර නිම කිරීම - අදියර I	105.31	6.32
2	ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලයේ මාකඳුර ප්‍රදේශයේ පිහිටුවනු ලබන අධ්‍යයන කාර්ය මණ්ඩලීය අවිවාහක නිල නිවාස සඳහා වූ ගොඩනැගිල්ල ඉදිකර නිම කිරීම.	27.78	1.67
3	කුලියාපිටිය ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලයේ යෝජිත නේවාසිකාගාරය ඉදි කිරීම නිම කිරීම -IV වන අදියර	44.72	2.68
4	කොළඹ 03, ගාලු පාරේ පිහිටි ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ දැනට පවත්නා ගබඩා ගොඩනැගිල්ලට හා යෝජිත බේකරිය හා ලොන්ඩරියට එකතු කිරීම් හා වෙනස් කිරීම් සිදු කිරීම.	11.25	0.67
5	ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ කෞතුකාගාරයක් සඳහා නිර්මාණ සැලසුම් කිරීම හා ඉදිකිරීම.	14.97	0.75

අනු අංකය	ව්‍යාපෘතියේ විස්තරය	ඇස්තමේන්තුගත ඉදිකිරීම් වියදම (රු.මි.)	මුළු උපදේශන ගාස්තුව (රු.මි.)
6	කොළඹ කොටුව, චාමර්ස් ජැටියේ පිහිටි ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ යෝජිත ප්‍රධාන කාර්යාලය සඳහා මහජන ඇමතුම් හා හදිසි හඬ සංනිවේදන පද්ධතියක් සැපයීම, සවිකිරීම හා පරීක්ෂා කිරීම සහ ස්ථාපනය කිරීම.	22.58	1.13
7	කැළණිය විශ්ව විද්‍යාලීය වාණිජ හා කළමනාකරණ පීඨයේ යෝජිත ගොඩනැගිල්ල ඉදිකිරීම හා නිම කිරීම -I වන අදියර (ඉතිරි වැඩ)	156.98	9.42
8	ගාල්ල, හපුගල රුහුණු විශ්ව විද්‍යාලයේ හපුගල පිහිටි ඉංජිනේරු පීඨයේ යෝජිත ශිෂ්‍ය නෝවාසිකාගාරය ඉදිකිරීම. (II වන අදියර - 3 වන මහලේ සිට ඉහළට)	9.26	0.56
9	කොළඹ කොටුව, චාමර්ස් ජැටියේ පිහිටි ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ යෝජිත ප්‍රධාන කාර්යාලය සඳහා ගිනි හා ජීවිත ආරක්ෂණ පද්ධතියක් සැපයීම, සවිකිරීම, ස්ථාපනය කිරීම, පරීක්ෂා කිරීම හා නඩත්තු කිරීම.	209.87	10.49
10	රත්මලාන රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව සඳහා ඖෂධ නිෂ්පාදන ඇසුරුම් හා ගබඩා කර තැබීම් වෙනුවෙන් යෝජිත ගොඩනැගිල්ල ඉදිකිරීම.	72.15	4.33
එකතුව		**674.87**	**38.02**

2015 වසර තුළ ආරම්භ කරන ලද ප්‍රධාන ව්‍යාපෘති

අනු අංකය	ව්‍යාපෘතියේ විස්තරය	ඇස්තමේන්තු ගත ඉදිකිරීම් වියදම (රු.මි.)	මුළු උපදේශන ගාස්තුව (රු.මි.)	අනු අංකය
1	[2015-02]	මිහින්තලේ ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලයේ සර්වෝදය ඉඩමේ දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය සඳහා වූ යෝජිත ගොඩනැගිල්ල	160.00	9.60
2	[2015-06]	බොරැල්ල ආයුර්වේද රෝහල ශික්ෂණ රෝහලක තත්වයට පත්කිරීම සඳහා වූ ඉදිකිරීම - II වන අදියර	1,113.16	12.80
3	[2015-07]	ජාතික ප්‍රවාහන කොමිසම වෙනුවෙන් යෝජිත කින්නියා බස් නැවතුම් පොළ	8.76	0.53
4	[2015-10]	මාතර රුහුණු විශ්ව විද්‍යාලයේ යෝජිත රබින්ද්‍රනාත් තාගෝර් අනුස්මරණ ශ්‍රවණාගාරය	264.78	91

2015 වසර තුළ ආරම්භ කරන ලද ප්‍රධාන ව්‍යාපෘති

අනු අංකය	ව්‍යාපෘතියේ විස්තරය	ඇස්තමේන්තු ගත ඉදිකිරීම් වියදම (රු.මි.)	මුළු උපදේශන ගාස්තුව (රු.මි.)	අනු අංකය
5	[2015-21]	මිහින්තලේ ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාල සනාතන සභා ගොඩනැගිල්ලේ ප්‍රධාන ශ්‍රවණාගාරය අලුත්වැඩියා කිරීම	12.43	0.75
6	[2015-23]	හොරණ මූලික රෝහල සඳහා යෝජිත සය මහල් ගොඩනැගිල්ල	1,751.49	105.09
7	[2015-24]	කටුනායක ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගමේ ශ්‍රී ලංකා ගුවන් සේවා විද්‍යායතනය සඳහා යෝජිත දැනට පවත්නා දෙමහල් ආපනශාලා ගොඩනැගිල්ල පිළිසකර කිරීම	56.13	2.81
8	[2015-26]	ලංකා චක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම සඳහා අපන ශාලාවේ නිර්මාණ සැලසුම් ප්‍රතිසංස්කරණය කිරීම	50.15	2.76
9	[2015-27]	වේරහැර මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව සඳහා යෝජිත ලේඛනාගාර ගොඩනැගිල්ල	79.52	4.77
10	[2015-36]	නාගරික පුනර්ජනනීය ව්‍යාපෘතිය යටතේ කොළඹ නගරයේ කොළඹගේ මාවත නිවාස ඒකක 615ක් සඳහා නේවාසික අධීක්ෂණ වැඩ II වන අදියර	2,171.15	36.91
11	[2015-37]	නාගරික පුනර්ජනනීය ව්‍යාපෘතිය යටතේ කොළඹ නගරයේ අලුත් මාවත නිවාස ව්‍යාපෘතියේ නිවාස ඒකක 672ක් ඉදිකිරීම සඳහා වූ නේවාසික අධීක්ෂණ හා ව්‍යාපෘති කළමනාකරණ වැඩ (04, 05 හා 06 දරන ගොඩනැගිලි කුළුණු)	1,806.54	25.29
එකතුව			**7,474.10**	**213.21**

විශේෂ මෙහෙයුම් අංශය

කළමනාකරණයේ ප්‍රධාන සාමාජිකයෝ

යූ.ආර්. හෙට්ටිආරච්චි මහතා	-නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
එල්.ආර්. අභයරත්න මහතා	-ඉංජිනේරු (සිවිල්)
ඩී.ඩී.ඩී.ටී. ස්ටීවන් මහතා	-ඉංජිනේරු (සිවිල්)
කේ.ඒ.එම්. ලාලින්ද මහතා	-ඉංජිනේරු (සිවිල්)
එම්.එච්.ඩී.පී. කරුණාරත්න මහතා	-ඉංජිනේරු (සිවිල්)
එල්.පී. පලිහක්කාර මහතා	- ඉංජිනේරු (යාන්ත්‍රික)
පී.එස්.එස්. දාබරේ මහතා	- ඉංජිනේරු (යාන්ත්‍රික)
ඒ. ෂන්මුගනාදන් මෙනවිය	- ප්‍රමාණ සමීක්ෂක
කේ.ඒ.ජී. ඩයනා මෙනවිය	- ගණකාධිකාරී

ප්‍රධාන ක්‍රියාකාරකම්

- පළාත්බද මාර්ගවල කාපට් අතුරා සැකසීමේ වැඩ හා ඉදිකිරීම් සහ මාර්ග ව්‍යුහ ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු.

ප්‍රගති සමාලෝචනය

විශේෂයෙන් රත්නපුර, ගාල්ල සහ මාතලේ යන දිස්ත්‍රික්කවල මාර්ග කාපට් අතුරා සකස් කිරීම සඳහා විශේෂ මෙහෙයුම් අංශය 2011 වර්ෂයේ මැද භාගයේදී පිහිටුවන ලදි. සේවාලාභියා වන ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය පළාත් මාර්ග ව්‍යාපෘති 180 ක් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත ප්‍රදානය කරන ලද අතර කි.මී. 711.47ක මුළු දුර ප්‍රමාණයකින් යුත් රු. මිලියන 14,683 ක් පමණ වටිනා ඇස්තමේන්තුගත කොන්ත්‍රාත් අගයක් සහිතව මහාමාර්ග කාපට් ඇතිරීමේ යන්ත්‍රෝපකරණ 80 ක් පමණ සේවයේ යොදා ගනිමින් මෙම කර්තව්‍යයේ සම්පූර්ණ වැඩ කොටස විශේෂ මෙහෙයුම් අංශය විසින් ඉටුකරන ලදි. තවද, සේවා ලාභියා වන කර්මාන්ත හා වාණිජ අමාත්‍යාංශය හා එක්ව ඔවුන්ගේ කෙළොන්නාව පිහිටි කාර්මික වතු පරිශ්‍රයේ අභ්‍යන්තර මාර්ගවල කාපට් ඇතිරීමේ කටයුතුවලද, සේවා ලාභියා වන කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා එක්ව පානදුර පිහිටි මෝදරවැල්ල ක්‍රීඩාංගණය රු.මි. 35.58 ක කොන්ත්‍රාත් අගයක් සහිතව සංවර්ධනය කිරීමේ කටයුතු වලද විශේෂ මෙහෙයුම් අංශය නිරත විය.

2015 වර්ෂය තුළ මෙම අංශය අත්කරගත් සම්පූර්ණ පිරිවැටුම රු.මි. 393.12 ක් වූයේය. 2015 වසර අවසානය වන විට මාර්ග 166 කට වැඩි ප්‍රමාණයක කි.මී. 579 කට අධික දුරක් දක්වා මාර්ගවල කාපට් ඇතිරීමේ කටයුතු නිම කර භාරදීමට මෙම අංශය සමත් විය.

යන්ත්‍රෝපකරණ කණ්ඩායම

කළමනාකරණයේ ප්‍රධාන සාමාජිකයෝ

ඩබ්.ඒ්.පී.කේ. නිශාන්ත මහතා	-නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි
කරුණාසිංහ මහතා	-මූල්‍ය කළමනාකරු {රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව / වැඩ බලන ගණකාධිකාරි (යන්ත්‍රෝපකරණ අංශය)}
එන්.එස්. සිවනාදන් මහතා	-කළමනාකරු (මෙහෙයුම්)
එස්. ජනතකුමාර මහතා	-කළමනාකරු (නඩත්තු)

යන්ත්‍රෝපකරණ අංශය සතුව පහත දැක්වෙන ආදායම් උපදවන මාර්ගත්‍රයක් පවතී.

1. දිවයින පුරා පිහිටි ඩිපෝ ජාල සේවය : බර ඉදිකිරීම් යන්ත්‍රසූත්‍ර සමන්විත ඇණිය බාහිර පාර්ශව සඳහා කුලියට සැපයීම.
2. දිවයින පුරා පිහිටි වැඩහල් ජාල සේවය : යන්ත්‍රෝපකරණ අංශයට අයත් බර ඉදිකිරීම් යන්ත්‍රසූත්‍ර සමන්ඕත ඇණියේ හා රථවාහනවල නිවාරණ හා පිරිවැඩියා නඩත්තු කටයුතු හා දේශීය පෞද්ගලික හා රාජ්‍ය අංශයේ යන්ත්‍රසූත්‍ර හා රථවාහන පිරිවැඩියා නඩත්තු කටයුතු ඉටු කිරීම.
3. ව්‍යාපෘති අංශය : සුළු පරිමාණයේ සිවිල්, යාන්ත්‍රික, වාරිමාර්ග හා කෘෂිකාර්ම කටයුතු ආශ්‍රිත ඉදිකිරීම් කටයුතු හා ඒකාබද්ධ ජල සම්පාදන හා විදුලි අංශයට අයත් කටයුතු හා ව්‍යාපෘති ඉටු කිරීම.

2015 වර්ෂයට අදාළ අයවැය ලේඛනය මෙම ප්‍රධාන ආදායම් උපදවන මාර්ගත්‍රය මත පදනම්ව පැවති අතර එහි ප්‍රගතිය පහත දැක්වේ.

අනු අංකය	විස්තරය	ඩිපෝව	වැඩහළ	ව්‍යාපෘතිය රු. '000
01	2015 - අයවැය / රු. මිලියන	245,717	219,590	522,000
02	ආදායම / රු. මිලියන	70,681	10,480	69,084

රාජ්‍ය ඉංජිනේරු නීතිගත සංස්ථාවේ උපාය මාර්ගික ඒකකය ලෙස යන්ත්‍රෝපකරණ අංශය නව ක්ෂේත්‍රයක් තුළ රටේ තිරසාර සංවර්ධන සංකල්පය විෂයෙහි අත්වැල් බැඳගනිමින් කටයුතු කරන නමුත් 2015 වසර තුළ බාහිර වාතාවරණය ආශ්‍රිත සාධකයන්හී සිදුවූ අනපේක්ෂිත වෙනස්කම් හේතුවෙන් එහි ප්‍රමුඛ ව්‍යාපාරික කටයුතු දැඩි පසුබෑමකට ලක්විය. එහි ප්‍රමුඛ කාර්ය සාධන දර්ශකයන් තුළ ද අයහපත් කාර්ය ඵලයක් නිරීක්ෂණය වූ අතර සංස්ථාවේ ලාභයෙහි කොටස්කරුවකු වන මෙම අංශය ආයතනයේ ව්‍යාපාර කාර්යය පවත්වාගෙන යාමේ දිශානතිය පිළිබඳ නව මූලෝත්පායික ක්‍රියාමාර්ගවලට එළඹීමේ අවශ්‍යතාවය ද එමගින් පෙන්වා දුන්නේය.

කෙසේ වුවද, නව දේශපාලනික හා පරිබාහිර වෙනස්කම් සලකා බැලීමට ලක්කළ යන්ත්‍රෝපකරණ අංශය, ස්වකීය උපායමාර්ගික තරගකරුවන් ප්‍රති ඇගැයුමට භාජනය කර තිරසාර සංවර්ධනය පිණිස අවශ්‍ය වන්නාවූ වෙනස්කම් හඳුනාගත්තේය.

ආරක්ෂිත දුරක සිට පවත්නා තත්වය පිළිබඳව පරීක්ෂාවෙන් පසුවන්නේ ඒපිළිබඳ පදනම් විරහිත විවේචන චිල්ල කරන විවේචකයන් හෝ නිරීක්ෂකයන් හෝ නොවේ. තිරසාර සංවර්ධනය බිහි කරනුයේ අදාළ ක්ෂේත්‍රය පිළිබඳව නිවැරදි සැලැස්ම සහිතව හා ඒ පිළිබඳව තිර අභිලාශයක් පෙරදැරිව ඊට ශ්‍රමය හා ශක්තිය වැය කරමින් එම කාර්යයෙහි අවතීර්ණව කටයුතු කරන පිරිසයි. ඔවුහු තමන්ගේ දක්ෂතා හා අදක්ෂතා පිළිබඳව හොඳින් දන්නා, වටිනා කාර්යභාරයක් සඳහා ස්වකීය කාලය වැඩි වශයෙන් කැප කරන තමන්ටම ආවේණික වූ ආරකින් ක්‍රියා කරන නිපදවන්නන් වන්නාහ. මෙම නිපැයුම් කරුවන් අසමත් වන විට එසේ අසමත් වන්නේ කිසියම් අභිමානවත් විලාශයකිනි. සිදුවන පසුබෑම කිසියම් විවේකයක් අවශ්‍ය ස්ථානයක් සේ සලකා මුළු ජීවිත කාලයම එතැන්හී රැඳී සිටීමට ඔවුහු නොසිතති. ජය හෝ පරාජය නොදන්නා ස්වකීය මාසික කාර්යකරණය කෙලෙස පැවතියත් වැටුප පමණක් සලකා ක්‍රියාකරන නිර්ණාමික තැනැත්තන් අතර ඔවුනට ස්ථානයක් කවරදාකවත් නොමැත්තේය.



මානව සම්පත් හා පාලන අංශය.

2015 වර්ෂය අවසාන වන විට සංස්ථාවේ මුළු සේවක සංඛ්‍යාව 2838 ක් විය. එයින් 2524 දෙනෙකු ස්ථිර කාර්ය මණ්ඩලයට අයත් වූ අතර ඉන් 246 දෙනෙකු කොන්ත්‍රාත් පදනම මතද, 6 දෙනෙකු අනියම් පදනම මතද සේවය කළ සේවකයන් විය.

02. ඒ අනුව, පසුගිය තෙවර්ෂය තුළ කාර්ය මණ්ඩල සාමාජික සාමාජිකාවන් බෙදීගිය ආකාරය පහත දැක්වෙන ප්‍රකාශය මගින් විද්‍යාමාන වේ.

තනතුර	2015		2014		2013	
	ස්ථිර	කොන්ත්‍රාත්	ස්ථිර	කොන්ත්‍රාත්	ස්ථිර	කොන්ත්‍රාත්
සභාපති/උප සභාපති	-	2	-	2	-	2
ක්‍රියාකාරී අධ්‍යක්ෂක	-	1	-	1		1
සාමාන්‍යාධිකාරී	-	-	-	1		1
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (තැනීම්)	1	-	1	-	-	-
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ඉ. උපාංග)	1	-	1	-	1	-
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (යා.හා විදුලි)	-	-	-	-	-	1
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (උපදේශන)	-	-	-	-	1	-
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මා.ස. හා පාලන)	-	-	-	1	-	1
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්)	-	1	-	1	-	1
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වි.මෙ. ඒකකය)	-	-	-	1	-	1
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (යන්ත්‍රෝපකරණ)	-	1	-	1	-	-
කළමනාකරු (මුදල්)	1	-	1	-	-	-
කළමනාකරු (තැනීම්)	1	-	1	-	1	-
ප්‍රධාන ඉංජිනේරු (සැලසුම්)	1	-	1	-	1	-
ප්‍රධාන ඉංජිනේරු (විදුලි)	-	-	-	1	-	-
ප්‍රධාන ඉංජිනේරු (යාන්ත්‍රික)	1	-	-	1	-	-
ප්‍රධාන ඇස්තමේන්තුකරු	-	-	-	-	-	-
ජ්‍යෙෂ්ට ඉංජිනේරු (සිවිල්)	10	-	-	-	-	-
ඉංජිනේරු (තොරතුරු තාක්ෂණ)	-	-	-	-	-	-
ඉංජිනේරු (සිවිල් /යාන්ත්‍රික / විදුලි)	99	43	116	44	88	86
වාස්තු විද්‍යාඥ	25	-	28	1	25	5
ප්‍රමාණ සමීක්ෂක	13	6	17	07	10	18
ගණකාධිකාරී	9	-	09	01	05	05
පරිපාලන නිලධාරී	24	1	22	1	22	-
අනෙකුත් විධායක නිලධාරීන්	16	16	12	68	26	82
ජ්‍යෙෂ්ඨ අධිකාරී (සිවිල් / යාන්ත්‍රික / විදුලි)	13	-	15	-	23	-

අධිකාරී (සිවිල් / යාන්ත්‍රික / විදුලි)	40	71	42	99	30	170
සැලසුම්කරු/ සහකාර ප්‍රමාණ සමීක්ෂක	74	39	50	137	54	144
වැඩනායක(සිවිල් / යාන්ත්‍රික / විදුලි)	58	31	46	49	44	56
ලිපිකරු හා සමාන්තර ශ්‍රේණි	437	7	444	47	263	184
ආරක්ෂක සේවක	218	16	154	03	135	20
අර්ධ පුහුණු සේවක	114	2	118	05	84	47
පුහුණු සේවක	839	8	855	14	654	100
නුපුහුණු සේවක	529	1	575	48	545	156
උප එකතුව	2524	246	2508	534	2012	1080
මුළු එකතුව	**2770**		**3042**		**3092**	

03.ඉකුත් වසරේදී මෙන්ම විශේෂ අලුත් අවුරුදු දීමනා වශයෙන් රු. 5,000 ක මුදලක් ගෙවීමට කටයුතු කරන ලදි.

04.මෙම වසරේදී ද ප්‍රසාද දීමනා වශයෙන් රු. 13,500 ක මුදල් ප්‍රමාණයක් ගෙවීමට කටයුතු කෙරුණු අතර එය දෙවරකින් ගෙවන පරිදි රු. 3,500 ක් වසරේ දෙසැම්බර් මාසයේදී ද, ඉතිරි මුදල 2016 මාර්තු මස වැටුප ද සමග ගෙවීමට කටයුතු කරන බව දන්වන ලදි.

05.ඉකුත් කළමනාකරණ කාල සමය තුළ නිලධාරීන් විසින් කරන ලද වංචා, දූෂණ හා මූල්‍ය අයතා පරිහරණය සම්බන්ධ විමර්ශන වසර තුළ ආරම්භ විය.

06.නව සේවක සංඛ්‍යා ප්‍රතිපාදනය සඳහාවූ අනුමැතිය අනුව කාර්ය මණ්ඩල අන්තර්ග්‍රහණ කටයුතු සිදුකිරීමට කටයුතු කරන ලදි.

07.රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේවෙනමම ව්‍යාපෘතියක් ලෙස 'නෙමෝ' ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට පියවර ගැනුණි.

08.2015 දෙසැම්බර් මස 31 වන දින විට සංස්ථාවේ කාර්ය මණ්ඩලය පහත දැක්වෙන පරිදි වූයේය.

i. ස්ථිර - 2524

ii. කොන්ත්‍රාත් - 246

iii. අනියම් - 68

එකතුව - 2838

09. මානව සම්පත් හා පාලන අංශයේ කාර්ය මණ්ඩලය පහත දැක්වෙන අයවළුන්ගෙන් සමන්විත විය;

i. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් හා පාලන)

ii. කළමනාකරු (පාලන)

iii. සහකාර පිරිස් කළමනාකරු

iv. නීති නිලධාරී
v. ප්‍රධාන ආරක්ෂක නිලධාරී
vi. පරිපාලන නිලධාරී
vii. ලේකම් කටයුතු සහකාර
viii. කළමනාකරණ සහකාර
ix. පොත් බඳින්නා / ලේඛන භාරකරු
x. පණිවිඩකරු
xi. විදුලි සෝපාන ක්‍රියාකරු
xii. කාර්යාල කාර්ය සහයක
xiii. පුහුණු හා නුපුහුණු සේවක

මේ අනුව, මානව සම්පත් හා පාලන අංශයේ කාර්ය මණ්ඩලීය සාමාජික පිරිස 45 දෙනෙකුගෙන් සමන්විත වේ.

අභ්‍යන්තර විගණන අංශය

කළමනාකරණයේ ප්‍රධාන සාමාජිකයෝ

කේ.ඒ. ප්‍රභාත් මහතා - ප්‍රධාන අභ්‍යන්තර විගණක

අභ්‍යන්තර විගණන වාර්තාව

සමාලෝචිත වර්ෂය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අභ්‍යන්තර විගණන සැලැස්ම අනුමැතිය සඳහා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර ඇත.

2015 වසර තුළ ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයා විසින් කළමනාකරණය වෙත විගණන වාර්තා 54 ක් ඉදිරිපත් කර ඇත. සම්පිණ්ඩනය කරන ලද විගණන වාර්තා විගණන හා කළමනාකරණ කමිටුව වෙත සෑම කාර්තුවක් තුළදීම ඉදිරිපත් කරනු ලැබ ඇත.

2015 වසර තුළ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් හතරක් පවත්වා ඇති අතර අභ්‍යන්තර විගණන වාර්තාවල සම්පිණ්ඩනය කරන ලද පිටපත් විගණකාධිපති දෙපාර්තමේන්තුව වෙත යවා ඇත.

පූර්ව විගණන පරීක්ෂණ

සේවකයන්ගේ අවසාන ගෙවීම් (211), සේවකයන්ට ගෙවිය යුතු පාරිතෝෂික (70), හිමිකම් නොපෑ සහතික (174) සහ උප කොන්ත්‍රාත් අවසාන ගෙවීම් (224) යනාදිය සම්බන්ධයෙන් පූර්ව විගණන පරීක්ෂණ පවත්වා ඇත.

සමාලෝචිත වසර තුළ අභ්‍යන්තර විගණන නිලධාරීන් ප්‍රතික්ෂේපිත භාණ්ඩ ඇණවුම් මණ්ඩල රැස්වීම් 13 කට හා ලංසු විවෘත කිරීම් 242 කට සහභාගි වී ඇත.

මුදල් අංශය

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්)	- එම් එච්. සේනවීර මහතා
කළමණාකරු (මුදල්)	- පී.එම්.ඒ. කරුණාසිංහ මහතා
ගණකාධිකාරී (ගෙවීම්)	- බී.එල්.කේ. දයානි මහත්මිය
ගණකාධිකාරී (මුදල්)	- එස්.ඒ.එම්.ඒ.බී.ජේ.කේ. සේනාරත්න මහත්මිය
ගණකාධිකාරී (වැටුප් / වේතන)	- නිලූපා දිල්සාරා මහත්මිය
ගණකාධිකාරී (ඉදිකිරීම්)	- බන්දුල යෝදීස්වර මහතා
ගණකාධිකාරී (ඉදිකිරීම් උපාංග)	- කේ.බී.ජී.එච්.එන්. කාරියවසම් මහතා
ගණකාධිකාරී (යාන්ත්‍රික හා විදුලි)	- ටී.එස්. අප්සරා රොහාන් මහත්මිය
ගණකාධිකාරී (උපදේශාත්මක)	- මානෙල් ප්‍රියන්ති ද සිල්වා මෙනවිය
ගණකාධිකාරී(යන්ත්‍රෝපකරණ)	- කේ.ඩබ්ලිව්.එම්.එල්.ඩී. කීර්තිරත්න මෙනවිය
ගණකාධිකාරී (විශේෂ මෙහෙයුම්)	- කේ.ඒ.පී. ඩයනා මහත්මිය

සංස්ථාවේ මූල්‍ය අංශය සියලු සාවද්‍ය සංකල්ප දුරලමින් නිවැරදි තොරතුරු සහිතව වල්ලවු චෝදනාවලට විරෙහිව නැඟී සිටීමට කටයුතු කළේය. එම අංශයට එබඳු හැකියාවක් ලැබුණේ, විධිමත් පරීදි සැලසුම් කරන ලද අභ්‍යන්තර පිරීක්සුම්වල පසු විපරම් සහිතව පිළිගත් ගිණුම් ප්‍රමිතීන් හා අනුමත ක්‍රියා පරිපාටි මත පදනම්ව සංස්ථාවේ සෑම මූල්‍ය ගණුදෙණුවක්ම සිදුකර තිබූ හෙයිනි.

මෙවන් සිදුවීම් මාලාවක් යටතේ, සංස්ථාවේ මූල්‍ය මෙහෙයුම් හා සම්බන්ධ කටයුතු පසුගිය වසර ගණනාව මුළුල්ලේම තමන් විසින් අනුගමනය කරන ලද ගිණුම් විධික්‍රමයන්හී නිවැරදිතාවය හා යුක්තිසහගත භාවය අනුවම කටයුතු කරමින් ප්‍රමුඛ කාර්ය භාරයක් සංස්ථාවේ මූල්‍ය අංශය විසින් වසර තුළ ඉටු කරන ලද්දේය.

ඉපදවූ ආදායම අඩු මට්ටමක පැවති තත්වයක් යටතේ වුවද, ආයතනයේ ස්ථාවර පිරිවැය දැඩිම පිණිස හිඟ හිට ඇති ඉකුත් ණය එකතු කර ගැනීම සඳහා කඩිනම් ප්‍රයත්නයක් දරන ලදි. සියළුම අංශ වලට අයත් අංශ ප්‍රධානීන් ඒ සඳහා ඉමහත් පරිශ්‍රමයකින් කටයුතු කළ අතර වසර තුළ එකී ඉකුත් පරිශේෂ ණය ප්‍රමාණය 25% ක් වූ මට්ටමක් දක්වා අඩු විය.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය
எனது இல.
My No. සිඊඑන්/සි/එස්ඊසි /1/15/26

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 2017 දෙසැම්බර් 14 දින

සභාපති,

ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව.

ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සි) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

යටෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

එච්.එම්. ගාමිණී විජේසිංහ
විගණකාධිපති

පිටපත් - 1. ලේකම් - නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය.
2. ලේකම් -මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, . - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය எனது இல. My No. } සිවිඑන්/ඔ/එස්ඊසී /1/15/26 ඔබේ අංකය உமது இல. Your No. } දිනය திகதி Date } 2017 දෙසැම්බර් 14 දින

සභාපති,
ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව.

ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනතේ 29(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සංස්ථාවේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී අවස්ථානෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සංස්ථාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 නත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය නත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01

ප්‍රමිතයේ ඡේද අංක 32 අනුව අවශ්‍ය විටක හෝ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත මගින් අවසර දී ඇති විටක හැර වත්කම් හා වගකීම් සහ ආදායම් හා වියදම් එකිනෙකට හිලව් කළ නොහැකි බව දක්වා තිබුණද, නියැදි පරීක්ෂාවට අනුව උපකොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු ගිණුමෙහි හර ශේෂ සහ බැර ශේෂ එකිනෙකට හිලව් කිරීම හේතුවෙන් ණයහිමි බැර ශේෂය රු.110,764,584 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 02

ප්‍රමිතය අනුව තොග අගය කිරීමේදී, පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි යන අගයන්ගෙන් අඩු අගයට තොග අගය කළ යුතු වුවත් 2015 දෙසැම්බර් 31 දිනට තොග ගණනය කිරීමේදී ශුද්ධ උපලබ්ධි අගයෙන් (NRV) සියයට 92.5 ක් පිරිවැය ලෙස සලකා නිමි තොග අගය කිරීම සිදු කර තිබුණි. ඒ අනුව, නිවැරදි පිරිවැය හඳුනාගැනීමකින් තොරව තොග අගය කිරීම හේතුවෙන් තොග අඩුවන හෝ අයිතිගණනය විය හැකි බව නිරීක්ෂණය විය.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16

ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.68,197,875 ක් වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබුණ ද තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ, ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 8 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 37

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) නිශ්චිතව හඳුනාගත හැකි බැඳීම් වෙනුවෙන් අසම්භාව්‍ය බැරකම් සඳහා වෙන් කිරීමක් සිදු කළ යුතු වුවද , සංස්ථාවට එරෙහිව පවරා තිබූ නඩු 02 කට අදාළව නිශ්චිතව හඳුනාගෙන තිබූ රු.16,234,441 ක බැඳීම් සඳහා මූල්‍ය ප්‍රකාශනවල කිසිදු වෙන් කිරීමක් සිදුකර නොතිබුණි.

(ii) 2014 සහ 2015 වර්ෂවලට අදාළව නොගෙවූ එකතුකළ අගය මත බද්දට අදාළ රු.121,782,475 ක දඩ මුදල් හා 2013 වර්ෂයට අදාළ රු.6,941,026 ක දඩ මුදල සඳහා මූල්‍ය ප්‍රකාශනවල වෙන්කිරීම් සිදුකර නොතිබුණි.

(iii) පාරිතෝෂික ගෙවීම් ප්‍රමාද වීම මත ගෙවිය යුතු රු.3,008,204 ක දඩ මුදල් වෙනුවෙන් ප්‍රතිපාදන වෙන් නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අලාභය එම ප්‍රමාණයෙන් ඌනගණනය වී තිබුණි.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2015 දෙසැම්බර් 31 දිනට හත්වන මහලේ උතුරු කොටස ලංකා සිමෙන්ති සංස්ථාවට කුලියට දීමෙන් ලැබිය යුතු මුළු ආදායම රු.8,461,726 ක් වුවද එය රු.9,172,403 ක් ලෙස

ගිණුම්ගත කිරීම හේතුවෙන් ජංගම වත්කම් හා වර්ෂයේ අලාභය රු.710,677 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා සිමෙන්ති සමාගමට හත්වන මහලේ දකුණු කොටස කුලී පදනම මත ලබාදීම වෙනුවෙන් 2014 වර්ෂය හා සමාලෝචිත වර්ෂය සඳහා බදු කුලී ආදායම් පිළිවෙලින් රු.2,130,566 කින් හා රු.2,934,180 කින් අඩුවෙන් දක්වා තිබීම හේතුවෙන් එම වර්ෂයන්හි අලාභය වැඩියෙන් හා ලැබිය යුතු වත්කම් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂවලදී සිදුකළ වැඩ සම්බන්ධයෙන් ව්‍යාපෘති 06 කට අදාළව එකතුව රු.996,342 ක ශුද්ධ ලාභය අතිතානුයෝගීව ගැලපීම් වෙනුවට සමාලෝචිත වර්ෂයේ ලාභයට ගලපා තිබීම හේතුවෙන් වර්ෂයේ අලාභය එම ප්‍රමාණයෙන් ඌනගණනය වී තිබුණි.

(ඈ) 2014 වර්ෂයට අදාළව හඳුනාගත් අමතර වැඩ (Extra Works) 2015 වර්ෂය සඳහා ඉදිරියට ගෙන නොතිබීම හේතුවෙන් ප්‍රවර්තන වර්ෂයේ අලාභය රු.2,119,798 කින් අධිගණනය වී තිබුණි.

(ඉ) ඉදිකිරීම් අංශයට අයත් වැඩබිම් 07 ක හා යන්ත්‍රෝපකරණ හා උපාංග (E&M) අංශයට අයත් එක් වැඩබිමක වර්ෂ කිහිපයක සිට පැවත එන කොන්ත්‍රාත්වලට අදාළව සමාලෝචිත වර්ෂය ආරම්භයේදී රු.11,030,827 ක පිරිවැයක් පෙන්නුම් කළ ද, එයට අදාළ රු.1,355,242 ක ලාභය හඳුනාගෙන නොතිබීම හේතුවෙන් 2015 දෙසැම්බර් 31 දිනට සමුච්චිත අලාභය එම ප්‍රමාණයෙන් අධිගණනය වී තිබුණි.

(ඊ) කොන්ත්‍රාත් වටිනාකම ඉක්මවා පිරිවැය දරා තිබූ වැඩබිම් 03 ක් සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් අදාළ කොන්ත්‍රාත්කරුවන්ගෙන් ලැබිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් ගැලපුම් කරන ලද ආදායම (Adjusted Income) හඳුනාගෙන නොතිබුණි. ඒ අනුව සමුච්චිත පිරිවැය රු.8,366,810 ක් අලාභයක් ලෙස හඳුනාගෙන තිබීම හේතුවෙන් වසරේ අලාභය රු.389,529 කින් අධිගණනය වී තිබුණි.

(උ) අංගොඩ නිවාස ව්‍යාපෘතියට අයත් අවසන් නොග අයිතම 2ක් ද්වි ගණනයවීම හේතුවෙන් අවසන් නොගය රු.396,206 කින් අධිගණනය වී තිබුණි.

(ඌ) රත්මලාන ගබඩාවේ පැවති ලී නොග අයිතම 18 ක වටිනාකම තක්සේරුකර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(එ) වැඩබිම් අංක 1099, 237 හා 343 හි 2014 වර්ෂයේ සෙමින් චලනය වන නොගයේ ඇතුළත් N (වර්ෂයට අඩු) ලෙස වර්ගීකරණය කර ඇති අයිතම 2015 වර්ෂයේද එසේම පැවති අතර එම නොග N1 (වර්ෂයට වැඩි) ලෙස වර්ගීකරණය කළ යුතු වුවත් එසේ කටයුතු කර නොතිබුණි. මෙම සෙමින් චලනය වන නොගයෙහි වටිනාකම රු.11,451,602 ක් වූයෙන් ඒ මත සියයට 15 ක ප්‍රතිපාදන වෙන්කළ යුතු වුවත් එපරිදි කටයුතු කර නොතිබීම හේතුවෙන් නොග වටිනාකම රු.1,717,740 කින් අධිගණනය වී තිබූ අතර සමාලෝචිත වර්ෂයේ අලාභය එම ප්‍රමාණයෙන් ඌන ගණනය වී තිබුණි.

(ඒ) විගණනයේදී සිදුකළ නියැදි පරීක්ෂණයට අනුව, වැඩබිම් අංක 343 හා 237 යන ස්ථානවල නිමි නොග අගය කිරීමේදී වසරකට වැඩි කාලයක් (N1) සහ වසර 2 කට වැඩි කාලයක් (N2) පැවති අයිතමවල 2015 වර්ෂයේ සත්‍යාපන වටිනාකම් 2014 වර්ෂයේ වටිනාකමට වඩා රු.677,338 කින් වැඩියෙන් දක්වා තිබීම හේතුවෙන් වර්ෂයේ අලාභය එම වටිනාකමින් අඩුවෙන් සහ වත්කම් එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඔ) වැඩබිම් අනුව, ඉදිරිපත් කරන ලද රු.3,967,410,436 ක වටිනාකමකින් යුත් පිරිවැය ලේඛනයෙහි රු.1,433,820 ක වටිනාකමකින් යුත් බැර ශේෂ නිරීක්ෂණය වූ අතර, විකුණුම් පිරිවැය එම වටිනාකමින් අවප්‍රමාණය වී තිබුණි.

(ඕ) ණයගැති අපහායනය සඳහා වෙන් කිරීම් පිළිබඳ නියැදි පරීක්ෂාවේදී ණයගැති ශේෂ නොමැති හා සත්‍ය ණයගැති ශේෂය ඉක්මවා රු.74,584,331 ක වෙන්කිරීම් සිදුකර තිබුණු බව නිරීක්ෂණය විය.

(ක) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 44 වැනි වගන්තිය ප්‍රකාරව සංස්ථාවට පවරා තිබූ අක්කර 13 රූඩ් 03 පර්චස් 35 ක් වූ ඒකල පිහිටි ඉඩමේ වටිනාකම සමාලෝචිත වර්ෂයේ ගිණුම්වලට ගෙන නොතිබුණි.

2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) තොග සමීක්ෂණ වාර්තා අනුව, 2015 දෙසැම්බර් 31 දිනට භෞතික තොග ශේෂ බින් කාඩ්පත් ශේෂ සමග සැසඳීමේදී බින් කාඩ්පත් 149 කට අදාළ තොග අයිතමයන්ගේ වටිනාකම් අතර රු.5,297,373ක ඌනතාවයක් හා බින් කාඩ්පත් 57 කට අදාළව රු.3,243,713ක අතිරික්තයක් පැවති බව නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව ගෙවිය යුතු ආර්ථික සේවා ගාස්තුව රු.19,903,480 ක් වුවත් උපලේඛනය අනුව එම ශේෂය රු.6,767,360 ක් වූයෙන් රු.13,136,120 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) යාන්ත්‍රික හා විදුලි අංශයේ (E&M) සේප් පරිගණක මෘදුකාංගයේ 2015 දෙසැම්බර් 31 දිනට අපහායනය සඳහා වෙන් කිරීම් ගිණුමේ ශේෂය රු.117,697,607 ක් වුවද, ඉදිරිපත් කරන ලද උපලේඛනය අනුව එම ශේෂය රු.117,687,606 ක් වූයෙන් රු.10,000 ක වෙනසක් විය.

(ඈ) 2015 දෙසැම්බර් 31 දිනට කේවල ණයගැති ශේෂයන් සම්බන්ධ සටහන් නිවැරදි ලෙස හඳුනා නොගැනීමෙන් ණයගැති ශේෂ තුළ රු.106,981,333 ක අසාමාන්‍ය බැර ශේෂයන් ඇති වී තිබුණි.

(ඉ) යන්ත්‍රෝපකරණ හා උපාංග අංශයේ ඉදිරිපත් කළ උපලේඛන අනුව, ගණුදෙනුකරුවන්ගෙන් ලැබිය යුතු වටිනාකම් රු. 173,856,115 ක් වූ අතර අවසන් මූල්‍ය ප්‍රකාශන අනුව එම ශේෂය රු. 197,876,934 ක් වූයෙන් රු. 24,020,819 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඊ) ඉදිකිරීම් උපාංග අංශයට හා යාන්ත්‍රික, විදුලි හා යන්ත්‍රෝපකරණ අංශයට (M & E) අයත් වැඩබිම් 02 ක සමාලෝචිත වර්ෂයට අදාළ පිරිවැය රු.223,839 ක සෘණ අගයක් පෙන්නුම් කළ අතර මෙම අසාමාන්‍ය ශේෂය ඇතිවූ ආකාරය පැහැදිලි කර නොතිබුණි.

(උ) ණයගැනි ශේෂ සනාථ කිරීම් පිළිබඳ සිදුකරන ලද නියැදි පරීක්ෂාවේදී ආයතන 05 කින් ලද තොරතුරු මත සංස්ථාව විසින් ඉදිරිපත් කරන ලද ණයගැනි ශේෂය හා ඒ ඒ ආයතනවලින් ඉදිරිපත් කරන ලද ණයගැනි ශේෂ අතර රු.283,475,081 ක වෙනසක් නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

ආයතනයේ නම	සංස්ථාවේ ශේෂය	ණයගැනි ශේෂ සනාථ කිරීම් අනුව ශේෂය	වෙනස
	රු.	රු.	රු.
භික්ෂු විශ්ව විද්‍යාලය	35,899,936	47,957,674	12,057,738
නාගරික සංවර්ධන අධිකාරිය	165,502,006	62,641,518	102,860,488
රජරට විශ්ව විද්‍යාලය	186,960,033	49,392,149	137,567,884
රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව	6,866,665	4,838,593	2,028,072
දේශීය ආදායම් දෙපාර්තමේන්තුව	66,806,000	37,845,101	28,960,899
එකතුව			283,475,081

2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම්

පහත සඳහන් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවිය.

	ගිණුම් විෂයය	වටිනාකම (රු.)	ඉදිරිපත් නොවූ සාක්ෂි
(අ)	බැංකු ජංගම ගිණුම් - 02	213,835	ශේෂ සනාථ කිරීම්
(ආ)	ඉදිකිරීම්, යන්ත්‍රෝපකරණ හා සේවා යන අංශයන්ට අයත් බැංකු ගිණුම	18,693,422	2015 දෙසැම්බර් 31 දිනට බැංකු ප්‍රකාශන
(ඇ)	අක්‍රිය බැංකු ගිණුම - නේපාලය	1,880,176	2015 දෙසැම්බර් 31 දිනට ශේෂ සනාථ, බැංකු සැසඳුම්
(ඈ)	සේවා අංශයේ ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු වටිනාකම්	543,895,470	විස්තරාත්මක උපලේඛන

2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ හත්වන මහලේ දකුණු කොටස සිමෙන්ති සමාගමට කුලියට දීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ හත්වන මහලේ දකුණු කොටස, 2007 ජනවාරි 01 දින සිට 2008 දෙසැම්බර් 31 දක්වා වසර 02 ක කාල පරිච්ඡේදයකට බදු දීම සඳහා 2007 මාර්තු 08 දින සිමෙන්ති සමාගම සමග බදු ගිවිසුමකට එළඹ තිබුණද, එම කාලය ඉක්මවා 2015 ජුනි මාසය දක්වා භාවිතා කර තිබුණි. ඒ සඳහා හිඟ හිටි කුලී වටිනාකම් රු.20,362,650 ක් හා ඊට අමතරව රු.3,458,495 ක විදුලි හා ජල

ගාස්තුවක්ද අයවිය යුතුව තිබුණද මෙම මුදල් අයකර ගැනීම සඳහා ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ii) ලංකා සිමෙන්ති සමාගම සමග ඇතිකර ගෙන තිබූ බදු ගිවිසුමෙහි සඳහන් ඉඩ ප්‍රමාණය වර්ග අඩි 2,976 ක් වුවද, එම සමාගම විසින් සත්‍ය ලෙස පරිහරණය කරන ලද ඉඩ ප්‍රමාණය වර්ග අඩි 3,175 ක් විය. ඒ අනුව අතිරේකව භාවිතා කරන ලද වර්ග අඩි 199 වෙනුවෙන් 2007 වර්ෂයේ සිට 2015 ජුනි 30 දක්වා රු.1,596,878 ක ආදායමක් අයවිය යුතුව තිබුණි.

(iii) 2006 දෙසැම්බර් 1 දිනට පෙර සිට පැවත එන හිහ ජල හා විදුලි ගාස්තු සඳහා රු.690,610 ක මුදලක් මේ දක්වා අයකරගෙන නොතිබුණි.

(ආ) රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ හත්වන මහලේ උතුරු කොටස ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවට කුලියට දීම.

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ ප්‍රධාන කාර්යාලයේ හත්වෙනි මහලෙහි උතුරු කොටස 2007 ජනවාරි 01 සිට 2009 දෙසැම්බර් 31 දක්වා වසර 03 ක කාලපරිච්ඡේදයකට බදු දීම සඳහා ගිවිසුම්ගත වී තිබුණද ගිවිසුම් කාලය ඉක්මවා 2012 දෙසැම්බර් 31 දින දක්වා භාවිතා කර තිබුණි. ඒ වෙනුවෙන් අයවිය යුතු රු.7,609,925 ක් විගණන දිනය වූ 2016 ජනවාරි 08 දක්වා අයකර ගෙන නොතිබුණි.

(ii) ගිවිසුම්ගත වර්ග අඩි ප්‍රමාණය 2,222.37 ක් වුවද ලංකා සිමෙන්ති සමාගම වර්ග අඩි 2,365 ක භූමි ප්‍රමාණයක් පරිහරණය කොට ඇති අතර ඒ අනුව අතිරේකව භාවිතා කරන ලද වර්ග අඩි 142.63 ක ප්‍රමාණය වෙනුවෙන් 2007 වසරේ සිට 2012 දෙසැම්බර් දක්වා රු.756,722 ක මුදලක් අයකරගෙන නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විශේෂ මුදල් අත්තිකාරම් රු.5,649,349 ක ශේෂයක් නිරීක්ෂණය වූ අතර ඉන් රු.5,163,834 ක ශේෂයක් වර්ෂ 03 කට අධික කාලයක සිට නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ඉදිරිපත් කරන ලද වයස් විශ්ලේෂණය අනුව වසර 3 ත් වසර 5 ත් අතර ණය හිමි ශේෂය රු.15,589,164 ක් සහ වසර 5 ඉක්මවූ ණය හිමි ශේෂය රු.348,682,368 ක් වුවත් එම ශේෂ නිරවුල් කිරීම සඳහා සුදුසු ක්‍රියා මාර්ගයක් ප්‍රවර්තන වර්ෂයේ දෙසැම්බර් 31 වන විටත් ගෙන නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය අවසානයට රු.3,455,828,381 ක් වූ වෙළඳ ණය ගැනි ශේෂයෙන් සියයට 95කට වැඩි ප්‍රමාණයක් රාජ්‍ය ආයතනවලින් අයවිය යුතුව තිබූ අතර, ඉන් රු.1,074,632,091 ක් හෙවත් මුළු වටිනාකමින් සියයට 33 ක් වර්ෂ 05 කට වඩා කල් ඉකුත් වූ ණය ශේෂයන් විය. මෙම මුදල් අයකර ගැනීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඊ) වර්ෂ 05 කට වැඩි කාලයක සිට පැවත එන ණයගැතියන් ලෙස නිශ්චිතව හඳුනා නොගත් රු.7,444,055 ක් විවිධ ණයගැතියන් ලෙස දක්වා තිබුණ ද එම ශේෂ හඳුනාගෙන අයකර ගැනීමට හෝ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(උ) මුදල් රෙගුලාසි 217 ප්‍රකාරව කිසියම් මුදල් වර්ෂයක් තුළදී ගෙවීමට නියමිත මුදල් සියල්ලක්ම හැකිතාක් දුරට එම වර්ෂයේම ගෙවිය යුතුය. එහෙත් නියැදි විගණන පරීක්ෂාවට අනුව අවුරුදු 3 සිට අවුරුදු 5 දක්වා එකතුව රු.98,311,491 ක් හා අවුරුදු 5 ට වැඩි රු.96,452,897 ක් උප කොන්ත්‍රාත්කරුවන්ට ගෙවා නොතිබුණි. එමෙන්ම උපචිත වියදම් හා අනෙකුත් වෙන් කිරීම් ශේෂය තුළ වසර කිහිපයක සිට පැවත එන රු.55,525,662 ක ශේෂ පැවති බව නිරීක්ෂණය විය.

(ඌ) ඉදිකිරීම් අංශය හා ඉදිකිරීම් උපාංග අංශය විසින් සිදුකරන ලද ව්‍යාපෘති 05 ක් වෙනුවෙන් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයෙන් ලැබිය යුතු රු.818,462,729 ක් 2015 දෙසැම්බර් 31 දින දක්වා අය වී නොතිබුණි. තව ද විගණනයේදී අනාවරණය කර ගත් තොරතුරු අනුව, මෙම අය විය යුතු වටිනාකම, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ 2015 දෙසැම්බර් 31 දිනට පිළියෙල කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව රු.567,601,808 ක් විය.

(එ) උප කොන්ත්‍රාත්කරුවන් වෙත ගෙවන ලද එකතුව රු.248,519,329 ක් ගෙවීම් කර වසර 05 ක් ඉක්මවා තිබුණ ද ඒවා නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

	නීති රීති හා රෙගුලාසි යනාදියට යොමුව	අනුකූල නොවීම්
(අ)	2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත.	2015 වර්ෂයට අදාළ එකතු කළ අගය මත බදු රු.88,165,979 ක් ගෙවීමට කටයුතු කර නොතිබුණි.
(ආ)	2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ ඡේද අංකය 114	ප්‍රසාද දීමනා මත ගෙවිය යුතු රු.132,959 ක උපයන විට ගෙවීම් බදු ගෙවා නොතිබුණි.
(ඇ)	2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු (සංශෝධිත) පනතේ ඡේද අංක 02	කාර්තුවකට රු.මිලියන 50 කට වඩා වැඩි ආදායම් උපයන ආයතන විසින් කාර්තුවකට උපරිම රු.මිලියන 30 කට නොවැඩි වනසේ කාර්තු පදනම් මත ආදායමෙන් සියයට 0.25 ක ආර්ථික සේවා ගාස්තුවක් ගෙවිය යුතුය. එසේ සංස්ථාව විසින් 2015 වර්ෂයේ උපයන ලද ආදායම් වන රු.3,168,016,408 කට අදාළව විගණනයේ ගණනය කිරීම් අනුව ගෙවිය යුතු වූ රු.7,920,041 ක ආර්ථික සේවා ගාස්තු ගෙවීමට කටයුතු කර නොතිබුණි.
(ඈ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුද්‍රල් රෙගුලාසි සංග්‍රහය	
	(i) මුදල් රෙගුලාසි 396 (ඇ)	2015 දෙසැම්බර් 31 දිනට නිකුත් කර මාස 06 ක කාලයක් ඉකුත් වූ වටිනාකම් රු.1,524,787 ක් වූ චෙක්පත් 28 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඉ)	2015 දෙසැම්බර් 09 දිනැති අංක 02/2015 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 3 ඡේදය	චක්‍රලේඛය ප්‍රකාරව නියමිත දිනට ගිණුම් විගණකාධිපති වෙත ඉදිරිපත්කර නොතිබියදී සේවකයින් 2,492 දෙනෙකු සඳහා රු.8,421,000 ක මුදලක් ප්‍රසාද දීමනා ලෙස ගෙවීම් කර තිබුණි.
(ඊ)	2009 ජූලි 01 දිනැති අංක ඩීඑම්ඒ/2009(2) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය	චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනයේ තොරතුරු ඇතුළත් කර නොතිබුණි.
(උ)	2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය	පරිගණක උපාංග හා මෘදුකාංග සම්බන්ධව වෙනම ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි.
(ඌ)	1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල හා 1980 අංක 46 දරන සේවා නියුක්ති භාර අරමුදල	2006 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට ජීවන වියදම් දීමනාව නොසලකා ගෙවීම් කිරීම හේතුවෙන් එකතුව රු.මිලියන 184.7 ක් හා සමාලෝචිත වර්ෂයේ සංස්ථාවේ දායකය පිළිවෙලින් රු.21,336,900 ක් හා රු.5,334,225 ක් අඩුවෙන් ප්‍රේෂණය කර තිබුණි.
(එ)	1979 දෙසැම්බර් 20 දිනැති හා ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ සභාපති විසින් නිකුත් කරන ලද අංක 121/1979 දරන චක්‍රලේඛයේ 2 (ඇ) ඡේදය	ඇණවුම් සමග වෙක්පත් අත්තිකාරම් ලබාදීමෙන් පසු දින 30 ක් ඇතුළත එම අත්තිකාරම් පියවිය යුතු වුවද ලබාදෙන ලද එකතුව රු.68,191,290 ක අත්තිකාරම් වසර 3කට වඩා වැඩි කාලයක සිට නිරවුල් කර නොතිබුණි.


3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ සංස්ථාවේ මූල්‍ය ප්‍රතිඵලය රු.744,581,777 ක ශුද්ධ ලාභයක් වූ අතර, එයට ප්‍රතිරූපිව ඉකුත් වර්ෂයේ ශුද්ධ ලාභය රු.74,534,988 ක් වූයෙන් ඉකුත් වර්ෂය සමග සැසඳීමේදී ශුද්ධ ලාභය රු.819,116,765 කින් පිරිහී තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ හා ආදායම රු.4,235,402,252 කින් අඩු වී තිබීම ඉහත පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 වර්ෂයේ සිට මූල්‍ය අතිරික්තයක් ඇති වී තිබුණ ද 2012 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා එය අඛණ්ඩව පිරිහී තිබුණි. ඒ අනුව 2011 වර්ෂයේදී රු.206,152,011 ක අතිරික්තය සමාලෝචිත වර්ෂය අවසානය වන විට රු.744,581,777 ක ඌනතාවයක් වී තිබුණි. තවද, මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, රාජ්‍ය බදු හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැලපීමෙන් පසු 2011 වර්ෂයේ රු.589,687,734 ක ධන අගයක්ව පැවති දායකත්වය සමාලෝචිත වර්ෂය අවසානයට රු.218,214,484 ක ඍණ අගයක් බවට පත් වී තිබුණි.

පසුගිය වර්ෂ 04 ක් තුළ සංස්ථාවේ ආදායම, ශුද්ධ වත්කම්, දළ ලාභය හා ශුද්ධ ලාභයෙහි විචලනයන් පහත රූප සටහන් මඟින් ඉදිරිපත් කෙරේ.





3.2 විශ්ලේෂණාත්මක මූල්‍ය සමාලෝචනය

(අ) විගණනය වෙත ඉදිරිපත් කරන ලද තොරතුරු මත පදනම්ව සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කළ වැදගත් ගිණුම්කරණ අනුපාත කිහිපයක් පහත පරිදි වේ.

ගිණුම්කරණ අනුපාත	2014	2015
	(සියයට)	(සියයට)
දළ ලාභ අනුපාතය	2.63	(25.23)
ශුද්ධ ලාභ අනුපාතය	0.63	(22.37)
පිරිවැටුම මත පරිපාලන වියදම	5.24	8.64
පිරිවැටුම මත ශුද්ධ මූල්‍ය වියදම	0.81	1.96
ජංගම අනුපාතය	1.04	0.98
ක්ෂණික අනුපාතය	0.99	0.92

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ඉකුත් වසරට සාපේක්ෂව දළ ලාභ අනුපාතය සියයට 1059 කින් හා ශුද්ධ ලාභ අනුපාතය සියයට 3650 කින් පිරිහී තිබුණි.

(ii) ඉකුත් වසරට සාපේක්ෂව පිරිවැටුම මත පරිපාලන වියදම් සියයට 65 කින් හා ශුද්ධ මූල්‍ය වියදම සියයට 142 කින් වැඩි වී තිබුණි.

(iii) ඉකුත් වර්ෂයට සාපේක්ෂව ජංගම අනුපාතය 1.04 සිට 0.98 දක්වා ද ක්ෂණික අනුපාතය 0.99 සිට 0.92 දක්වා ද අඩු වී තිබුණි.

(iv) පසුගිය වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ සංස්ථාවේ මුළු විකුණුම් පිරිවැය ආදායමේ ප්‍රතිශතයක් ලෙස සැලකීමේ දී සියයට 97 සිට සියයට 125 දක්වා වැඩි වී තිබුණි.

(අ) සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක අතර මූල්‍ය ප්‍රතිඵල සැලකිමේදී 2011 වර්ෂයේ සිට සංස්ථාවේ බදු පසු ශුද්ධ ලාභය අඛණ්ඩව අඩු වී තිබූ අතර ඉකුත් වර්ෂය හා සැසඳීමේ දී සමාලෝචිත වර්ෂයේ දී එය සියයට 1.098 කින් අඩු වී තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දී මුළු පිරිවැටුම හා බදු පෙර ශුද්ධ ලාභය පිළිවෙලින් සියයට 57කින් හා සියයට 1.621කින් පිරිහී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ ආදායම රු.3,168,016,408 ක් වූ අතර ඉකුත් වර්ෂය සමග සැසඳීමේදී එය රු. 4,235,402,252 කින් හෙවත් සියයට 57 කින් පිරිහී තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී වැටුප්, වේතන දීමනා, කොන්ත්‍රාත් ශ්‍රමය හා ඊට සම්බන්ධ අනෙකුත් වියදම් ලෙස දරා තිබූ මුළු වියදම රු.1,753,310,158 ක් වූ අතර එය මුළු පිරිවැයෙන් සියයට 44 ක් විය.

(ඊ) ඉදිකිරීම් අංශයේ (Construction) ශ්‍රම පිරිවැය මුළු පිරිවැයේ ප්‍රතිශතයක් ලෙස සියයට 46 ක් ද, ඉදිකිරීම් උපාංග අංශයේ (Construction Component) සියයට 35 ක් ද, යාන්ත්‍රික හා විදුලි (M&E) අංශයේ සියයට 51 ක් ද, උපදේශන අංශයේ (Consultancy) සියයට 92 ක් ද, යන්ත්‍රෝපකරණ හා උපාංග (E &M) අංශයේ සියයට 57 ක් ද වී තිබුණි.

(උ) කොන්ත්‍රාත් වටිනාකම ඉක්මවා පිරිවැය දැරීම හේතුවෙන් 2015 වර්ෂයේ ව්‍යාපෘති 52 කින් ලැබූ සමුච්චිත අලාභය රු. 803,367,009 ක් බව නිරීක්ෂණය විය.

(ඌ) ඉදිකිරීම් අංශයට අයත් වැඩබිම් 06 ක 2013 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා අලාභ ලබා තිබූ අතර මෙම අලාභය 2015 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 61,745,058 ක් විය.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනතෙහි සඳහන් ප්‍රධාන අරමුණු එම පනතේ 3 (2) ඡේදය ප්‍රකාරව විෂය භාර අමාත්‍යවරයා විසින් 2008 මාර්තු 28 දිනැති අංක 1543 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මගින් පහත සඳහන් පරිදි සංශෝධනය කර තිබුණි.

(i) ස්වාධීනව හෝ දේශීය හෝ විදේශීය සමාගම් සමග සහසම්බන්ධව දේශීය හා විදේශීය ආයතනයන්ට අයත් සිවිල් ඉංජිනේරු හා අනෙකුත් ඉංජිනේරු ව්‍යාපෘති විමර්ශනය කිරීම, සැලැසුම් කිරීම, නිර්මාණය කිරීම සහ ඉදිකිරීම් කටයුතු ක්‍රියාත්මක කිරීම සහ එවැනි සමාගම් අත්පත් කර ගැනීම සහ කොටස් මිලදී ගැනීම.

(ii) ඉංජිනේරු ක්ෂේත්‍රයේ නියැලි දේශීය හෝ විදේශීය සමාගම් වෙත ස්වාධීනව හෝ කිසියම් දේශීය හෝ විදේශීය සමාගමක් සමග සහසම්බන්ධ වී උපදේශන සේවා සැපයීම හා ව්‍යාපෘති කළමනාකරණ සේවා සැපයීමත් එවැනි සමාගම් අත්පත් කර ගැනීම හා කොටස් මිලදී ගැනීම.

(iii) ස්වාධීන ආයතනයක් ලෙස හෝ දේශීය හෝ විදේශීය ආයතනයක් සමග සහ සම්බන්ධව දේපළ සංවර්ධන කටයුතු සිදු කිරීම හෝ එවැනි සමාගම් අත්පත් කර ගැනීම සහ එවැනි සමාගම් වල කොටස් මිලදී ගැනීම.

(iv) දේශීය හෝ විදේශීය වශයෙන් පෙර සූදානම් කළ කොන්ක්‍රීට්, සවි ගැන් වූ කොන්ක්‍රීට් සහ පූර්ව ප්‍රත්‍යබල කොන්ක්‍රීට් නිෂ්පාදනය කිරීම සහ අලෙවි කිරීම.

(v) ඉංජිනේරු ව්‍යාපෘති හෝ ව්‍යාපාරයන් පවත්වාගෙන යාම සඳහා ගොඩනැගිලි ද්‍රව්‍ය, යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ නිෂ්පාදනය කිරීම, අලෙවි කිරීම, ආනයනය කිරීම සහ අපනයනය කිරීම.

(vi) ඉහත සඳහන් (i), (ii), (iii), (iv) හා (v) ඡේදයන්හි සඳහන් අරමුණු උදෙසා අවශ්‍ය ඉංජිනේරු සහ වෙනත් ශිල්පීය කාර්ය මණ්ඩලය පුහුණු කිරීම.

(vii) ඉහත සඳහන් (i), (ii), (iii) හා (iv) ඡේදයන්හි සඳහන් අරමුණු උදෙසා යොදා ගන්නා ගොඩනැගිලි ද්‍රව්‍ය, ඉදිකිරීම් සහ ශිල්පයන් පිළිබඳ පර්යේෂණ කටයුතු ක්‍රියාවේ යෙදවීම.

ඉහත අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉදිකිරීම් අංශය

(i) රත්මලාන ඇලුමිනියම් කර්මාන්ත ශාලාව (වැඩබිම් අංක 6001)

ඉදිකිරීම් අංශයට අයත් උක්ත ඇලුමිනියම් කර්මාන්ත ශාලාවේ ආදායම 2014 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ සියයට 62 කින් අඩුවී තිබූ අතර පසුගිය වර්ෂයේ රු.මිලියන 1.79 ක් වූ මෙහෙයුම් අලාභය රු.මිලියන 4.18 ක අලාභයක් දක්වා සියයට 133 කින් පිරිහී තිබුණි. පසුගිය වර්ෂයට සාපේක්ෂව උපකොන්ත්‍රාත් ශ්‍රම වියදම අසාමාන්‍ය ලෙස වැඩිවීම මෙම තත්ත්වය කෙරෙහි සෘජුව බලපා තිබුණි.

(ii) මාලිගාවත්ත යන්ත්‍ර කුලියට දීමේ වැඩබිම (වැඩබිම් අංක 828)

මාලිගාවත්ත යන්ත්‍ර කුලියට දීමේ වැඩබිමෙහි පෙර වර්ෂයට සාපේක්ෂව ආදායම සියයට 84 කින් පිරිහී තිබූ අතර පසුගිය වර්ෂයේ රු.මිලියන 0.22 ක් වූ මෙහෙයුම් අලාභය සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 4.95 ක් දක්වා පිරිහී තිබුණි.

(ආ) ඉදිකිරීම් උපාංග අංශය

(i) පෙරසවි වැඩබිම - රත්මලාන (වැඩබිම් අංක 343)

මෙම වැඩබිමෙහි පසුගිය වර්ෂයේ රු.මිලියන 3.51 ක් වූ මෙහෙයුම් ලාභය සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 33.67 ක මෙහෙයුම් අලාභයක් බවට පත්වී තිබුණි. පෙර වර්ෂයට සාපේක්ෂව ආදායම සියයට 49 කින් පිරිහීමත්, විකුණුම් පිරිවැය නොවන වියදම් සියයට 12 කින් වැඩිවීමත් මෙම තත්ත්වයට බලපා ඇති බව නිරීක්ෂණය විය.

(ii) දංකොටුව ගඩොල් හා ටයිල් නිෂ්පාදන අංශය (වැඩබිම් අංක 1099)

පසුගිය වර්ෂ 18 අතරින් වර්ෂ 17 ක්ම අලාභ ලබා ඇති මෙම වැඩබිමේ පසුගිය වර්ෂයේදී රු.මිලියන 4.3 ක් වූ මෙහෙයුම් අලාභය සමාලෝචිත වර්ෂයේදී සියයට 92 කින් පිරිහී රු.මිලියන 8.25 ක අලාභයක් බවට පත්වී තිබුණි. තවද, සමාලෝචිත වර්ෂයේ ආදායම පසුගිය වර්ෂයට සාපේක්ෂව සියයට 38 කින් පිරිහී තිබුණද, විකුණුම් පිරිවැය නොවන අනෙකුත් වියදම් සියයට 68 කින් වැඩි වී තිබුණි.

(iii) පෙරසවි වැඩබිම - පැලියගොඩ (වැඩබිම් අංක 1168)

සී සිටි ව්‍යාපෘතිය ඉදිකිරීමේදී බිම සකස් කිරීම නිසි කළමනාකරණයකින් සිදු නොකිරීම නිසා මෙම වැඩබිමෙහි තිබූ රු.12,397,200 ක් වටිනා පෙරසවි නිෂ්පාදන විනාශ වී ඇති බවත් ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 12.4 ක අලාභයක් ලබා තිබූ බවත් අනාවරණය විය.

(iv) පෙරසවි වැඩබිම - වැලිකන්ද (වැඩබිම් අංක 1738)

පසුගිය වර්ෂයේ රු.මිලියනයක මෙහෙයුම් ලාභයක් ලබා තිබූ මෙම වැඩබිමෙන් සමාලෝචිත වර්ෂයේ රු.මිලියන 1.37 ක අලාභයක් ලැබී තිබුණි. විකුණුම් පිරිවැය හා අනෙකුත් වියදම් වැඩිවීම මෙම තත්ත්වයට බලපා ඇති බව අනාවරණය විය.

(v) කොන්ක්‍රීට් සිල්පර වැඩබිම (වැඩබිම් අංක 1510)

පසුගිය වර්ෂයේ රු.මිලියන 43.27 ක මෙහෙයුම් ලාභයක් ලබා තිබූ මෙම වැඩබිමේ සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ලාභය රු.මිලියන 25.42 දක්වා පිරිහී තිබුණි. වැඩබිමේ ආදායම සියයට 22 කින් අඩුවීම මෙම තත්ත්වයට සෘජුව බලපා තිබුණි.

(ඇ) යාන්ත්‍රික හා විදුලි අංශය

(i) පැලියගොඩ මෙහෙයුම් වැඩබිම (වැඩබිම් අංක 102)

උක්ත වැඩබිමෙහි 2013 වර්ෂයේ මෙහෙයුම් අලාභය රු.මිලියන 1.65 ක් ද 2014 වර්ෂයේදී එය රු.මිලියන 3.86 ක් ද, සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 23.5 ක් ද වශයෙන් එය දිගින් දිගටම පිරිහී තිබුණ බව නිරීක්ෂණය විය. විකුණුම් ආදායම අඛණ්ඩව සිදුයෙන් අඩුවීම මෙම තත්ත්වය කෙරෙහි සෘජුව බලපා තිබුණි.

(ii) පැලියගොඩ මෙහෙයුම් වැඩබිම (වැඩබිම් අංක 104)

2013 වර්ෂයේ රු.මිලියන 7.43 ක මෙහෙයුම් ලාභයක් ලැබූ මෙම වැඩබිම 2014 වර්ෂයේදී රු.මිලියන 1.33 ක අලාභයක් ද සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 35.14 ක අලාභයක් දක්වා ද පිරිහී තිබුණි. විකුණුම් ආදායම සිදු ලෙස අඩුවීමත්, විකුණුම් පිරිවැය ඉහළ යාමත් මෙම තත්ත්වය කෙරෙහි බලපා තිබුණි.

(iii) මානලේ ඩොලමයිට් වැඩබිම (වැඩබිම් අංක 1100)

ඉහත වැඩබිමෙහි මෙහෙයුම් කටයුතු පිළිබඳ සමාලෝචනයේදී පසුගිය වර්ෂ 17 අතුරින් 2006 වර්ෂය හැරුණු විට අනෙක් සියලුම වර්ෂයන්හි අලාභ සහිතව පවත්වා ගෙන ගොස් තිබුණි. 2014 වර්ෂයේදී රු.මිලියන 4.29 ක් වූ මෙහෙයුම් අලාභය සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 10.23 ක අලාභයක් දක්වා සියයට 139 කින් පිරිහී තිබූ අතර විකුණුම් ආදායම සිදු ලෙස අඩු වීම මෙම තත්ත්වයට සෘජුව බලපා තිබුණි.

(iv) රත්මලාන වැඩපල (වැඩබිම් අංක 888)

මෙම වැඩපල සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 23.95 ක මෙහෙයුම් අලාභයක් ලබා තිබූ අතර පසුගිය වර්ෂයේ රු.මිලියන 30.82 ක් වූ ආදායම රු.මිලියන 5.75 දක්වා අඩුවීමත්, විකුණුම් පිරිවැය හා අනෙකුත් වියදම් වැඩිවීමත් මෙම තත්ත්වය කෙරෙහි බලපා තිබුණි.

(ඇ) විශේෂ මෙහෙයුම් අංශය

ගලපාත ඇස්පෝල්ට් වැඩබිම (වැඩබිම් අංක 1843)

මෙම වැඩබිමේ 2013 අගෝස්තු 01 දින නිෂ්පාදනය ආරම්භ කර, 2015 දෙසැම්බර් 31 දිනෙන් පසුව නිෂ්පාදන කටයුතු නවතා තිබූ අතර නිෂ්පාදන කටයුතු වැඩ කරන දින 64 කට පමණක් සීමා වී තිබුණි. නිෂ්පාදන කටයුතු නවතා තිබුණ ද වැඩබිමට අනුයුක්ත කර තිබූ සේවකයින් තවදුරටත් එම වැඩබිමෙහි රඳවාගෙන වැටුප් ගෙවීම හේතුවෙන් පසුගිය වර්ෂයේ රු.මිලියන 3.7 ක් වූ අලාභය සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 15.53 ක අලාභයක් දක්වා වැඩි වී තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට රු.මිලියන 24.03 ක සමුච්චිත අලාභයක් ලබා තිබුණි.

(ඉ) යන්ත්‍රෝපකරණ අංශය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) යන්ත්‍රෝපකරණ අංශයේ කොලොන්නාව ප්‍රධාන ගබඩාව ඇතුළුව ප්‍රාදේශීය කාර්යාල හා වැඩබිම් 23 කින් කිසිදු වැඩබිමක් සමාලෝචිත වර්ෂයේදී ලාභ ලබා නොතිබූ අතර වර්ෂය අවසානයට ලබා තිබූ සමුච්චිත අලාභය රු.මිලියන 177.73 ක් වී තිබුණි.

(ii) වවුනියාව, කුරුණෑගල, කුලියාපිටිය, ආනමඩුව යන ප්‍රාදේශීය කාර්යාල පසුගිය වර්ෂයේ ලබා තිබූ රු.මිලියන 14.04 ක සමුච්චිත ලාභය සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 23.88 ක අලාභයක් දක්වා අඩු වී තිබුණි.

(iii) කොලොන්නාව ප්‍රධාන ගබඩාව, හොරණ, කුණ්ඩසාලේ, අම්පාර, කල්මුණේ, තමන්කඩුව යන ප්‍රාදේශීය කාර්යාල හා කැගල්ල ඩිපෝව යන වැඩබිම් පසුගිය වර්ෂයේ මෙන්ම සමාලෝචිත වර්ෂයේදී කිසිදු ආදායමක් උපයා නොතිබූ අතර, වැටුප්, වේතන, විදුලිය, දුරකථන, ඉන්ධන හා අනෙකුත් වියදම් වශයෙන් රු.මිලියන 26.84 ක වියදමක් සමාලෝචිත වර්ෂය තුළ දරා තිබුණි.

(iv) ඉදිකිරීම්, යාන්ත්‍රික හා විදුලි සහ යන්ත්‍රෝපකරණ (M&E) අංශවලට අයත් වැඩබිම් 03 ක් සඳහා රු.1,065,550 ක පිරිවැයක් දරා ඇතත් 2014 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කිසිදු ප්‍රගතියක් පෙන්නුම් කර නොතිබුණි.

4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

කාල පරිච්ඡේදය අවසානයේදී සංස්ථාව සඳහා බැංකු අයිරා සීමාව රු. මිලියන 353.7 ක් වුවද සමාලෝචිත වර්ෂය අවසානයට එම අයිරා සීමාව ඉක්මවා රු. මිලියන 78 ක අයිරා ලබාගෙන තිබුණි.

4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවේ එකතු කළ අගය මත බදු ලියාපදිංචිය අක්‍රිය කරන ලද සැපයුම්කරුවන් 09 දෙනෙකු වෙත එකතු කළ අගය මත බදු ලෙස 2014 හා 2015 වර්ෂයන්හිදී පිළිවෙලින් රු.608,474 ක් හා රු.182,950 ක් ගෙවා තිබුණි.

(ආ) 2002 අංක 14 දරන දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ එකතු කළ අගය මත බදු පනතේ 1 වන උපලේඛනයේ II කොටසේ (a) (VI) හා (XVIII) අනුව සීසල් සහ ගල්කිල බද්දෙන් නිදහස් කර තිබුණද සැපයුම්කරුවන්ගේ ඉන්වොයිස් සඳහා එකතුකළ අගය මත බදු ලෙස රු.4,752,280 ක් ගෙවා තිබුණි.

4.4 ආර්ථික නොවූ ගනුදෙනු

(අ) ඇල්පිටිය ඇස්පෝල්ට් නිෂ්පාදන වැඩබිම ස්ථාපිත කිරීම සඳහා කල්බදු පදනම මත ඉඩමක් ලබා ගැනීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ව්‍යාපෘතිය ආරම්භ කිරීමට ශක්‍යතා අධ්‍යයනයක් කිරීමකින් තොරව හා මධ්‍යම පරිසර අධිකාරියෙන් අවසර ලබානොගෙන අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 780/53 මගින් මාසිකව රු.50,000 ක් බැගින් වසර 05 ක කාලපරිච්ඡේදයක් සඳහා 2012 සැප්තැම්බර් 07

දින රු.3,000,000 ක බදු මුදල් එකවර ගෙවා නිබුණි. එහෙත් මෙම ව්‍යාපෘතිය ආරම්භක අවස්ථාවේදීම නවතා දමා නිබුණි.

(ii) ඉඩම් අයිතිකරු විසින් ඉඩමේ කළුගල් වැඩපලක් පවත්වාගෙන යාම සඳහා 2012 පෙබරවාරි සිට වසරක කාලයක් සඳහා ලිඛිත අවසරයක් ලබාගෙන නිබුණි. 2012 වර්ෂයේදී CATIC (Chin National Aero Technology Import & Export Corporation) ආයතනය මගින් මෙම භූමිය ඇස්පෝල්ට් නිෂ්පාදනයට සුදුසු නොවන බව දන්වා නිබුණ ද ව්‍යාපෘතිය ආරම්භ කිරීමට අදාළ අනෙකුත් වියදම් ලෙස රු.1,515,524 ක් දරා නිබුණි.

(ආ) **ගලපාන ඇස්පෝල්ට් හා ක්‍රෂර් යන්ත්‍ර වැඩබිම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) අමුද්‍රව්‍ය සැපයීම සඳහා සමාලෝචිත වර්ෂයේ දී සැපයුම්කරුවන් වෙත අත්තිකාරම් ලබා දී නිබූ අතර එකතුව රු.29,642,269 ක් සඳහා අමුද්‍රව්‍ය සපයා නොනිබුණි.

(ii) මෙම ව්‍යාපෘතිය සඳහා 2016 දෙසැම්බර් 25 දක්වා වසර 02 ක් සඳහා රු.1,800,000 ක කුලී මුදලක් ගෙවා නිබුණද, දින 03 ක් පමණක් නිෂ්පාදන කටයුතු සිදුකර ඇස්පෝල්ට් ටොන් 279.36 ක් පමණක් නිෂ්පාදනය කර නිබුණි. සමාලෝචිත වර්ෂයේ මෙහි සමුච්චිත අලාභය රු.25,580,485 ක් වී නිබුණි.

4.5 **හඳුනාගන්නා ලද පාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළදී විශ්‍රාමික පාරිතෝෂික දීමනා නියමිත දිනට නොගෙවීම හේතුවෙන් සේවකයින් තිදෙනෙකුට රු.255,567 ක අධිභාරයක් සංස්ථාව විසින් ගෙවා නිබුණි.

(ආ) රත්නපුර දිස්ත්‍රික්කයේ මාර්ග ඉදිකිරීම් සඳහා 2011 වර්ෂයේ දී කොන්ත්‍රාත් 52 ක් ලබාදී තිබූ අතර කොන්ත්‍රාත් 26 ක් සඳහා කොන්ත්‍රාත් වටිනාකම් ඉක්මවා රු. 53,198,183 ක මුදලක් කොන්ත්‍රාත්කරුවන්ට ගෙවා තිබුණි. මෙම ව්‍යාපෘති තුළින් ව්‍යාපෘති 5ක් ආරම්භක අවස්ථාවේදීම නවතා දමා තිබූ අතර ඒ සඳහා ගෙවා තිබූ රු.36,385,693 ක සවලිකරණ අත්තිකාරම් (Mobilization Advance) අය කරගැනීමට ද කටයුතු කර නොතිබුණි.

4.6 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදුන් සංස්ථාවේ සම්පත්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9. ඡේදයට පටහැනිව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව සංස්ථාවේ සේවකයන් 29 දෙනෙකු රේඛීය අමාත්‍යාංශයට මුදා හැර තිබූ අතර එම සේවකයන්ගේ වැටුප් ලෙස 2011 වර්ෂයේ සිට 2015 වර්ෂය අවසානය දක්වා රු. 31,638,155 ක්ද, 2016 ජනවාරි සිට මැයි මාසය දක්වා රු.4,804,200 ක් ද වශයෙන් එකතුව රු.36,442,355 ක් සංස්ථාව විසින් ගෙවා තිබුණි.

(ආ) අනියම් සේවකයින් දෙදෙනෙකු අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව රේඛීය අමාත්‍යාංශයට මුදා හැර තිබූ අතර 2016 ජනවාරි 01 සිට 2016 ඔක්තෝම්බර් 31 දක්වා රු.698,580 ක වැටුප් ගෙවා තිබූ බව නිරීක්ෂණය විය.

(ඇ) දෛනික වැටුප් මත බඳවාගත් අනියම් හා නුපුහුණු සේවකයන් 05 දෙනෙකු අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව රේඛීය අමාත්‍යාංශයට මුදා හැර තිබූ අතර එම සේවකයන්ට ගෙවිය යුතු වැටුප් ගණනය කිරීමෙන් තොරව, 2016 ජනවාරි 01 සිට 2016 ජූනි 30 දක්වා වැටුප් අත්තිකාරම් ලෙස රු.500,000 ක් ගෙවා තිබුණි.

4.7 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) **නිවාස ඉදිකිරීම් ව්‍යාපෘති පරීක්ෂාව - කාලිංග මාවත**

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයාගේ අංක 12/1165/503/083 දරන ලිපිය පරිදි නිවාස ඒකක 816 ක් ඉදිකිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය විසින් මෙම කොන්ත්‍රාත්තුව සංස්ථාවට ප්‍රදානය කර තිබූ නමුත් පසුව නිවාස ඒකක 648 ක් පමණක් ඉදිකිරීමට දෙපාර්ශවය එකඟ වී තිබුණි. මෙම ව්‍යාපෘතිය අදියර 02 කින් ක්‍රියාත්මක කිරීමට සහ පළමු අදියර 2015 දෙසැම්බර් 19 වන දින අවසන් කිරීමට අපේක්ෂා කළද, 2015 ජුනි 04 දිනෙන් පසු වැඩ නවතා දමා තිබුණි.

(ආ) අදියර 02 යටතේ වූ ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු 2014 අප්‍රේල් 21 දින ආරම්භ කර තිබූ අතර එය 2016 ඔක්තෝබර් 21 දින අවසන් කිරීමට අපේක්ෂා කළ ද 2015 දෙසැම්බර් 31 දින වන විට ව්‍යාපෘතියේ වැඩ නවතා දමා තිබුණි.

(ඇ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4 (1) වගන්තියට පටහැනිව උප කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 20 ඉක්මවා රු.4,803,492 ක සවලීකරණ අත්තිකාරම් ලබා දී තිබුණු බව නිරීක්ෂණය විය.

(ඈ) කොන්ත්‍රාත් වටිනාකම රු. මිලියන 83.5 ක් වන උප කොන්ත්‍රාත් දෙකක කොන්ත්‍රාත් කාලය 2015 මාර්තු 19 වන දිනෙන් අවසන් වී තිබුණද එහි භෞතික ප්‍රගතිය පහළ මට්ටමක පැවතුණි. මෙම කොන්ත්‍රාත්කරුවන් වෙත ලබා දී තිබූ සවලීකරණ අත්තිකාරම් වටිනාකම රු. මිලියන 3.9 ක් අයකරගෙන නොතිබූ අතර කොන්ත්‍රාත්කරුවන් විසින් ඉදිරිපත් කර තිබූ රු. මිලියන 4.2 ක් වූ අත්තිකාරම් බැඳුම්කරයන්හි වලංගු කාලය ඉකුත් වී තිබුණ ද එය දිර්ඝ කර ගැනීමටද කටයුතු කර නොතිබුණි.

(ඉ) සංස්ථාවේ අයහපත් මූල්‍ය පාලනය හා උප කොන්ත්‍රාත්කරුවන්ට නියමිත පරිදි ගෙවීම් නොකිරීම හේතුවෙන් ඉදිකිරීම් භෞතික ප්‍රගතිය ඉතා පහළ මට්ටමක පැවති, කොන්ත්‍රාත්

වටිනාකම රු.1,704,907,440 ක් වූ කාලිංග මාවතේ ඉදිකරමින් තිබූ නිවාස ව්‍යාපෘති දෙක නාගරික සංවර්ධන අධිකාරිය විසින් නැවත පවරා ගැනීමට කටයුතු කර තිබුණි.

(ඊ) 2010 වර්ෂයේ දී සේවාදායකයන්ගෙන් එකතුව රු.27,596,156 ක් වූ සවලීකරණ අත්තිකාරම් ලබාගෙන තිබූ අතර, මේ දක්වා ඒ සඳහා කිසිදු සේවාවක් ඉටුකර නොතිබූ අවස්ථා නිරීක්ෂණය විය.

4.8 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාවේ අනුමත කාර්ය මණ්ඩලය හා සැසඳීමේදී ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරු 21 කට අදාළව නිලධාරීන් 65 ක් හා තෘතීය කළමනාකරණ මට්ටමේ තනතුරු 39 කට අදාළව නිලධාරීන් 139 ක් ද ඇතුළුව සමස්ත කාර්ය මණ්ඩලයේ අනුමත තනතුරු 101 කට අදාළව සේවකයින් 559 ක් 2015 දෙසැම්බර් 31 දිනට පුරප්පාඩුව පැවතුණි.

(ආ) ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ බොහොමයක් තනතුරු සඳහා ස්ථිර පදනම් මත බඳවා ගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය 2009 හා 2011 වර්ෂවලදී සංස්ථාවට ලැබී තිබුණද, ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරු 6 ක් සඳහා නිලධාරීන් 6 දෙනෙකු ඉහළ වැටුප් තලයන් යටතේ කොන්ත්‍රාත් පදනම් මත බඳවා ගෙන තිබුණි.

(ඇ) ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයේ 1.2 වගන්තිය අනුව පත්කිරීමක් කළ හැක්කේ අනුමත සේවක සංඛ්‍යාවේ තනතුරකට පමණි. එහෙත් අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා තනතුරු 41 ක් සඳහා අතිරික්ත සේවකයන් 451 දෙනෙකු 2015 දෙසැම්බර් 31 දිනට බඳවා ගෙන තිබුණි.

(ඈ) 2006 අගෝස්තු 01 දිනැති අංක 28 (ii) දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය සහ 2009 නොවැම්බර් 25 දිනැති අංක ඕඑම්එස්/ඊ3/43/4/265/1 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපි අනුව, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව නව තනතුරු ඇතිකිරීම හෝ පුරප්පාඩු පිරවීම

සිදු නොකළ යුතු බව දන්වා තිබුණි. එහෙත් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය නොමැති ඉහත සඳහන් අතිරික්ත සේවකයන් 451 දෙනා අතුරින් අනුමත නොවන තනතුරු 13 ක් සඳහා සේවකයන් 16 දෙනෙකු බඳවා ගෙන තිබුණි. ඉන් තනතුරු 7 ක් සඳහා බඳවා ගත් සේවකයන්ගේ පත්වීම් ස්ථිර කර තිබීම විගණනයේදී ප්‍රශ්නකාරී විය.

(ඉ) 2015 දෙසැම්බර් 31 දිනට නුපුහුණු සේවකයන් 99 ක් අතිරික්තව සිටියදී 2016 ජනවාරි 01 සිට 2016 ඔක්තෝම්බර් 31 දක්වා කාලය තුළ අනියම් හා නුපුහුණු සේවකයන් 300 දෙනෙකු අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව දෛනික වැටුප් පදනම මත බඳවා ගෙන රු.74.107.520 ක් වැටුප් ලෙස ගෙවා තිබූ බව නිරීක්ෂණය විය.

(ඊ) අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව අසාධාරණයට ලක්වූ සේවකයන්ට සහන සැලසීම් සඳහා සභාපති විසින් කමිටුවක් පත් කර තිබූ අතර එහි සාමාජිකයන් තිදෙනාගෙන් දෙදෙනෙකුම සංස්ථාවේ සේවයේ නියුතු නිලධාරීන් (නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී මානව සම්පත් හා පාලන සහ නීති නිලධාරී) වූ හෙයින් ඉදිරිපත් කරන ලද නිර්දේශයන්ගේ ස්වාධීනත්වය හා අපක්ෂපාතීත්වය පිළිබඳව විගණනයට සෑහීමකට පත් විය නොහැකි විය.

තවද එම කමිටුව විසින් ආයතන සංග්‍රහයේ විධිවිධානවලට අනුකූල නොවන පරිදි කරන ලද නිර්දේශයන් පහත දැක්වේ.

(i) ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයේ 1.10 වගන්තිය ප්‍රකාරව පත්වීම් බලධරයෙකු විසින් මොනයම් හේතුවක් නිසා හෝ ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය රහිතව පත්වීමක් පෙර දානම් නොකළ යුතු වුවද, ඊට පටහැනිව කළමනාකාර සහකාර, පරිපාලන නිලධාරී හා ගණකාධිකාරී යන තනතුරු සඳහා පත්කළ නිලධාරීන් තිදෙනෙකු වෙනුවෙන් පිළිවෙලින් වර්ෂ 07, වර්ෂ 06 සහ වර්ෂ 2 මාස 06 කින් පෙරදානම් කර පත්වීම් ලබාදී තිබුණි.

තවද, මෙම නිලධාරීන් සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව පෙර දානම් කළ දින සිට බලපැවැත්වෙන පරිදි නව තනතුරුවලට අදාළව හිඟ වැටුප්

හා සේවය අත්හිටවා ඇති වර්ෂයකට අධික කාලයක් සඳහා වැටුප් වශයෙන් රු.948,175 ක් ගෙවා තිබුණි.

(ii) තවද, ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයේ 1.11 හා 1.11.1 ඡේද ප්‍රකාරව පත්වීමක් පෙර දානම් කිරීමක් හේතුවෙන් එම තනතුරට හෝ ශ්‍රේණියට ඔහුට පෙර පත් කළ නිලධාරියකුට වැඩි ජ්‍යෙෂ්ඨත්වයක් හිමි වන්නේ නම් පෙරදානම් කිරීමක් නොකළ යුතු බව සඳහන් වුවද, පරිපාලන නිලධාරී පත්වීම පෙරදානම් කිරීම හේතුවෙන් උක්ත වගන්තිවල විධි විධිවිධානයන්ට පටහැනිව සංස්ථාව ක්‍රියා කර ඇති බව නිරීක්ෂණය විය. ඒ අනුව ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයේ 1.10, 1.10.2, 1.11, 1.11.1 ඡේදයන් කෙරෙහි අවධානය යොමු නොකර එම ඡේදයන්හි සඳහන් විධිවිධානයන් උල්ලංඝනය වන පරිදි විමර්ශන කමිටුව විසින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිර්දේශයන් ඉදිරිපත්කර ඇති බව ඉහත නිරීක්ෂණ අනුව අනාවරණය විය.

(උ) සංස්ථාවේ වැඩබැලීම් පත්වීම් සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව තුළ ඉහළ හා මධ්‍යම කළමනාකරණ මට්ටමට අයත් තනතුරු සඳහා නිලධාරීන් බඳවාගැනීමට කටයුතු කිරීමකින් තොරව නිලධාරීන් 12 දෙනෙකු 2015 වර්ෂය තුළ වැඩබලන තනතුරුවලට පත්කර තිබුණි.

(ii) ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයේ 13.3 ඡේදය ප්‍රකාරව වැඩබලන තනතුරු සඳහා නිත්‍ය පත්වීම් නොපමාව ලබාදීම ආයතනයේ වගකීම වන අතර උක්ත නිලධාරීන් අතුරින් බොහොමයක් වර්ෂ 01 සිට වර්ෂ 11 දක්වා වූ කාල පරාසයන් තුළ වැඩබලන තනතුරුවල රාජකාරී ඉටුකරන බවත්, එම තනතුරු සඳහා නිත්‍ය පත්වීම් ලබාදීමට විගණිත දිනය වූ 2016 අගෝස්තු මස 12 දින වන විටත් සංස්ථාව අපොහොසත්ව තිබුණි.

(iii) සංස්ථාවේ ජ්‍යෙෂ්ඨ ඉංජිනේරුවරයෙකු ලෙස නිත්‍ය තනතුරක් දරන නිලධාරියෙකු ඉදිකිරීම් උපාංග අංශයේ වැඩබලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී සහ වැඩබලන කළමනාකාර යනාදී වශයෙන් තනතුරු තුනක රාජකාරී කිරීම

සඳහා යෙදවීමෙන් එම නිලධාරියා සතුව පවතින වැඩ කිරීමේ ධාරිතාවය පිළිබඳව සංස්ථාවේ කළමනාකාරීත්වය අවධානය යොමු කොට නොතිබුණි.

(iv) ආයතන සංග්‍රහයේ VII වැනි පරිච්ඡේදයේ 12.2.6 ඡේදය ප්‍රකාරව වැඩබැලීමේ වැටුප් ගෙවීම සඳහා අදාළ අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබා ගත යුතු වුවත්, සංස්ථාවේ වැඩබැලීමේ වැටුප් ගෙවීම සඳහා එවැනි අනුමැතියක් ලබා ගෙන නොතිබුණි.

5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී /12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1. ඡේදය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත කෙටුම්පත් වාර්තාව හා වාර්ෂික මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවද, සමාලෝචිත වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම දින 436 ක කාල ප්‍රමාදයකින් පසුව 2017 මැයි 16 දින ඉදිරිපත් කර තිබුණි.

5.2 සංයුක්ත සැලැස්ම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී /12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය අනුව 2012 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය වෙනුවෙන් සංයුක්ත සැලැස්මක් පිළියෙල කර තිබුණද එය සමාලෝචිත වර්ෂයට අදාළව යාවත්කාලීන කර නොතිබුණි.

5.3 ක්‍රියාකාරී සැලැස්ම

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

5.4 අයවැය ලේඛනමය පාලනය

අයවැයගත සහ තථ්‍ය ආදායම් හා වියදම් අතර සියයට 46 සිට සියයට 70 දක්වා සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කර ගෙන නොතිබුණි.

5.5 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 වගන්තිය ප්‍රකාරව සංස්ථාව විසින් 2014 වර්ෂයට අදාළ වාර්ෂික වාර්තාව 2017 ජුනි 30 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගතකර නොතිබුණි.

5.6 නොවිසඳී ඇති විගණන ඡේද

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාවට අයත් පැලියගොඩ පිහිටි ඉඩමෙන් අක්කර 2.5 ක වපසරියකින් යුතු භූමි ප්‍රමාණයක ඉදිකිරීම් අභ්‍යාස සහ සංවර්ධන ආයතනය විසින් රු. මිලියන 36 වැයකර තාක්ෂණික සේවා උද්‍යානයක් හා අඩු වියදම් නිවාස ඒකක කිහිපයක් ඉදිකොට තිබුණි. මෙහි ඉදිකිරීම් කටයුතු සංස්ථාව විසින් සිදුකර ඇති අතර ඒ වෙනුවෙන් සංස්ථාවට රු. මිලියන 2.2 ක් ලැබිය යුතුව තිබුණි. එනමුත් වැඩබිමෙහි ආරක්ෂක සේවාව වෙනුවෙන් 2014 වර්ෂයේ සිට 2015 දක්වා රු. මිලියන 1.2 ක මුදලක් වැයකර තිබුණද එය ඵලදායී කටයුත්තකට භාවිතා කර නොතිබුණි.

(ආ) පැලියගොඩ-සී සිටි ව්‍යාපෘතිය 2013 ජූලි 06 දින ආරම්භකර 2014 ජනවාරි 31 දින අවසන් කිරීමට අපේක්ෂා කළද, 2015 සැප්තැම්බර් 03 දින වන විටත් ව්‍යාපෘති කටයුතු අවසන් නොකොට නවතා දමා තිබුණි. 2014 දෙසැම්බර් 31 දිනට සංස්ථාව විසින් වැයකළ මුදල රු. මිලියන 463ක් වූ අතර ප්‍රමාණ පත්‍රයේ සඳහන් වැඩ විෂයන් 18 කින් වැඩ විෂයන් 12 කට අදාළ ඉදිකිරීම් කාර්යයන්හි කිසිදු ප්‍රගතියක් දක්නට නොලැබුණි.

6. පද්ධති හා පාලනයන්


විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර සංස්ථාවේ සභාපතිගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

පද්ධති හා පාලන ක්ෂේත්‍ර		නිරීක්ෂණ
(අ) ගිණුම්කරණය	(i)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අනුගමනය නොකිරීම.
	(ii)	ගෙවිය යුතු බදු හා ඒ සඳහා අධිභාර ගිණුම්ගත කර නොනිබීම.
	(iii)	පාලන ගිණුම් සසඳා නොතිබීම.
	(iv)	නියමිත දිනයන්ට මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් නොකිරීම.
(ආ) මූල්‍ය පාලනය	(i)	ඇණවුම් සමග චෙක්පත් මගින් අත්තිකාරම් ලබාදීම.
	(ii)	දීර්ඝ කාලයක සිට පැවත එන ණයගැතියන්ගෙන් මුදල් අයනොවී පැවතීම, හා ණයගැති පාලනය දුර්වල නත්වයක පැවතීම.
	(iii)	අදාළ සේවා දායකයන් සඳහා ඉන්ධන ඉදිරිපත් කිරීම පිළිබඳ සැලකිය යුතු ප්‍රමාදයන් පැවතීම.

	(iv)	ගැනුම් අත්තිකාරම් නිරවුල් නොකර දීර්ඝ කාලයක සිට පැවතීම.
	(v)	දිගුකාලීන ඉදිකිරීම් රඳවා ගැනීම් මුදල් නිරවුල් නොකිරීම.
(ඇ) වෙළඳ හා වෙනත් ගෙවිය යුතු මුදල්	(i)	වැඩ පූර්ව අත්තිකාරම් නිරවුල් නොකර දීර්ඝ කාලීනනව පැවතීම.
	(ii)	බදු නියමිත දිනට නොගෙවීම නිසා අධිභාර ගෙවීමට සිදුවීම.
(ඈ) කාර්ය මණ්ඩල කළමනාකරණය	(i)	මානව සම්පත් වෙනත් ආයතනවලට මුදා හැරීම.
	(ii)	අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා සේවකයන් බඳවා ගැනීම.
	(iii)	කොන්ත්‍රාත් පදනම මත ජ්‍යෙෂ්ඨ කළමනාකරණය සඳහා නිලධාරීන් බඳවා ගැනීම.
(ඉ) වත්කම් කළමනාකරණය	(i)	නිෂ්ක්‍රිය වත්කම් විකිමත් පරිදි උපයෝජනය කිරීමට කටයුතු නොකිරීම.
	(ii)	ඉඩම් අයිතිය පවරා නොගැනීම.
(ඊ) නොග පාලනය		සියලුම වැඩබිම්වල වාර්ෂික සමීක්ෂණ සිදුකර නොතිබීම.

එච්.එම්.ගාමිණී විජේසිංහ
විගණකාධිපති

ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව



2015 දෙසැම්බර් මස 31 වන දිනයෙන්

අවසන් වර්ෂය සඳහා

මූල්‍ය ප්‍රකාශ

ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව
2015 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා
සර්වව්‍යාපී ආදායම් ප්‍රකාශය

	සටහන	2015 (රු.)	2014 (රු.)
ආදායම	4	**3,168,016,408**	7,403,418,660
විකුණුම් පිරිවැය		**(3,967,410,436)**	(7,208,072,307)
දළ ලාභය		**(799,394,028)**	195,346,353
වෙනත් ආදායම්	5	**426,437,075**	299,423,834
පරිපාලන වියදම්		**(273,654,573)**	(388,165,985)
ශුද්ධ මූල්‍ය ආදායම් / (වියදම්)	6	**(62,224,359)**	(59,998,458)
බදු පූර්ව ලාභය	7	**(708,835,885)**	46,605,744
ආදායම් බදු වියදම්	8	**(35,745,892)**	27,929,244
කාල පරිච්ඡේදයට අදාළ ලාභය		**(744,581,777)**	74,534,988
වෙනත් සර්වව්‍යාපී ආදායම්			
නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් මත වූ ආයුගනක ඉපයීම්/පාඩු		**(8,141,820)**	-
අලෙවිය සඳහා වූ මූල්‍ය මෙවලම්හී සාධාරණ අගයේ වෙනස		**120,000**	4,344,000
දේපළ, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය මත අතිරික්තය		**-**	-
වර්ෂය සඳහා වූ බදු රහිත වෙනත් සර්ව ව්‍යාපී ආදායම්		**(8,021,820)**	4,344,000
වර්ෂය සඳහා සර්වව්‍යාපී ආදායම් එකතුව		**(752,603,597)**	78,878,988

අදාළ ගිණුම් ප්‍රතිපත්ති හා විස්තරාත්මක සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල මුඛ්‍යාංගයක් වේ.
(වරහන් තුළ දැක්වෙන සංඛ්‍යා අවකරණ සනිටුහන් කරයි.)

ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව
2015 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා
මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	31.12.2015 (රු.)	31.12.2014 (රු.) ප්‍රතිප්‍රකාශිත
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	9	**8,506,637,899**	8,699,825,308
අස්පෘෂ්‍ය වත්කම්	10	**1,841,017**	2,609,802
කොටස් ආයෝජනය	11	**8,052,000**	7,932,000
විලම්බිත බදු	12	**13,299,231**	47,102,776
ව්‍යුත්පන්න වත්කම් ඇතුළුව වෙනත් මූල්‍ය වත්කම්	15	**11,777,205**	26,334,931
		8,541,607,352	8,783,804,817
ජංගම වත්කම්			
ඉන්වෙන්ට්‍රි භාණ්ඩ	13	**530,401,742**	564,646,060
වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ	14	**5,745,187,690**	9,088,113,432
ව්‍යුත්පන්න වත්කම් ඇතුළුව වෙනත් ජංගම මූල්‍ය වත්කම්	15	**1,473,751,806**	1,534,600,732
මුදල් හා මුදල් සමාන දෑ	16	**542,899,876**	276,793,564
		8,292,241,114	11,464,153,788
මුළු වත්කම්		**16,833,848,466**	20,247,958,605
හිමිකම් සහ වගකීම්			
අනුදත් ප්‍රාග්ධනය	17	**70,000,000**	70,000,000
ප්‍රාග්ධන වර්ධන සංචිතය		**27,738,806**	27,738,806
ප්‍රත්‍යාගණන සංචිතය		**7,484,472,989**	7,484,472,989
යන්ත්‍රෝපකරණ ප්‍රාග්ධනය		**(167,291,865)**	(167,291,865)
පොදු සංචිතය		**3,602,690**	3,602,690
අලෙවිය සඳහා ඇති සංචිත		**-**	6,732,000
රඳවාගත් ඉපයීම්		**505,656,493**	1,251,528,090
මුළු හිමිකම් අයිතිය		**7,924,179,113**	8,676,782,710
ජංගම නොවන බැරකම්			
පොළි දරන බැරකම්	18	**30,800,000**	30,800,000
සේවක ප්‍රතිලාභ	19	**188,769,676**	165,177,185
ව්‍යුත්පන්න වගකීම් ඇතුළුව වෙනත් ජංගම නොවන බැරකම්	20	**260,918,127**	408,048,903
		480,487,803	604,026,088
ජංගම බැරකම්			
පොළි දරන බැරකම්	18	**100,000,000**	100,000,000
වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ	21	**5,815,910,343**	7,881,839,438
ව්‍යුත්පන්න වගකීම් ඇතුළුව වෙනත් ජංගම බැරකම්	20	**2,050,918,298**	2,500,843,634
ගෙවිය යුතු ආදායම් බදු	22	**30,668,602**	33,848,749
බැංකු අයිරා	16	**431,684,307**	450,617,986
		8,429,181,550	10,967,149,807
මුළු හිමිකම් සහ වගකීම්		**16,833,848,466**	20,247,958,605

මෙම මූල්‍ය ප්‍රකාශය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලවන අයුරින් සකස් කරනු ලැබ ඇත.

අත්සන් කලේ/ එම්.එච්.සේනාවීර

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය)

මෙහි දැක්වෙන අධ්‍යක්ෂ මණ්ඩලයේ සභතිකය රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ අංක 45 හී අනුදේශයන්ට අනුකූල වේ. අදාළ ගිණුම් ප්‍රකාශ, ගිණුම් ප්‍රතිපත්ති හා විස්තරාත්මක සටහන් ද මෙම මූල්‍ය ප්‍රකාශනයේම සමස්ත කොටසක් වේ. මෙම මූල්‍ය ප්‍රකාශ සැකසීම් හා ඉදිරිපත් කිරීම පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතු වන අතර, අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත ඔවුන් වෙනුවෙන් අත්සන් තබමු.

අත්සන් කලේ/ආචාර්යය ටී.ඒ.පී.ගුණසේකර
සභාපති

අත්සන් කලේ/ සරත්.පී.ජයතිලක
ක්‍රියාකාරී අධ්‍යක්ෂක

ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව
2015 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා
හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

	අනුදත් ප්‍රාග්ධනය	ප්‍රාග්ධන වර්ධන සංචිත	ප්‍රත්‍යාගණන සංචිත	පොදු සංචිත	යන්ත්‍රෝපකරණ ප්‍රාග්ධනය	අලෙවිය සඳහා වූ සංචිත	රැඳවූ ඉපැයුම්	එකතුව
	(රු.)	(රු.)	(රු.)	(රු.)	(රු.)	(රු.)	(රු.)	(රු.)
2014 ජනවාරි 31 දිනය ශේෂය	70,000,000	27,738,806	7,484,472,989	3,602,690	(167,291,865)	2,388,000	1,147,626,766	8,568,537,386
වර්ෂය සඳහා වූ ලාභය	-	-	-	-	-	-	74,534,988	74,534,988
කාල පරිච්ඡේදය සඳහා වූ මුළු වෙනත් සරවවයාප ආදායම්	-	-	-	-	-	4,344,000	-	4,344,000
කාල පරිච්ඡේදය සඳහා වූ මුළු සර්වව්‍යාපී ආදායම්	-	-	-	-	-	4,344,000	74,534,988	78,878,988
භාණ්ඩාගාරයට ආධාර මුදල් මාරු කිරීම්	-	-	-	-	-	-	-	-
තොග ගැළපුම්	-	-	-	-	-	-	-	-
2014 දෙසැම්බර් 31 දිනට ශේෂය	**70,000,000**	**27,738,806**	**7,484,472,989**	**3,602,690**	**(167,291,865)**	**6,732,000**	**1,222,161,754**	**8,647,416,374**
වෙළඳ ණය ගැනියන් මත ගැළපුම්							**6,584,836**	**6,584,836**
වෙළඳ ලැබිය යුතු දෑ මත ගැළපුම්	-	-	-	-	-	-	**22,781,500**	**22,781,500**
ප්‍රතිප්‍රකාශිත පරිදි 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය	**70,000,000**	**27,738,806**	**7,484,472,989**	**3,602,690**	**(167,291,865)**	**6,732,000**	**1,251,528,090**	**8,676,782,710**
පූර්ව වර්ෂ ගැළපුම්								-
වර්ෂය සඳහා ලාභය	-	-	-	-	-	-	**(744,581,777)**	**(744,581,777)**
වෙනත් සර්වව්‍යාපී ආදායම් - ආයුගණක අලාභය							**(8,141,820)**	**(8,141,820)**
වෙනත් සර්වව්‍යාපී ආදායම් - සාධාරණ අගයේ වෙනස්වීම්							**120,000**	**120,000**
කාල පරිච්ඡේදය සඳහා වූ වෙනත් මුළු සරවවයාප ආදායම්	-	-	-	-	-		**(8,021,820)**	**(8,021,820)**
කාල පරිච්ඡේදය සඳහා වූ මුළු සරවවයාප ආදායම්	-	-	-	-	-	-	**(752,603,597)**	**(752,603,597)**
අලෙවිය සඳහා ඇති සංචිත මාරු කිරීම්						**(6,732,000)**	**6,732,000**	-
2015 දෙසැම්බර් 31 දිනට ශේෂය	**70,000,000**	**27,738,806**	**7,484,472,989**	**3,602,690**	**(167,291,865)**	-	**505,656,493**	**7,924,179,113**

අදාළ ගිණුම් ප්‍රතිපත්ති හා විස්තරාත්මක සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල මුඛකාංගයක් වේ.
(වරහන් තුළ දැක්වෙන සංඛ්‍යා අවකරණ සනිටුහන් කරයි.)

-

ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව
2015 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	2015 (රු.)	2014 (රු.) ප්‍රතිප්‍රකාශිත
මුදල් ප්‍රවාහ - මෙහෙයුම් ක්‍රියාකාරකම්		
බදු අඩු කිරීමට පෙර ලාභය	**(708,835,885)**	46,605,744
ගැලපීම්		
දේපළ, පිරියත හා උපකරණ ක්ෂයවීම්	**253,333,230**	250,696,182
අස්පෘශ්‍ය වත්කම් සඳහා ක්‍රමක්ෂය	**768,785**	745,445
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් සඳහා ප්‍රතිපාදන	**31,149,548**	
බොල් ණය සහ අඩමාන ණය සඳහා ප්‍රතිපාදනය (ප්‍රත්‍යාවර්තනය)	**1,925,929**	(130,538,045)
අභාවිත තොග සහ ප්‍රතිපාදනය (ප්‍රත්‍යාවර්තනය)	**(1,258,028)**	11,700,392
ප්‍රදාන ක්‍රමක්ෂය	**(397,130,780)**	(147,130,780)
පොලී ආදායම්	**(14,519,231)**	(12,786,578)
පොලී වියදම්	**76,743,590**	72,785,036
කාරක ප්‍රාග්ධන වෙනස් වීම් වලට පෙර මෙහෙයුම් ලාභය	**(757,822,842)**	92,077,396
ඉන්වෙන්ට්‍රි භාණ්ඩ (වැඩි වීම) / අඩු වීම	**35,502,346**	35,164,275
වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ (වැඩි වීම) / අඩු වීම	**1,701,056,145**	(849,625,323)
ජංගම මූල්‍ය වත්කම් (වැඩි වීම) / අඩු වීම	**75,406,652**	(50,578,516)
වෙනත් ජංගම මූල්‍ය වගකීම් (වැඩි වීම) / අඩු වීම	**(597,056,112)**	(45,845,695)
වෙළඳ හා වෙනත් ගෙවීම් (වැඩි වීම) / අඩු වීම	**(238,416,551)**	1,339,214,187
මෙහෙයුම් ක්‍රියාවලියෙන් ඉපයූ (ක්‍රියාවලියට යොදාගත්) මුදල් (අඩු වීම්)/වැඩි වීම්	**218,669,638**	520,406,324
පොලී ගෙවීම්	**(76,743,590)**	(72,785,036)
පාරිතෝෂික ගෙවීම්	**(15,698,877)**	(10,059,060)
ආදායම් බදු ගෙවීම්	**(2,082,349)**	(1,764,535)
මෙහෙයුම් ක්‍රියාවලියෙන් ඉපයූ (ක්‍රියාවලියට යොදාගත්) ශුද්ධ මුදල් ප්‍රමාණය	**124,144,822**	435,797,693
ආයෝජන කටයුතු වලින් ලද මුදල් ප්‍රමාණය		
දේපළ, පිරියත හා උපකරණ මිලදී ගැනීම	**(60,145,822)**	(379,690,953)
කෙටි කාලීන ආයෝජන		(553,142)
පොලී ලැබීම්	**13,633,410**	12,786,578
අස්පෘශ්‍ය වත්කම් අත්පත් කර ගැනීම	-	(1,400,560)
ආයෝජන කටයුතු වලින් ලද (ක්‍රියාවලියට යොදාගත්) ශුද්ධ මුදල් ප්‍රමාණය	**(46,512,412)**	(368,858,077)
මුදල් කටයුතු වලින් ලද මුදල් ප්‍රවාහය		
කල්බදු ආපසු ගෙවීම්	-	(3,522,745)
ලත් ප්‍රදාන	**250,000,000**	**-**
මූල්‍ය ක්‍රියාකරකම් තුළින් ලද (ක්‍රියාවලියට යොදාගත්) ශුද්ධ මුදල් ප්‍රමාණය	**250,000,000**	(3,522,745)
කාලපරිච්ඡේදය තුළ මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩි වීම/ (අඩු වීම)	**327,632,409**	**63,416,871**
කාලපරිච්ඡේදය තුළ ආරම්භයේ පැවති මුදල් හා මුදල් සමාන දෑ	**(213,376,695)**	(276,793,564)
කාලපරිච්ඡේදය තුළ අවසානයේ පැවති මුදල් හා මුදල් සමාන දෑ	**111,215,568**	(213,376,695)

අදාළ ගිණුම් ප්‍රතිපත්ති හා විස්තරාත්මක සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල මුඛ්‍යාංගයක් වේ.
(වරහන් තුළ දැක්වෙන සංඛ්‍යා අවකරණ සනිටුහන් කරයි.)

ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව
2015දෙසැම්බර් 31 දිනට අවසන් වූ වර්ෂය සඳහා
මූල්‍ය ප්‍රකාශයට අදාළ සටහන්

1. සාමාන්‍ය

1.1. වාර්තාමය ආයතනය

1957 අංක 49 දරන රාජ්‍ය කර්මාන්ත සංස්ථා පනත යටතේ 1962 ජනවාරි මස 1 වන දින ස්ථාපිත කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව, නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ. ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ ලියාපදිංචි කළ ප්‍රධාන කාර්යාලය කොළඹ 2, ඩබ්ලිව්.ඒ.ඩී. රාමනායක මාවත, අංක 130 දරන ස්ථානයේ පිහිටා ඇත.

1.2. මූලික ක්‍රියාකාරකම් හා මෙහෙයුම්වල ස්වභාවය

මූලික වශයෙන් ඉදිකිරීම් ක්‍රියාකාරකම් ව්‍යාපාරයේ නියැලී සිටින රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව, සිවිල් ඉංජිනේරු ඉදිකිරීම් කාර්මික හා විදුලි ඉංජිනේරු, ගෘහ නිර්මාණ හා ඉංජිනේරු උපදෙස් සේවා, පෙර සවි උපාංග හා සිවිල් ඉංජිනේරු ව්‍යාපෘති සඳහා උපාංග සහ ගොඩනැගිලි ද්‍රව්‍ය නිෂ්පාදනය සහ සේවාවන් සපයයි.

2. වැදගත් ගිණුම් ප්‍රතිපත්තීන්හි සම්පිණ්ඩනය

2.1. අනුකූලතා ප්‍රකාශය

සවිස්තරාත්මක ආදායම, මුදල් තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, හිමිකම් වෙනස්වීම් හා මුදල් ප්‍රවාහ ප්‍රකාශ සමඟ ගිණුම් ප්‍රතිපත්ති හා මුදල් ප්‍රකාශ පිළිබඳ සටහන් සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශයන්හි අඩංගු වේ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය මගින් නිර්දේශකර නිකුත් කරන ලද ගිණුම් ප්‍රමිතිහා සම්මතයන්ට අනුකූල වන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම් ප්‍රතිපත්තීන්ට අනුව මෙම ගිණුම් ප්‍රකාශ සකසා ඇත.

2.2. මූල්‍ය ප්‍රකාශ සම්බන්ධයෙන් වගකීම

අධ්‍යක්ෂ මණ්ඩලය, අංකPED 45 දරන රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරවත්, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලවත් සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කර ඉදිරිපත් කිරීමේ වගකීම උසුලයි. මූල්‍ය ප්‍රකාශවලට කර ඇති අධ්‍යක්ෂවරුන්ගේ වගකීම පිළිබඳ ප්‍රකාශයෙහි හා අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාවෙහිද, මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයෙහි දැක්වෙන ප්‍රකාශයෙහි සඳහන් පරිදි අධ්‍යක්ෂ මණ්ඩලය මෙම වගකීම දරයි.

2.3. මූල්‍ය ප්‍රකාශවල අංග

මූල්‍ය ප්‍රකාශ පහත දැක්වෙන අංගවලින් සමන්විත වේ.

- x ලාභ හෝ අලාභ ප්‍රකාශය සහ වෙනත් සර්වව්‍යාපී ආදායම්: සමාලෝචිත වර්ෂය සඳහා සංස්ථාවේ මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ තොරුතුරු සැපයීම.
- x මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය: වසර අවසානයේදී සංස්ථාවේ මූල්‍ය තත්වය පිළිබඳ තොරතුරු සැපයීම.
- x හිමිකම් වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය: සමාලෝචිත වසර තුළ සංස්ථාවේ අනුදත් ප්‍රාග්ධනය හා සංචිත පිළිබඳ චලනයන්හී තොරතුරු සැපයීම.
- x මුදල් ප්‍රවාහ ප්‍රකාශය : මුදල් හා මුදල් හා සමාන දෑ සහ ඒවායේ උපයෝජන පිළිබඳ තොරතුරු සැපයීම.
- x මූල්‍ය ප්‍රකාශවලට අදාළ සටහන්: ගිණුම් ප්‍රතිපත්ති හා අනෙකුත් සවිස්තරාත්මක තොරතුරු මෙම සටහන්හී අඩංගු වේ.

2017 පෙබරවාරි මස 28 වන දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරන ලද යෝජනාවට අනුව මෙම මුදල් ප්‍රකාශ නිකුත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබ ඇත.

2.4. ගණනය කිරීමේ පදනම

මුදල් තත්වය පිළිබඳ ප්‍රකාශයේ පහත දැක්වෙන ද්‍රව්‍ය අයිතම හැර, මෙම මූල්‍ය ප්‍රකාශය ඓතිහාසික පිරිවැය පදනම මත ගිණුම් ප්‍රතිපත්තීන්ට අනුකූලව සකසා ඇත.

- x සාධාරණ අගයට ගණනය කරන ලද මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම්. (ලංකා ගිණුම් ප්‍රමිත අංක 39)
- x ව්‍යාපෘති ඒකක ණය ක්‍රමය පදනම්ව හඳුනාගත් සේවක ප්‍රතිලාභ වගකීම (ලංකා ගිණුම් ප්‍රමිත අංක 19)
- x දේපළ, යන්ත්‍ර හා උපකරණ සහ වාහන සඳහා ප්‍රත්‍යාගණන අගයට දක්වා ඇත. (ලංකා ගිණුම් ප්‍රමිත අංක 16)

ඉදිරියට සාර්ථක ලෙස කටයුතු කරගෙන යාමෙහිලා සංස්ථාවලට ඇති හැකියාව පිළිබඳව අධ්‍යක්ෂකවරුන් තත්සේරුකර ඇති අන්දමටනුදුරු අනාගතයේදී සංස්ථාවේ ව්‍යාපාර කටයුතු අත්හිටුවීමේ හෝ ඈවර කිරීමේ අවශ්‍යතාවයක් ඔවුන් නොදකී.

2.5. කෘත්‍යාත්මක හා ඉදිරිපත් කරනු ලබන ව්‍යවහාර මුදල

සංස්ථාවේ කෘත්‍යාත්මක ව්‍යවහාර මුදල වන ශ්‍රී ලංකා රුපියල් මගින් මෙම මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කර ඇත. සියලු අගයන් ආසන්න රුපියලට ගණනය කර වටරවුම් කර ඇත.

2.6. ඇස්තමේන්තු හා නිශ්චයමතිය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශ සැකසීමේදී හා ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කිරීමේදී දක්වා ඇති වත්කම්, වගකීම්, අය සහ වැය පිළිබඳව තක්සේරු කිරීම්, උපකල්පනය හා විනිශ්චය කිරීම් කළමනාකරණය මගින් කළයුතු වේ. නිශ්චයමතීන් හා තක්සේරු කිරීම් අතීත අත්දැකීම් හා වෙනත් කරුණු අතර පවතින තත්වයන් යටතේ සාධාරණයයි විශ්වාස කෙරෙන බලාපොරොත්තු මත පදනම් වේ. ඒ අනුව සත්‍ය අත්දැකීම් හා ප්‍රතිඵල විනිශ්චයන් හා තක්සේරු කිරීම්වලට වඩා වෙනස් විය හැක.

ක්‍රියාත්මක ව්‍යාපාර තත්වය

ක්‍රියාත්මක ව්‍යාපාර කර්තව්‍යයක් ලෙස සංස්ථාවට සිය කටයුතු පවත්වා ගෙන යාමේ ඇති හැකියාව පිළිබඳ කළමනාකරණය විසින් තක්සේරු කරනු ලැබ ඇති අතර නුදුරු අනාගතය තුළ ස්වකීය ව්‍යාපාර කාර්යයන් නොකඩවා කරගෙන යාම සඳහා ඊට අවශ්‍ය සම්පත් සංස්ථාව සතුව පවත්නා බවට කළමනාකරණය සෑහීමට පත්වී සිටී. තවද, සංස්ථාව ක්‍රියාත්මක ව්‍යාපාරයක් ලෙස කටයුතු කර ගෙන යාම සඳහා එහි හැකියාව කෙරෙහි චිල්ල වී ඇති සැලකිය යුතු සැකයක් උපදවන යම් විශේෂිත අවිනිශ්චිතතා කිසිවක් පවත්නා බවට තොරතුරු කළමනාකරණයට දැන ගැනීමට නොමැත. එහෙයින් මෙම මුල්‍ය ප්‍රකාශ සංස්ථාව ක්‍රියාත්මක ව්‍යාපාරයක් යන පදනම මත පිහිටා පිළියෙළ කිරීම අඛණ්ඩව සිදුවී ඇත.

බදු

මෙම මුල්‍ය ප්‍රකාශ පිළියෙළ කළ අවස්ථාවේදී බදු අණපනත් යොදා ගැනීම සම්බන්ධයෙන් වූ අර්ථ නිරූපණ පිළිබඳ පැවති අවිනිශ්චිතතා හේතු කොටගෙන ජංගම, විලම්බිත හා වෙනත් බදු සඳහා වූ මුළු ප්‍රතිපාදන නිශ්චය කිරීමෙහිලා සැලකිය යුතු නිශ්චයමතියක අවශ්‍යතාව පැන නැංගේය. සංකීර්ණ බදු රෙගුලාසි අර්ථකථනය සම්බන්ධයෙන්ද, අනාගතයේදී බදුවන ආදායම්හී මුදල් ප්‍රමාණ හා එහි කාලානුරූපතාව සම්බන්ධයෙන්ද අවිනිශ්චිත තත්වයක් පවතී.

පුළුල් පරාසයක පවතින ව්‍යාපාරික සබඳතා සහ දැනටමත් පවතින කොන්ත්‍රාත්තුමය ගිවිසුම්හී දිගුකාලීන ස්වභාවය හා සංකීර්ණාත්වය සලකන කළ, තථ්‍ය ප්‍රතිඵල හා කරන ලද උපකල්පන හෝ එකී උපකල්පනවලට ඉදිරියේදී කරනු ලබන වෙනස්කම් අතර ඇතිවන විෂමතා මගින් දැනටමත් සටහන්ගත කර ඇති බදු ආදායම හා වියදම් විෂයයෙහි අනාගත ගැළපුම් සිදුකිරීමේ අවශ්‍යතාවක් උද්ගත කෙරෙනු ඇත.

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්

සංස්ථාවේ සේවක ප්‍රතිලාභ වගකීම ස්වාධීන ආයුගණක විශේෂඥයකු විසින් කරනු ලබන ආයුගණක තක්සේරුවක් මත පදනම් වේ. වට්ටම් අනුපාතය හා අනාගත වැටුප් වැඩිවීම් පිළිබඳ උපකල්පනවලට වළඹීම ආයුගණක තක්සේරුවලට අදාළ වේ. නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් තක්සේරු කිරීමේ සංකීර්ණතාවයත්, ඒ පිළිබඳ සැලකිය යුතු උපකල්පන වලට වළඹීමේ ක්‍රමවේදය හා එහි දිගුකාලීන ස්වභාවයත් මෙකී උපකල්පන විෂයෙහි ඉතා සංවේදී ලෙස වෙනස්කම් සිදු කරයි. අදාළ සියලු උපකල්පන සෑම රපෝර්තු දිනයකදීම සමාලෝචනයට භාජනය කෙරේ. ඇස්තමේන්තුවල භාවිතා කර ඇති ප්‍රධාන උපකල්පනවල විස්තර 19 වන සටහනෙහි අඩංගු වේ.

3. සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති

විශේෂිතව සඳහන් කර ඇති අවස්ථාවන් හිදී හැර මෙම මූල්‍ය ප්‍රකාශයන්හි පහත දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සෑම කාල පරිච්ඡේදයක් සඳහාම ඒකාකාරව භාවිතා කර ඇත.

3.1. විදේශ ව්‍යවහාර මුදල්

3.1.1.විදේශ ව්‍යවහාර මුදල් ගණුදෙනු

සංස්ථාවේ මූල්‍ය වාර්තා සැකසීමේදී, විදේශ මුදල් සම්බන්ධ ගනුදෙනු වලදී එම දිනට අදාළ විනිමය ප්‍රතිශතයට අනුව ගණනය කර සඳහන් කර ඇත. සෑම වාර්තා ගත දිනකම විදේශ ගණුදෙනු දිනය අවසානයේ පැවති විනිමය ප්‍රතිශතය අනුව සඳහන් කර ඇත. මුදල් නොවන අයිතම සාධාරණ අගයකට ගණනය කර එම සාධාරණ මිල ගණනය කළ දිනට පැවැති විනිමය අනුපාතයට ගණනය කර ඇත. අතීත මිලකට ගණනය කල මුදල් නොවන අයිතම ගනුදෙනුව සිදුවන දිනයේ විනිමය අනුපාතයට ගණනය කර ඇත. මූල්‍ය අයිතම පියවීමේදී මතුවන විනිමය අනුපාත වෙනස්කම් එම කාල සීමාවේ ලාභ හෝ අලාභ ප්‍රකාශයෙහි අඩංගු වේ.

3.2.වත්කම් තක්සේරු කිරීමේ පදනම

මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ දැනට පවතින වත්කම් ලෙසට වර්ග කෙරෙන්නේ මුදල්, බැංකු ශේෂ සහ ප්‍රකාශයේ දින සිට වසරක් තුළ හෝ සංස්ථාවේ සාමාන්‍ය ව්‍යාපාර ක්‍රියාවලියේදී මුදල් ලැබේ යයි අපේක්ෂා කරන තත්වයෙන් කාල සීමාව අඩුවන ගනුදෙනුය. දැනට පවතින වත්කම් වලට අමතර වත්කම් වන්නේ ප්‍රකාශයේ දින සිට වසරකට වැඩි කාලයක් රඳවා ගැනීමට සංස්ථාව බලාපොරොත්තු වන වත්කම් වේ.

3.2.1.දේපළ, පිරියත හා උපකරණ

3.2.1.1. හඳුනා ගැනීම් සහ මානනය

වටිනාකමින් චිකතුවූ ක්ෂය වීම් හා අපහරණ ක්ෂයවීම් පාඩු අඩු කළ මුදලක් දේපළ, පිරියත හා උපකරණ අගය ලෙසට සඳහන් වේ. දේපළක යන්ත්‍ර හා උපකරණ වල යම් යම් කොටස් වල ප්‍රයෝජනයට ගත හැකි කාලය වෙනස් වේ නම්, එම කොටස් වෙන් වෙන් අයිතම වශයෙන් (ප්‍රධාන උපාංග) දේපළ, පිරියත සහ උපකරණ ලෙස ගණනය කෙරේ.

3.2.1.2.අයිතිය හිමි වත්කම්

යම් දේපළක, යන්ත්‍රයක හෝ උපකරණයක අගය තුළ එය මිලදීගත් අගය සහ එය අපේක්ෂිත කාර්යය සඳහා යොදා ගැනීමට වැය වන මුදලද අඩංගු වේ. ස්වයං ඉදිකිරීම් වත්කම් සඳහා අමුද්‍රව්‍ය මිල, කම්කරු ශ්‍රමය හා එය ප්‍රයෝජනයට ගැනීම සඳහා අවශ්‍ය වෙනත් ගුණාත්මක වැය වීම්ද අඩංගු කෙරේ. එම අයිතමය කොටස් වශයෙන් වෙන්කර එක් ස්ථානයක සිට අවශ්‍ය වෙනත් ස්ථානයකට ප්‍රවාහනය කර නැවත සවිකිරීම් සඳහා වන වැයවීම්ද මෙහි අඩංගු වේ.

උපකරණයක ක්‍රියාකාරිත්වයට ඒකාබද්ධ වූ මෘදුකාංග මිලදී ගැනීමේදී එය උපකරණයේ කොටසක් ලෙසට අගය කෙරේ.

3.2.1.3.කල් බදු වත්කම්

සියලුම අවදානම් හා අයිති ප්‍රදානය ලබන අනුදේශ මත ගන්නා සියලුම බදු වත්කම් මූල්‍ය බදු ලෙසට වර්ග කෙරේ. මූලික හඳුනා ගැනීමෙන් අනතුරුව එහි සාධාරණ අගයේ අවමය සහ බදු වාරිකයේ අවමයට සමාන මුදලකට අගය කෙරේ. මූලික හඳුනාගැනීමට අනතුරුව එම වත්කමට අදාළ වන ගිණුම්කරණ ප්‍රතිපත්තියට අනුකූලව ගණන් තැබේ. කුලී වාරික ගෙවීම්, කුලී බදු වියදම්

හා බදු වගකීම් අඩුවීම අතර බෙදා වෙන් කෙරේ. ඒ අනුව වගකීම් ඉතිරි ප්‍රමාණය සඳහා ස්ථාවර පොලී අනුපාතයක් රඳවා ගැනීම් පහසු වේ. ආදායම් ප්‍රකාශයේ කුලී බදු, වියදම් අයකිරීම් මුදල් වියදම් ලෙසට හඳුනා ගැනේ. අනිකුත් කුලී බදු ක්‍රියාකාරී කුලී ලෙසට සැලකෙන අතර සංස්ථාවේ මුදල් තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ පිළිගැනීමට ලක් නොවේ.

3.2.1.4.පසුකාලීන පිරිවැය

යම් දේපළක, යන්ත්‍රයක හෝ උපකරණයක කොටසක් අලුතින් යෙදීමට සිදුවීමේදී, එම කොටස යෙදීම තුළින් ආයතනයට වන ආර්ථික යහපත සහ එහි අගය ස්ථීර ලෙසට ගණනය කල හැකි යයි පෙනී යයි නම් එම අයිතමයේ පිළිගත් අගයට එම වැයවීම සම්බන්ධ වේ. අලුතින් යෙදූ කොටසේ පවතින අගය පිළිගැනීමට ලක් නොවේ.

දේපළ, යන්ත්‍ර හා උපකරණ වල දෛනික නඩත්තු වියදම් ලාභ හෝ අලාභ ප්‍රකාශයේ සටහන් වේ.

3.2.1.5.නොපිළිගැනීම

දේපළක, යන්ත්‍රයක හෝ උපකරණයක පවතින අගය එම යම් අයිතමයක් විනිසාසය කිරීම හෝ එය නැවත භාවිත කිරීම හෝ විනිසාස කිරීමෙන් ආයතනයට ඉදිරියේදී කිසිදු ආර්ථික වාසියක් අත් නොවේ නම්, දේපළක, යන්ත්‍රයක හෝ උපකරණයක පවතින අගය නොපිළිගැනේ.

3.2.1.6.ප්‍රත්‍යාගණනය

අඩු තරමින් සෑම වසර තුනකට වරක් සන්තක ඉඩම් සහ ගොඩනැගිලි විවෘත වෙළඳපොළ අගයන් භාවිතා කර වෘත්තීය සුදුසුකම් ලත් තක්සේරුකරුවන් මගින් ප්‍රතිතක්සේරු කිරීම සිදු කෙරේ. ඉන්පසුව ප්‍රතිතක්සේරු මුදලට දේපළ සටහන් කර, ඇගැයීම් අතිරික්තය වත්කමේ පවතින ශුද්ධ අගය මත හඳුනා ගෙන ප්‍රත්‍යාගණනය අතිරේකයකට ස්ථානාන්තර කෙරේ. දේපළ පිලිනොගැනීමේ අවස්ථාවේදී ප්‍රත්‍යාගණනය අතිරික්තය රඳවාගත් ඉපයීමක් ලෙසට ස්ථානාන්තර කෙරේ.

3.2.1.7.ක්ෂය වීම

ක්ෂය වීමේ ප්‍රමාණය අනුව ක්ෂය වීම ගණනය කෙරේ. එනම් වත්කමේ අගය හෝ අය වීමට ආදේශ කළ වෙනත් අගයකින් වත්කමේ පවතින ඉතිරි අගය අඩුකළ පසු ලැබෙන ඉතිරි අගයයි.

දේපළක, යන්ත්‍රයක හෝ උපකරනයක එක් එක් උපාංගයන් ඵලදායි කාල සීමාව ඇස්තමේන්තු කිරීම් මත ලාභ හෝ පාඩු අනුව සරල මාර්ග ක්‍රමය මත කෙරෙන්නේ එමගින් වත්කමේ පවතින ආර්ථික ඵලදායීතාව ඉදිරියේදී ප්‍රයෝජනයට ගැනෙන ආකාරය වඩාත් පැහැදිලි ලෙසට පෙන්නුම් කරන බැවිනි. බදු කාලය අවසානයේදී සංස්ථාවට අයිතිය හිමිවීම ස්ථීර තත්වයකදී හැර බදු ක්‍රම යටතේ පවතින අයිතම පිළිබඳ ක්ෂය වීම පිරික්සීමේදී බදු කාලය සහ අයිතමයේ ඵලදායී කාලසීමාවෙන් අඩු කාල සීමාවට ගණනය කෙරේ. ඉඩම් අගයන් ක්ෂය කිරීමක් සිදු නොවේ.

ඇස්තමේන්තුගතප්‍රයෝජ්‍ය ආයු කාලයන් පහත දැක්වෙන ආකාරයට වේ.

වත්කම වර්ගය	ප්‍රයෝජ්‍ය ආයු කාලය (අවුරුදු)	අගය ක්ෂය වීමේ අනුපාතය **(%)**
ගොඩනැගිලි	40	2.5%
යන්ත්‍ර හා උපකරණ	05	20%
ලී බඩු හා සවිකිරීම්	10	10%
රථවාහන	05	20%
කාර්යාල උපකරණ	05	20%
පරිගණක	05	20%

පරිහරණය සඳහා පවතින කාලය තුළ වත්කමක ක්ෂයවීම ආරම්භ වන අතර එම වත්කම් විකිණීම සඳහා නියම වීම සහ ඒ අනුව එම වත්කම පිළිගැනීමට ලක්වන දින සිට ක්ෂයවීම නතර කෙරේ.

ක්ෂය කිරීමේ ක්‍රමවේදය, ප්‍රයෝජ්‍ය ආයු කාලය සහ ඉතිරි අගය සෑම මුදල් වර්ෂයකම අවසානයේ සමාලෝචනය කෙරෙන අතර සුදුසු අන්දමට ගැළපුම්වලට ලක් කෙරේ.

3.2.2.කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ

වර්ෂය තුළදී වියදම් දරන ලද, වාර්තා දිනට නිම නොවූ සේවාවන් කෙරෙමින් පවතින ප්‍රාග්ධන වැඩ ලෙසට පෙන්නුම් කෙරේ. වර්ෂය තුළ නිමකළ ප්‍රයෝජනයට ගත හැකි ප්‍රාග්ධන වත්කම්, දේපළ,පිරියත හා උපකරණ ලෙසට මාරු කර ඇත.

3.2.3. අස්පෘෂ්‍ය දේපළ

අස්පෘශ්‍ය වත්කමක් හඳුනා ගැනෙනුයේ, වත්කම් හේතුවෙන් ආයතනයට ආර්ථික ප්‍රතිලාභ ලැබීම අනුමාන වන අවස්ථාවකදී හා අදාළ වත්කමෙහි පිරිවැය විශ්වාසදායක ලෙස මානනය කළ හැකිවීමෙන් පසුව සමුච්චිත ක්‍රමක්ෂය සහ සමුච්චිත දුබලතා අඩුකරන ලද පිරිවැය වෙත එය ගෙන ඒමට හැකි අවස්ථාවකදීය.

3.2.3.1.මෘදුකාංග

ආයතන මෘදුකාංග සහ අභ්‍යන්තරයෙන් සම්බන්ධ නොවන පැහැදිලිව හඳුනාගත හැකි, විශ්වාසනීය ලෙසට ගණනය කළ හැකි අනාගතයේදී ආර්ථික අර්ථලාභ අපේක්ෂා කළ හැකි සියලුම පරිගණක මෘදුකාංග පිරිවැය අස්පෘශ්‍ය වත්කම් ප්‍රභේදය යටතේ මුදල් තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ අඩංගු කෙරේ.

3.2.3.2.තදනන්තර පිරිවැය

අදාළ වන වත්කමට අන්තර්ගත අනාගත ආර්ථික ලාභ වර්ධනයක් වේ නම් පමණක් තදන්තර වැය ප්‍රාග්ධනික කෙරේ. අනිකුත් වියදම් සියල්ල දරන ලද ලාභ හෝ පාඩු ලෙසට පිළිගැනේ.

3.2.3.3.ක්‍රමක්ෂය

ක්‍රමක්ෂය ගණනය කෙරෙනුයේ වත්කම්වල පිරිවැය ප්‍රමාණය හෝ වත්කම් සඳහා ආදේශිත වෙනත් ගණන් ප්‍රමාණ අඩුකළ පසු ලැබෙන අවශේෂ අගය මතය. ලාභ හෝ අලාභ තුළ අස්පෘශ්‍ය වත්කම් විෂයෙහි ක්‍රමක්ෂය හඳුනා ගැනෙනුයේ සරළ මාර්ග පදනමක් මත ඒවා ප්‍රයෝජනය සඳහා පවත්නා දිනයේ සිට ආරම්භ වන එහි ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ආයු කාලය අනුවය. මෙසේ සිදු කෙරෙනුයේ එකී වත්කම්වල සංයුක්තව පවත්නා අනාගත ආර්ථික ප්‍රතිලාභවල අපේක්ෂිත පරිභෝජන රටාව එමගින් නිරූපණය කරනු ලබන නිසාය.

වත්කම් ප්‍රභේදය	ඵලදායී කාලය (අවුරුදු)	ක්ෂයවීමේ ප්‍රතිශතය (%)
පරිගණක මෘදුකාංග	05	20%

ක්‍රමක්ෂය මාර්ග ප්‍රයෝජ්‍ය ආයුකාලය සහ අවශේෂ අගය සෑම මුදල් වර්ෂයකම අවසානයේදී සමාලෝචනයට ලක් කර උචිත වේ නම්, ඊට ගැළපුම් සිදුකෙරේ.

3.2.4. වෙළඳ තොග

වෙළඳ තොග සඳහන් කෙරෙනුයේ, යල් පිනූ හා මන්දගාමීව චලනය වන විෂයාංග සඳහා නිසි ඉඩහැරීම් වලින් අනතුරුව ඒවායේ පිරිවැය අගය හා ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයටය. වෙළඳ තොගවල පිරිවැය සමන්විත වනුයේ, ඒවා මිලදී ගැනීම සඳහා දරන ලද සියලුවියදම්ද, ඒවායේ පරිවර්තය වියදම් හා ඒවා දැනට තබා ඇති ස්ථාන වෙත හා ඒවායේ වර්තමාන තත්වය වෙත ගෙන ඒම සඳහා දරන ලද අනෙකුත් පිරිවැයද යනාදියෙනි. වෙළඳ තොගවල ශුද්ධ උපලබ්ධි අගය වනුයේ, දැනට ඒවායෙහි පවත්නා විකිණිය හැකි තත්වයට අදාළ අගයෙන් ඒවායේ ශුද්ධ උපලබ්ධි පිරිවැය හා/හෝ ඒවායේ පරිවර්තය වටිනාකම අඩුකළ සාමාන්‍ය ව්‍යාපාරික තත්වයන් යටතේ විකිණිය හැකි ඒවායේ ඇස්තමේන්තුගත වටිනාකමයි.

වෙළඳ තොගවල ආපසු අයකරගත හැකි අගය තක්සේරු කිරීම සඳහා සෑම රපෝර්තු කාලපරිච්ඡේදයක් අවසානයේදී විශේෂඥයකු විසින් වෙළඳ තොගවල සංචලන සමාලෝචනයට භාජනය කරනු ලබන අතර ආපසු අයකරගත නොහැකි වෙතැයි යනුවෙන් හඳුනාගනු ලබන විෂයාංග වර්ෂය තුළදී ලියා අස්කරනු ලබනවා ඇත.

3.2.5. කෙරෙමින් පවත්නා වැඩ

අනාගත වැඩ කටයුතු සඳහා දරනු ලබන කොන්ත්‍රාත්තමය පිරිවැය ඒවායේ අගය ආපසු අයකරගත හැකි වේදැයි අනුමාන කරනු ලබන කල්හී, වත්කමක් ලෙස හඳුනා ගනු ලබන අතර එබඳු පිරිවැය කෙරෙමින් පවත්නා වැඩ යනුවෙන් හඳුනා ගැනේ. ඒවායේ විචලනය හා ඊට හිමිකම් පෑම කොන්ත්‍රාත් ආදායම තුළ හඳුනා ගැනෙනුයේ, අදාළ පාරිභෝගිකයා විසින් ඒවායේ විචලනය

හා හිමිකම්පෑම සම්බන්ධයෙන් අනුමැතිය ලබා දෙතැයි අනුමාන කෙරෙන්නා වූ හා අදාළ ආදායම් ප්‍රමාණය විශ්වාසදායක ලෙස මැනිය හැකි වන්නා වූ අවස්ථාවේදී පමණි. ඒවා මෙලෙස ආදායමෙහි හඳුනා ගනු ලබන තෙක් විචලනය හා හිමිකම් පෑම් සඳහා දරනු ලබන පිරිවැය කෙරෙමින් පවත්නා වැඩ යනුවෙන් වර්ගීකරණය කෙරේ.

3.2.6. මුදල් හා මුදල් සමාන දෑ

දන්නා මුදල් ප්‍රමාණවලට වහා පරිවර්තනය කළ හැකි හා මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාර්යයන් සඳහා ඉල්ලූ විට ආපසු ගෙවනු ලැබිය හැකි බැංකු අයිරා රහිත ශුද්ධ අගයන්හී වෙනස්කම්වල සැලකිය නොහෙන අවදානමට යටත් මුදල් ශේෂ, නිවේදන තැන්පතු, ඉල්ලුම් තැන්පතු හා කෙටි කාලීන අධිද්‍රවශීල ආයෝජන වලින් මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වේ.

3.2.7.මුදල් නොවන වත්කම් හායනය

සෑම වාර්තා දිනකම යම් දේපළක් හායනය වීමේ තත්ත්වයක් පෙන්නුම් කරන්නේ දැයි සංස්ථාව මගින් තක්සේරු කෙරේ. එවැනි පෙන්නුම් කිරීමක් පවතීනම් හෝ යම් දෙපළක වාර්ෂික හායනය වීමේ පරීක්ෂාව අවශ්‍ය විටදී සංස්ථාව විසින් එම වත්කමෙන් අය කරවා ගත හැකි වටිනාකම තක්සේරු කෙරේ. භාවිතයේදී වත්කමේ වටිනාකම සහ විකිණීමට වන වැය අඩු කළ එහි සාධාරණ මිල අතරින් වැඩි මුදල වත්කමේ අයකරවා ගත හැකි ප්‍රමාණය ලෙස සැලකේ. එය එක් එක් වත්කමට වෙන් වශයෙන් ගණනය කෙරේ. එම වත්කමින් අනිකුත් වත්කම් හා වත්කම් කාණ්ඩයකින් නිදහස්ව ස්වාධීන මුදල් ගලනයක් උත්පාදනය නොවන්නේ නම් එක් එක් වත්කමට වෙන් වශයෙන් ගණනය කෙරේ. යම් වත්කමක ඉදිරියට ගෙන යන අගය, එයින් අයකරවා ගත හැකි අගයට වඩා වැඩි වේ නම් එම දේපළ හායනය වූ ලෙසට සලකා එයින් අයකරවා ගත හැකි අගයට සටහන් කෙරේ. භාවිත අගය තක්සේරු කිරීමේදී, මුදලේ කාලීන අගය සහ එම වක්තමට විශේෂිත වූ අවදානම පෙන්නුම් කරන පෙරබදු වට්ටම් අගයන් ලෙසට ඉදිරි මුදල් ගලනයන් වට්ටම් කෙරේ.

විකුණුම් පිරිවැය අඩුකළ සාධාරණ මිල ගණනය කිරීමේදී මෑතක සිදුකළ වෙළඳ පොළ ගනුදෙනු සැලකිල්ලට ගැනේ. එබඳු ගනුදෙනු හඳුනාගත නොහැකි නම් ප්‍රමාණවත් ඇගැයීමේ ආකෘතියක් යොදා ගැනේ.

ක්‍රියාත්මක වන මෙහෙයුම් තුළ හායනය වීමේ අලාභ සර්වව්‍යාපී ආදායම් ප්‍රකාශයේ හඳුනා ගැනෙනුයේවිසේ දුබලත්වයට පත් වත්කමෙහි ක්‍රියාකාරිත්වය අනුගත වන්නාවූ වියදම් කාණ්ඩ තුළය.

අවසාන වරට හායනය වීමේ පාඩුව හඳුනාගැනීමට අනතුරුව, වත්කමේ අයකර ගත හැකි වටිනාකම ගණනය කිරීමේදී භාවිතා කළ තක්සේරුවේ යම් වෙනසක් වී ඇත්නම් පමණක් කලින් හඳුනාගත් දුබලතා පාඩුව ප්‍රත්‍යාවර්තනය කෙරේ. එවැනි අවස්ථාවකදී වත්කමේ ඉදිරියට ගෙන යන අගය අයකරවා ගත හැකි අගයට ඉහළ දැමේ. එම වත්කම පිළිබඳව පෙර වර්ෂ තුළ කිසිදු හායන පාඩුවක් හඳුනාගෙන නොතිබුණේ නම් ශුද්ධ ක්ෂය වීම තීන්දු කෙරෙන ඉදිරියට ගෙන යන අගය මෙම ඉහළ දැමූ අගයට වඩා වැඩි නොවිය යුතුය. එවැනි ප්‍රත්‍යාවර්ත සර්වව්‍යාපී ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගනු ලැබේ.

3.3. මූල්‍ය මෙවලම්

3.3.1 මූල්‍ය වත්කම්

3.3.1.1.මූලික පිළිගැනීම හා මිණුම්

ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති අංක 39 විෂය පථය තුළ පවතින මූල්‍ය වත්කම් ලාභ හෝ පාඩු, ණය හා ලැබිය හැකි, කල් පිරෙන තෙක් රඳවා ඇති ආයෝජන, අලෙවි කළ හැකි මූල්‍ය වත්කම් හෝ බල සහිත හෙජ් ගිවිසුමක හෙජින් උපකරණයක් ලෙසට නියම කරන ලද ව්‍යුත්පන්න තුළින් සාධාරණ මිලට පවතින මූල්‍ය වත්කම් මූලික හඳුනා ගැනීමේදී සංස්ථාව තම මූල්‍ය වත්කම් වල වර්ගීකරණය නිශ්චිත කර ගනී.

සෑම වත්කමක්ම මූලිකව සාධාරණ මිලට වඩා වැඩි ලෙසට පිළිගන්නා අතර, එසේ නොවන වත්කම් ලාභ හා පාඩු මගින් සෘජුව ආරෝපනීය ගණුදෙනු කළ හැකි මිලට හඳුනා ගනී. වෙලඳ පොළෙහි පවතින රෙගුලාසි හෝ සම්මුති අනුව කාල පරාසයක් තුළදී ලබා දිය යුතු වන මූල්‍ය වත්කම් මිලදී ගැනීමේදී හා අලෙවි කිරීමේදී සංස්ථාව එම වත්කම මිලදී ගැනීම හෝ විකිණීමට නියම කිරීම් දිනට පිළිගැනේ.

සංස්ථාවේ මූල්‍ය වත්කම් තුළ මුදල් හා මුදල් සමාන දෑ ද, කෙටි කාලීන තැන්පතු, වෙළඳ හා වෙනත් ලැබිය හැකි දේද, ණය මුදල් හා මිල ආරෝපිත හිමිකම් මෙවලම්ද අඩංගු වේ.

3.3.1.2 පසු මානනය

මූල්‍ය වත්කම්හී පසු මානනය පහත විස්තර කෙරෙන වර්ගීකරණය මත රඳා පවතී.

3.3.1.3 ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට මූල්‍ය වත්කම්

අලෙවිය සඳහා දරා සිටින මූල්‍ය වත්කම් සහ ලාභ හෝ පාඩු තුළින් සාධාරණ අගයට මූලික හඳුනා ගැනීමක නියම කරන ලද මූල්‍ය වත්කම්, ලාභ හෝ පාඩු තුළින් සාධාරණ මිල දරන මූල්‍ය වත්කම් තුළ අඩංගු වේ. සමීප කාල සීමාවක් තුළ අලෙවිය දරා සිටින මූල්‍ය වත්කම් ලෙසට වර්ග කෙරේ. ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති අංක 39 මඟින් නිර්වචනය කෙරෙන හෙජින් ගනුදෙනුවකදී උපකරණයක් ලෙසට නම් නොකරන ලද සංස්ථාව ඇතුළත්වී ඇති ව්‍යුත්පන්න මූල්‍ය උපකරණද මෙම ප්‍රභේදයට ඇතුළත් වේ.

බලාත්මක හෙජින් උපකරණ ලෙසට නම් කිරීමකට අයත් නොවන වෙන් කළ, නිහිත කරන ලද ව්‍යුත්පන්නද අලෙවිය සඳහා දරා සිටින වත්කම් ලෙසට වර්ග කෙරේ. ලාභ හෝ පාඩු තුළින් සාධාරණ අගයට පවතින මූල්‍ය වත්කම් ආදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදායම හෝ මූල්‍ය වැය ලෙසට පිළිගැනෙන සාධාරණ අගයේ වෙනස්කම් සහිතව මූල්‍ය තත්වය ප්‍රකාශයේ අඩංගු වේ.

මෑත කාලයේ අලෙවි කිරීමේ බලාපොරොත්තුව තවදුරටත් අනුයෝජන වේද නැද්ද නොතකා සංස්ථාව තම මූල්‍ය වත්කම් ලාභ හෝ පාඩු (අලෙවිය සඳහා දරා සිටින) තුළින් සාධාරණ මිලට අගය විනිශ්චය කෙරේ. අක්‍රීය වෙළඳපොළ හේතුවෙන් සංස්ථාවට අනාගත බලාපොරොත්තුවක් තබා ගැනීමට සැලකිය යුතු පරිදි අපහසු වීම සමග කලමනාකරණයේ අනාගත බලාපොරොත්තුව තුළ සිදුවන සැලකිය යුතු වෙනස් වීම අනුව තත්වය දුර්ලබ වන අවස්ථාවලදී එම මූල්‍ය වත්කම් ප්‍රතිවර්ග කිරීමට තීරණය කළ හැක. එම ප්‍රතිවර්ග කිරීම ණය හා ලබාගත හැකි ලෙසට අලෙවිය සඳහා ඇති හෝ පරිනතිය තෙක් දරා සිටින ලෙසට වර්ග කිරීම වත්කමේ ස්වභාවය අනුව සිදුවනු ඇත.

3.3.1.4පරිනතිය තෙක් දරා සිටින මූල්‍ය වත්කම්

ණය සුරැකුම් පරිනතිය තෙක් දරා සිටීමේ ධනාත්මක අපේක්ෂාව සංස්ථාව සතුවේ නම් එවන් මූල්‍ය වත්කම් පරිනතිය තෙක් දරා සිටින වත්කම් ලෙසට වර්ග කෙරේ. එවන් වත්කම් මූලිකව සාධාරණ මිලට එකතු කළ සෘජු ආරෝපනීය ගනුදෙනු බැර අගයට පිළි ගැනේ. මූලික පිළිගැනීමට අනතුරුව පරිනතිය තෙක් දරා සිටින මූල්‍ය වත්කම් කාලීන ණය නිදහස් පිරිවැයට ගණනය කිරීම බලාත්මක පොලී ක්‍රමය අඩුකළ දුබලත්වයට පත්වීම පාඩු ක්‍රමයට සිදු කෙරේ.

කාලීන ණය නිදහස් කිරීමේ පිරිවැය, ගණනය කිරීමේදී පවරාගැනීම මත වට්ටම් හෝ වාරික බලාත්මක පොලී අනුපාතයෙහි සම්පූර්ණ කොටසක් වන අයකිරීම් හෝ පිරිවැය ද සැලකිල්ලට ගැනේ.

ක්‍රියාත්මක පොළී අනුපාත ක්‍රමක්ෂය ආදායම් ප්‍රකාශයෙහි මූල්‍ය ආදායම තුළ හඳුනා ගැනේ. වත්කම් දුබලත්වයට පත්වීමෙන් උද්ගතවන පාඩු ආදායම් ප්‍රකාශයෙහි මූල්‍ය පිරිවැය තුළ හඳුනා ගැනේ. ආදායම් ප්‍රකාශයේ මූල්‍ය පිරිවැයෙහි අපචය වීම තුළින් සිදුවන පාඩු පිළිගැනීම සිදුවේ.

3.3.1.5 ණය සහ ලැබිය යුතු දෑ

ක්‍රියාකාරී වෙළඳ පොළක උපුටා දැක්වීමක් නොමැති ස්ථිර හෝ නිශ්චයනීය ගෙවීම් සහිත වත්කම් ණය හා ලබාගත හැකි වත්කම් ලෙස සැලකේ. එවන් මූල්‍ය වත්කම් සාධාරණ අගයට එකතු කළ සෘජුව ආරෝපනීය ගණුදෙනු පිරිවැයට අගය කෙරේ. මූලික පිළිගැනීමට අනතුරුව ණය සහ ලබා ගත හැකි දෙය බලාත්මක පොලී ක්‍රමය භාවිතා කර ගණනය කර ප්‍රබලත්වයට පත් වීමේ අලාභ අඩු කෙරේ. මුදල් හා මුදල් සාම්‍යයන් අලෙවිය සහ වෙනත් ලබා ගත හැකි දෑ ණය සහ ලබා ගත හැකි දෑ තුළ අඩංගු වේ.

3.3.1.6අලෙවිය සඳහා ඇති මූල්‍ය වත්කම්

අලෙවිය සඳහා ඇති මූල්‍ය වත්කම් ව්‍යුත්පන්න නොවන ඉහත ප්‍රභේදයන් තුළ මූල්‍ය වත්කම් ලෙසට වර්ග නොකළ වත්කම් වේ. මූලික පිළිගැනීමට අනතුරුව සාධාරණ අගය එකතු කළ සෘජුව ආරෝපනීය ගණුදෙනු පිරිවැයට පිළිගැනේ. සාධාරණ අගය සහ එහි වෙනස්වීම අනුව නිර්දේශ කිරීම දුබලත්වයට පත්වීමේ පාඩු හා විදේශ මුදල් අගය වෙනස්කම් අලෙවිය සඳහා ඇති මූල්‍ය වත්කම් වලට බලපෑම වෙනත් විස්තරාත්මක ආදායම් තුළ පිළිගැනීම සහ හිමිකම් ප්‍රකාශය තුළ සාධාරණ මිල සංචිතයේ ඉදිරිපත් කෙරේ. යම් ආයෝජනයක් පිළි නොගැනීමට ලක්වූවිට හිමිකම් ප්‍රකාශයේ එකතු වූ ලාභ හෝ පාඩු නැවත ලාභ හෝ පාඩු ලෙසට වර්ගීකරණය කෙරේ. අලෙවිය සඳහා ඇති මූල්‍ය වත්කම් හිමිකම් සුරැකුම්පත් සහ ණය සුරැකුම්පත් වලින් සමන්විතවේ.

අලෙවිය සඳහා දරා සිටින මූල්‍ය වත්කම් සංස්ථාව මගින් අගය විනිශ්චය කිරීම තුළින් එය ඉදිරි කාලයේ අලෙවි කිරීමේ බලාපොරොත්තුව තවදුරටත් සුදුසු දැයි නිගමනය කෙරේ. අක්‍රිය වෙළඳපොළ තුළ මෙම වත්කම් අලෙවි කිරීමට සංස්ථාව අපහසුවීම අනුව කලමනාකරණය ඉදිරි කාලය තුළ අලෙවි කිරීම සැලකිය යුතු ලෙසට වෙනස්වේ. දුර්ලබ වාතාවරණයක් තුළදී මෙම මූල්‍ය වත්කම් නැවත වර්ග කිරීමට සංස්ථාවට තෝරාගත හැක. ණය හා ලබාගත හැකි දෙය ප්‍රතිවර්ගීකරණය, අලෙවිය සඳහා සූදානම් හෝ කල් පිරෙන තෙක් රඳවා සිටීම වත්කමේ ස්වභාවය මත තීරණය වේ. පරිනතිය තෙක් දරා සිටින වර්ගය ප්‍රතිවර්ගීකරණය කිරීමට අවසර ලැබෙන්නේ ඒ ආකාරයටය. එම මූල්‍ය වත්කම් රඳවා ගැනීමේ හැකියාව හා අපේක්ෂා සහගත භාවය සතු නම් පමණි.

අලෙවිය සඳහා ලබා ගත හැකි ප්‍රභේදය තුළින් ප්‍රතිවර්ගීකරණය කරන ලද වත්කම් සඳහා එම වත්කම මත මීට පෙර ඇති වූ ලාභය හෝ පාඩුව හිමිකම් තුළ පිළිගැනීමට ලක්ව ලාභ හෝ පාඩු තුළක්‍රමක්ෂය භාවිතා කර එම ආයෝජනයේ ඉතිරි කාලය තුළ සිදු කෙරේ. නව ක්‍රමක්ෂය පිරිවැය සහ අපේක්ෂිත මූල්‍ය ගලනය අතර වෙනසද සළුල පොළී අනුපාතය භාවිතාවෙන් වත්කමේ ඉතිරි කාල සීමාව තුළක්‍රමක්ෂය කෙරේ. ඉන් අනතුරුව එම වත්කම දුබලත්වයට පත්වී ඇතැයි හඳුනා ගැනීමේදී කොටස් හිමිකම්හී සඳහන් මුදල ආදායම් ප්‍රකාශයට ප්‍රතිවර්ග කෙරේ.

3.3.1.7නොපිළිගැනීම

යම් මූල්‍ය වත්කමක් හෝ අදාළ වන යම් වත්කමක කොටසක් නොපිළිගැනීම සිදුවන්නේ එම වත්කමෙන් මුදල් ප්‍රවාහය ලැබීමේ අයිතිය අවසන් වීම, එම වත්කමෙන් මුදල් ප්‍රවාහය ලැබීමේ අයිතිය පවරාදීම හෝ යම් ඒකඟවීමකට අනුව තුන් වැනි පාර්ශ්වයකට ලැබෙන මුදල් ප්‍රවාහය ප්‍රමාදයකින් තොරව මුළුමනින්ම ගෙවීමේ බැඳීමක් උපකල්පනය කිරීම(ආ) එම වත්කමේ සියලු හරවත් අවදානම් හා ප්‍රතිලාභ සංස්ථාව විසින් පවරා දීම (ආ) සංස්ථාව විසින් එම වත්කමේ හරවත් අවදානම් හෝ ප්‍රතිලාභ පවරාදීමක් හෝ රඳවා ගැනීමක් කර නැතත් වත්කමේ පාලනය පවරාදීම තුළය.

සංස්ථාව විසින් එම වත්කමේ හරවත් අවදානම හෝ ප්‍රතිලාභ පවරා දීමක් හෝ රඳවා ගැනීමක් කර නැතත් වත්කමේ පාලනය පවරා දීම නැත්නම් එම වත්කම් පිළිබඳ සංස්ථාව උනන්දුවක් දක්වන ප්‍රමාණයට පිළිගැනීම සිදුවේ. එම තත්වයේදී සංස්ථාව එය ආශ්‍රිත වගකීම් පිළිගනී. සංස්ථාව රඳවාගන්නා අයිතීන් හා බැඳීම් පදනමට පැවරූ වත්කම් ආශ්‍රිත වගකීම් නිර්දේශ වේ. පැවරූ වත්කම් පිළිබඳව පවතින උනන්දුව ඇප වීමක ස්වරූපය ගන්නා අතර එම වත්කමේ මූලික අගය සහ සංස්ථාව ආපසු ගෙවීමට සිදුවන මුදලින් අඩු මිලට එය අනුදේශ කෙරේ.

3.3.1.8 මූල්‍ය වත්කම්හි හායනය

යම් වත්කමක් හෝ වත්කම් සමූහයක් දුබලත්වයට පත් විය හැකි තත්වයක් පෙන්නුම් කරන්නේදැයි යන්න සෑම වාර්තා කරන දිනකම සංස්ථාව මඟින් තක්සේරු කරනු ලැබේ. යම් වත්කමක් හෝ වත්කම් සමූහයක් දුබලත්වයට පත් විය හැකි යැයි සැලකෙන්නේ, සිදු වූ එක් සිද්ධියක් හෝ සිද්ධි කිහිපයක ප්‍රතිඵලයක් ලෙසට පැහැදිලි සාක්ෂි ඇත්නම් පමණි. වත්කමේ මූලික හඳුනා ගැනීමෙන් අනතුරුව එම පාඩු සිදුවීම, එම වත්කමේ හෝ සමූහයේ අනාගත තක්සේරු මූල්‍ය ගලනයට ඇති වන බලපෑම විශ්වාසවන්ත ලෙස තක්සේරු කළ හැක. දුබලත්වයට පත් වීමේ සාක්ෂි තුළ, ණයකරුවන් හෝ ණයකරුවන් සමූහයක් සැලකිය යුතු මූල්‍ය අපහසුතා අත්විඳී නම් ඊට පොලි හෝ මූලධනය ගෙවීම පැහැර හැරීම හෝ අපචාරිය බව, ඔවුන් වස්තු භංගත්වයට හෝ මූල්‍ය ප්‍රතිසංවිධානයන්ට යොමුවීම, විමර්ශනය කළහැකි තොරතුරු මඟින් තක්සේරු කළ අනාගත මූල්‍ය ගලනයේ පෙන්නුම් කරන හිඟ මුදල්, ආර්ථික තත්ව සම්බන්ධ වන පැහැර හැරීම් ඇතුළත් වන්නේය.

3.3.1.9 ක්‍රමක්ෂය පිරිවැයට අනුව ඉදිරියට ගෙනයන මූල්‍ය වත්කම්

ක්‍රමක්ෂය පිරිවැයට ඉදිරියට ගෙනයන මූල්‍ය වත්කම් පිළිබඳ සංස්ථාව පළමුව තක්සේරු කරන්නේ තනි තනිව සැලකිය යුතු වන මූල්‍ය වත්කම් නැතහොත් එසේ තනි තනිව සැලකිය යුතු නොවන මූල්‍ය වත්කම් සම්බන්ධව දුබලත්වයට පත් වීමේ අරමුණුදායක සාක්ෂි නොමැති බව සංස්ථාව හඳුනා ගතහොත්, එය සැලකිය යුතු හෝ එසේ නොමැති වුව ද ඒ හා සමාන බැර අවදානම් ගුණාංග පවතින මූල්‍ය වත්කම් කණ්ඩායමකට එකී වත්කම් ද ඇතුළත් කර සමූලිකව දුබලත්වයට පත් වීම සඳහා තක්සේරු කෙරේ. දුබලත්වයට පත් වීමේ පාඩුවක් සහිත දැනට පවතින වෙන් වශයෙන් දුබලත්ව තක්සේරුවට ලක්කරන හඳුනා ගත් වත්කම් දුබලත්වයට පත් වීමේ සමූලික තක්සේරුව ට ඇතුළත් නොකෙරේ.

දුබලත්වයට පත් වීමේ පාඩුවක් දරා ඇති බවට අරමුණුදායක සාක්ෂි ඇත්නම් එකී පාඩුවේ ප්‍රමාණය වත්කමේ පවතින අගය සහ මෙතෙක් ගණනය නොකළ හර පාඩු නොතකා තක්සේරු කළ ඉදිරි මූල්‍ය ගලනයේ පවතින අගය අතර වෙනස ලෙසට ගණනය කෙරේ. තක්සේරු කළ ඉදිරි මූල්‍ය ගලනයේ දැනට අගය, එකී මූල්‍ය වත්කමේ මුල් ක්‍රියාත්මක පොලී අනුපාතයට වට්ටම් කෙරේ. ණය මුදලක් සම්බන්ධව වෙනස්වන පොලී අනුපාතයක් ඇත්නම් යම් දුබලත්වයට පත් වීමේ අලාභය ගණනය කිරීමේ දී දැනට පවතින පොලී අනුපාතය අදාළ වේ. දීමනා ගිණුමක් භාවිතය තුළින් වත්කමේ ඉදිරියට ගෙනයන අගය අඩුකර පාඩුවේ ප්‍රමාණය ලාභ හා පාඩු වාර්තාවේ පිළිගැනේ. අඩුකළ ගෙනයන ප්‍රමාණයට පොලී ආදායම එකතු කිරීම පවතින අතර, දුබලත්ව අලාභය ගණනය කිරීම සඳහා ද ඉදිරි මූල්‍ය ගලනය වට්ටම් කිරීම සඳහා භාවිතා කරන පොලී අනුපාතය ඒ සඳහා භාවිතා කෙරේ. මූල්‍ය වාර්තාවේ මූල්‍ය ආදායමේ කොටසක් ලෙසට පොලී ආදායම වාර්තා කෙරේ. සියලු සමපාර්ශ්විය අයකිරීම් ලබාගැනීමෙන් පසු ඉදිරියේ දී යථාර්ථ නිරූපිත අපේක්ෂා නොමැති තත්වයේ දී ණය මුදල් ලියා අත්හරී. දුබලත්වයට පත් වීම හඳුනාගැනීමෙන් අනතුරුව ඇතිවූ සිදුවීමක් හේතුවෙන් ඇස්තමේන්තු දුබලත්ව පාඩුව වැඩිවීම් හෝ අඩුවීම් ඉන් පසු වර්ෂයක දී සිදුවුවහොත්, කලින් හඳුනාගත් දුබලත්ව පාඩුව දීමනා ගිණුම සැකසීම මගින් අඩුකිරීම හෝ වැඩිකිරීම සිදුකෙරේ. අනාගතයේ ලියා අස්කරන ලද්දක් පසුව යථා තත්වයට පත්වුවහොත් ලාභ හා පාඩු වාර්තාවේ මූල්‍ය පිරිවැයට එය බැර කෙරේ.

3.3.2 මූල්‍ය වගකීම්

3.3.2.1 මූලික හඳුනාගැනීම සහ මානනය

ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති අංක 39 හි විෂය පථයට ඇතුලත් වන මූල්‍ය වගකීම් ගැළපෙන ආකාරයට ලාභ හා පාඩු ණය සහ ණය ලබා ගැනීම් ක්‍රියාත්මක හෙජින් ගිවිසුමක නියම කල ව්‍යුත්පන්න තුලින් සාධාරණ මිලට පවතින මූල්‍ය වගකීම් ලෙසට වර්ග කෙරේ. මූලික පිළිගැනීමේදී සංස්ථාව තම මූල්‍ය වගකීම් වර්ග හඳුනා ගනී. සියලුම මූල්‍ය වගකීම් ප්‍රථමයෙන් සාධාරණ මිලට හඳුනා ගැනීමද, ණය සහ ණය ලබා ගැනීම ඉදිරියට ගෙන යාම ක්‍රමක්ෂය පිරිවැයටද වේ. මෙයට සෘජුව ආරෝපනීය ගනු දෙනු තුළපිරිවැයද අඩංගුය.

වෙළඳ හා වෙනත් ගෙවිය යුතු බැංකු අයිරා, ණය සහ ණය ලබා ගැනීම් සංස්ථාවේ මූල්‍ය වගකීම් වේ.

3.3.2.2 පසු මානනය

මූල්‍ය වගකීම් නිර්දේශ පහත ආකාරයට වර්ග කිරීම මත රැඳේ.

3.3.2.3 ලාභ හෝ පාඩු තුළින් සාධාරණ අගයට මූල්‍ය වත්කම්

ලාභ හෝ පාඩු තුලින් සාධාරණ අගයට මූල්‍ය වත්කම් තුළ අලෙවිය සඳහා රඳවාගෙන සිටින මූල්‍ය වගකීම්, සහ ලාභ හෝ පාඩු තුළින් ප්‍රථමයෙන්ම සාධාරණ මිලට නම්කර ඇති මූල්‍ය වගකීම් ද අඩංගු වේ. මෑත කාලයේදී අලෙවිය සඳහා අත්කරගෙන ඇත්නම් මූල්‍ය වත්කම අලෙවිය සඳහා දරා සිටින ලෙසට වර්ග කෙරේ. ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති අංක 39 මගින් නිර්වචනය කෙරෙන හෙජ් සම්බන්ධතාවයකදී හෙජින් උපකරණ ලෙසට නියම නොකළ කණ්ඩායමට ඇතුලත් කල මූල්‍ය උපකරණ මෙම ප්‍රභේදය තුළ අඩංගු වේ. බලාත්මක හෙජින් උපකරණ ලෙසට නම් නොකළ වෙන්කළ නිහීන ව්‍යුත්පන්නද අලෙවිය සඳහා දරා සිටින ලෙසට වර්ග කෙරේ.

අලෙවිය සඳහා දරා සිටින වගකීම මත ඇතිවන ලාභ හෝ පාඩු ලාභ හෝ පාඩු තුළ පිළිගැනීමට ලක්වේ.

මූලික පිළිගැනීම අනුව සංස්ථාව මගින් කිසිදු මූල්‍ය වගකීමක් ලාභ හෝ පාඩු තළින් සාධාරණ මිලට පවතින ලෙසට නියම කර නැත.

3.3.2.4 ණය මුදල් හා ණය ගැනුම්

මූලික පිළිගැනීමෙන් පසුව පොලී දරන ණය මුදල් සහ ණය ගැනුම් සඵල පොලී අනුපාතක්‍රමය යොදාගනිමින් ක්‍රමක්ෂය පිරිවැයට අනුව පසුව මානනය කෙරේ. බැරකම් පිළිනොගන්නා විට මෙන්ම සඵල පොලී අනුපාත ක්‍රමයේ ක්‍රමක්ෂය ක්‍රියාවලිය ඔස්සේ ද ආදායම් ප්‍රකාශයෙහි ලාභ සහ අලාභ හඳුනා ගැනේ.

පවරා ගැනීම මත යම් වට්ටමක් හෝ වාරිකයක් සහ සඵල පොලී අනුපාතයෙහි හි සමස්ත කොටසක් වන අය කිරීම හෝ පිරිවැය සැලකිල්ලට ගනිමින් ක්‍රමක්ෂය පිරිවැය ගණනය කෙරේ. ආදායම් ප්‍රකාශයෙහි මූල්‍ය පිරිවැයේ සඵල පොලී අනුපාතයේ ක්‍රමක්ෂය අඩංගු කෙරේ.

3.3.2.5 පිළි නොගැනීම

බැරකම් යටතේ පවතින බැදීම් ඉටු කිරීම, අවලංගු කිරීම හෝ අවලංගු වීම අනුව යම් මූල්‍ය බැරකමක් පිළි නොගැනීමට ලක්වේ.

පවතින මූල්‍ය බැරකමක් එම ණයදායකයාගෙන් හරවත් ලෙසට වෙනස්වූ අනුදේශ හෝ හරවත් ලෙසට වෙනස් කළ පවතින බැරකම් මත පවතින මූල්‍ය බැරකමක් අනුයෝග කළ විට එවන් නුවමාරුවක් හෝ වෙනස් කිරීම මුල් බැරකම පිළි නොගැනීමක් ලෙසට සැලකෙන අතර නව බැරකම පිළිගැනීමක් වේ. එහි අදාළ වත්කම් ප්‍රමාණයන්ගේ වෙනස ආදායම් ප්‍රකාශයේ පිළිගැනීමට ලක්වේ.

3.3.2.6 නීත්‍යානුකූල මූල්‍ය ලේඛන හිලව් කිරීම

පිළිගත් මුදල් හිලව් කිරීම සඳහා ක්‍රියාත්මක කළ හැකි නෛතික අයිතියක් පවතී නම් සහ දළ පදනමක් මත ණය පියවීමට හෝ වත්කම් විකුණා බැරකම් සමගාමීව බේරුම් කිරීමේ චේතනාව පවතීනම් මූල්‍ය වත්කම් හා මූල්‍ය බැරකම් හිලව් කිරීම සහ දළ මුදල් ප්‍රමාණය මූල්‍ය තත්ව ප්‍රකාශයේ වාර්තා කිරීම සිදු කෙරේ. සංස්ථාවේ ගිණුම්කරණ ප්‍රතිපත්ති තුළ විශේෂිතව එළිකර ඇති ආකාරයට, යම් ගිණුම් ප්‍රතිපත්තියක්, හෝ අර්ථ විවරණයක් මගින් අවශ්‍යතාවය හෝ අවසර ලබාදීමක් නොමැති නම් ආදායම් ප්‍රකාශයේ අදායම් සහ වියදම් හිලව් කිරීමක් නොවනු ඇත.

3.3.2.7 මූල්‍ය මෙවලම්හි සාධාරණ මිල

සෑම වාර්තාකරන දිනකම සක්‍රීය වෙළඳ පොළෙහි අලෙවි කෙරෙන මූල්‍ය මෙවලම් හි සාධාරණ මිල ප්‍රකාශිත වෙළඳ පොළ මිල ගණන් හෝ වෙළෙන්දාගේ මිල ප්‍රකාශය, දීර්ඝ අවස්ථා සඳහා ලංසුද, කෙටි අවස්ථා සඳහා ඉල්ලුම් මිලද ගනුදෙනු පිරිවැය සඳහා කිසිදු අඩු කිරීමක් රහිතව සක්‍රීය වෙළඳ පොළක අලෙවි නොකරන මූල්‍ය උපකරණ සඳහා සුදුසු අගැයීමේ තාක්ෂණය භාවිතා කර සාධාරණ මිල නිශ්චය කිරීම සිදුවේ. එවන් තාක්ෂණයක් තුළ මෑතක සිදුවූ අතේ දුර වෙළඳ පොළ ගනුදෙනු ප්‍රමාණවත් ලෙසට සමාන වෙනත් උපකරණයක පවතින සාධාරණ මිලට යොමුව වට්ටම් කළ මූල්‍ය ගලනය විශ්ලේෂණය හෝ වෙනත් ඇගැයීමේ මාදිලි අඩංගු වේ.

මූල්‍ය මෙවලම් සාධාරණ අගය පිළිබඳ විශ්ලේෂණයක් සහ ඒවා ගණනය කරන ආකාරය පිළිබඳ තවදුරටත් විස්තර කිරීමක් සටහන් අංක 23 හි ලබා දී ඇත.

3.4 පශ්චාත් සේවා නියුක්ති ප්‍රතිලාභ

3.4.1 නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම

පුරෝකථනමය ඒකක ණය ක්‍රමය භාවිතාකර රපෝර්තු දිනට පවතින නිශ්චිත ප්‍රතිලාභ බැඳියාවෙහි පවතින වත්කම මූල්‍ය තත්වයේ පිළිඟන්නා බැරකම් වේ. පාරිතෝෂික බැරකමට බාහිරව සදාතන නොවන දැනට පවතින නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම වෙත ලඟාවීමට අවශ්‍ය උපකල්පනයන් සැලැකිල්ලට ගනිමින් පුරෝකථනමය ඒකක ණය ක්‍රමයභාවිතා කර පාරිතෝෂික බැරකම ඇගැයීම සිදු කෙරේ.

කෙසේ වුවද, 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනතට අනුව සේවකයෙකු හට පාරිතෝෂික ගෙවීමේ අවශ්‍යතාවය ඇති වන්නේ වසර පහක අඛණ්ඩ සේවය සම්පූර්ණවීමෙන් පසුවය.

3.4.2. නිශ්චිත දායකත්ව සැලැස්ම - සේවක අර්ථ සාධක අරමුදල හා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල

නිශ්චිත දායකත්ව සැලැස්මක් යනු එක් ආයතනයක් විසින් තවත් ආයතනයක් වෙත පශ්චාත් සේවා නියුක්ති ප්‍රතිලාභ සැලැස්මක් යටතේ ස්ථාවර දායක මුදල් ප්‍රමාණයක් ගෙවීමේ ක්‍රියාදාමය

වන අතර ඒ සඳහා තවදුරටත් පසුව මුදල් ගෙවීම පිණිස නෛතික හෝ සම්ප්‍රයුක්ත බැඳීමක් නොපවතී. සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට හිමිකම් ලබන සියලුම සේවක සේවිකාවෝ ඊට අදාළ අණපනත් අනුව අදාළ දායකත්ව අරමුදල මගින් ආවරණය වන්නාහ. නිශ්චිත දායකත්ව අරමුදලට සේවා යෝජක විසින් කරනු ලබන දායක මුදල් ඒවා දරනු ලබන අවස්ථාවේදී ලාභ හෝ අලාභ තුළවියදම් ලෙස හඳුනා ගැනේ.

3.5. ප්‍රතිපාදන, අවිනිශ්චිත බැරකම් සහ අවිනිශ්චිත වත්කම්

ප්‍රතිපාදන

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන් සංස්ථාව සතුව වර්තමානයෙහි බැඳියාවක් (නෛතික හෝ සම්ප්‍රයුක්ත) පවත්නා විටෙක ආර්ථික ප්‍රතිලාභ සමන්විත සම්පත්වල විගලනයක් අවශ්‍යව ඇති බවටත්, අදාළ බැඳියාව හා සම්බන්ධ මුදල් ප්‍රමාණයෙන් විශ්වාසදායක ඇස්තමේන්තුවක් සකසා ගත හැකි බවටත් අනුමාන කෙරෙන අවස්ථාවේදී ප්‍රතිපාදන හඳුනා ගැනේ. යම් ප්‍රතිපාදනයක ඇතැම් හෝ සියලු මුදල් ප්‍රමාණ ප්‍රතිපූර්ණය කිරීමට සංස්ථාව අපේක්ෂා කරන්නේ නම් , එකී ප්‍රතිපූර්ණය බොහෝ සෙයින් ස්ථිර වන විටෙක එය වෙනමම වත්කමක් ලෙස හඳුනා ගැනේ. කිසියම් ප්‍රතිපාදනයක් සම්බන්ධ වියදම් අදාළ ප්‍රතිපාදන කිසිවකින් තොරව ලාභයෙහි හෝ අලාභයෙහි ඉදිරිපත් කෙරේ. අදාළ මුදලෙහි කාලික වටිනාකම සතු බලපෑම සැලකිය යුතු වකක් වන්නේ නම්, අදාළ නිරූපිත පූර්ව බදු අනුපාතය යොදා ගනිමින් ප්‍රශස්ත පරිදි ප්‍රතිපාදන වට්ටම්ගත කෙරේ. එසේ වට්ටම්ගත කිරීම යොදා ගනු ලබන අවස්ථාවකදී කල් ඉකුත්ව යාමක් සමඟ ප්‍රතිපාදන තුළ ඇතිවන ඉහළ යාම මූල්‍ය පිරිවැයක් ලෙස හඳුනා ගැනේ. ප්‍රතිපාදන ගණනය කෙරෙනුයේ වෙතිහාසික අත්දැකීම් හා ඒ ඒ කරුණට අදාළ නිශ්චිත නියමයන් පදනම් කර ගෙනය. සංස්ථාව ඇස්තමේන්තුවක් වෙත ප්‍රවේශ වනුයේ සිදුවිය හැකි යැයි වඩාත්ම අනුමාන කෙරෙන ගණනය කිරීමේ පදනමක් මතය. මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමෙහිලා සියලුම දන්නා ප්‍රතිපාදන ගණනය කරනු ලැබ ඇත්තේය.

අවිනිශ්චිත බැරකම්

ආර්ථික ප්‍රතිලාභ පැවරුම අනුමාන නොවන්නා වූ හෝ වහා මානනය කළ නොහැකි වන්නා වූ විටෙක අවිනිශ්චිත අනාගත සිදුවීමක් හෝ වර්තමාන බැඳීම් මගින් පමණක් තහවුරු කෙරෙන පැවැත්මක් සහිත සම්භාව්‍ය බැඳියා අවිනිශ්චිත බැරකම් වන්නාහ. තවද, අවින්ශ්චිත බැරකම් මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයෙහි හඳුනාගනු නොලබන අතර එසේ නමුත්, ඒවයේ උද්ගතවීම දුරස්ථ නොවන්නේ නම් පමණක් එහිලා අණාවරණය කිරීමට කටයුතු කෙරේ.

දැනට සංස්ථාව තීන්දුව ලබාදීමට අපේක්ෂිත නීති කෘත්‍ය කීපයකට හා ව්‍යාපාරයේ සාමාන්‍ය කටයුතු පවත්වාගෙන යාමේදී උද්ගත වන හිමිකම් ඉල්ලා සිටීම් කිහිපයකට මුහුණ දී සිටී. නීති ආරවුල් සඳහා වන ප්‍රතිපාදන වශයෙන් උපචිත වී ඇති මුදල් ප්‍රමාණවලට අතිරේක වශයෙන් සංස්ථාවේ මූල්‍ය තත්වය, මෙහෙයුම් ලාභය හෝ මුදල් ප්‍රවාහය කෙරෙහි සැලකිය යුතු බලපෑමක් සිදුකෙරෙනු පිණිස වෙන් වෙන් වශයෙන් හෝ සමුච්චිත වශයෙන් තීන්දු අපේක්ෂිත නීති කෘත්‍ය සහ හිමිකම් ඉල්ලා සිටීම් කිසිවක් සංස්ථාව අපේක්ෂා නොකරයි. අවිනිශ්චිතතාවලට අදාළ හෙළිදරව් කිරීම් 24 වන සටහනෙහි ගෙනහැර දක්වා ඇත.

අවිනිශ්චිත වත්කම්

ආර්ථික ප්‍රතිලාභවල ආගලනය අනුමාන වන්නා වූ කල්හී අවිනිශ්චිත වත්කම් හෙළිදරව් කෙරෙනු ඇත.

3.6 රාජ්‍ය ප්‍රදාන

සියලුම සහසම්බන්ධ කොන්දේසි සපුරා තිබෙන හා ලැබේය යන සාධාරණ තහවුරුවකින් යුතුව හා ප්‍රදානය වියදම් අයිතමයක් සඳහා අදාළ වන විට, පිරිවැය හා සැසඳීමට අදාළ වන වර්ෂයේ ආදායමක් වශයෙන් හඳුනාගතහැකි අවස්ථාවකදී හා එකී ප්‍රදානය මඟින් වියදම් පුර්ණය විමට බලාපොරොත්තුවන්නේද, ප්‍රදානය වත්කමක් සම්බන්ධ වන අවස්ථාවකදී විලම්බිත ආදායම් ගිණුමකට බැර කරන සාධාරණ වටිනාකම වත්කමේ බලාපොරොත්තු වන ප්‍රයෝජනවත් ආයුකාලය ආදායමට සමාන වාර්ෂික වාරික මඟින් නිදහස් කිරීම තුළ රාජ්‍ය ප්‍රදාන වශයෙන් හඳුනාගනු ලැබේ. සංස්ථාවට මූල්‍ය නොවන ප්‍රදාන ලැබෙන අවස්ථාවලදී වත්කම හා ආදායම වාර්තා වනුයේ දළ සාමාන්‍ය වටිනාකමට අනුව හා එය ආදායම් ප්‍රකාශයට නිදහස් කරනුයේ එහි ප්‍රතිලාභ පාරිභෝජනය කරනු ලබන රටාවට අනුව සමාන වාර්ෂික වාරික මඟිනි.

3.7 විස්තිරණ ආදායම් ප්‍රකාශ

3.7.1 ආදායම

සංස්ථාවේ සාමාන්‍ය කටයුතු තුළ වෙළෙඳ වට්ටම් හා විකුණුම් හා බැඳි බදු හැර භාණ්ඩ හෝ සේවා සැපයීම මඟින් ලැබෙන්නාවූ වටිනාකම ආදායම මඟින් නියෝජනය වේ.

3.7.1.1 ආදායම් හඳුනා ගැනීම

ආර්ථික වටිනාකම ආයතනය තුළට ගලා ඒමේ විභවයකදී සහ ආදායම හා එයට අදාළ වියදම විශ්වාසනීයත්වයකින් යුතුව මැනිය හැකි වනතාක් දුරට එවැනි වටිනාකම ආදායම වශයෙන් හඳුනා ගැනේ. ආයතනයේ අභ්‍යන්තර විකුණුම් ඉවත් කර විකුණුම් සඳහා වූ බදු හා වෙළෙඳ වට්ටම් හැර ලැබූ හෝ ලැබේ යැයි සැලකෙන්නා වූ සාධාරණ වටිනාකම ආදායම ලෙස හඳුනා ගනු ලැබේ.

3.7.1.1.1 ඉදිකිරීම් කොන්ත්‍රාත්තු

කොන්ත්‍රාත්තුවක ඇස්තමේන්තුගත ආදායම විශ්වාසනීයව හඳුනා ගැනීමට වාර්තාකරන දිනට කොන්ත්‍රාත් කටයුතු නිමකළ ප්‍රතිශතගත අවස්ථාව වෙත යොමු වී ආදායම හඳුනා ගැනේ. (ප්‍රතිශතගත නිමකළ ක්‍රමය) කොන්ත්‍රාත්තුවේ ආදායම විශ්වාසනීයව ඇස්තමේන්තු කළ නොහැකි අවස්ථාවකදී අඩංගු වන්නේ යැයි සැලකෙන්නාවු හා අයකරගත යුතු සියළුම වියදම් කොන්ත්‍රාත් ආදායම ලෙස හඳුනා ගැනේ. එවැනි විටෙක මුළු වියදම මුළු ආදායමට සම වේ. වියහැකි පාඩු වහාම වියදම් වශයෙන් හඳුනා ගැනේ. නිම කරනු ලබන අදියර මනිනු ලබන්නේ අද දින දක්වා ඉටු කරන ලද වැඩ සඳහා දරනු ලබන පිරිවැයට ඇස්තමේන්තු ගත මුළු පිරිවැය යන අනුපාතයට සැඳහුම් දෙමිනි.

3.7.1.1.2. භාණ්ඩ විකුණුම්

සාමාන්‍ය කටයුතු වලදී භාණ්ඩ අලෙවියෙන් ලැබෙන හෝ ලැබේ යැයි සැලකෙන වෙළෙඳ වට්ටම් හා ප්‍රතිදාන අඩු කිරීමෙන් ලැබෙන ඵලය විකුණුම් මගින් වන සාධාරණ වටිනාකම ලෙස මැනගනු ලැබේ. විකුණු භාණ්ඩය පිළිබඳ ක්‍රියාත්මක පාලනයක් හෝ අයිතිය පිළිබඳව සාමාන්‍යයෙන් භාවිතා කෙරෙන ප්‍රමාණයේ කළමනාකරණ සම්බන්ධයක් සංස්ථාව රඳවා ගැනීමක් නොමැතිව භාණ්ඩ වල සැලකිය යුතු අවදානම හා අයිතිවාසිකම භාණ්ඩ මිලදී ගන්නා වෙත පැවරීම ඉටුකළ පසු භාණ්ඩ විකිණීමෙන් වන අදායම ලෙස හඳුනාගැනේ.

3.7.1.1.3 සේවාවන් පිරිනැමීම.

සියලුම සැලකිය යුතු අන්දමේ ක්‍රියාත්මක වගකීම් ඉටුකළ පසු විස්තිර්ණ ආදායම් ප්‍රකාශයේ සේවාවන් පිරිනැමීමෙන් වන ආදායම ලෙස හඳුනා ගැනේ.

3.7.1.1.4 වෙනත් ආදායම්

දේපළ, යන්ත්‍ර හා උපකරණ බැහැර කිරීමෙන් ලැබෙන ආදායමින් එහි ධාරණ අගය හා අදාළ වියදම් අඩු කිරීමෙන් පසු වන ලාභ හෝ අලාභ වෙනත් ආදායම් ලෙස හඳුනා ගැනේ.

විදේශ විනිමය ලාභ හෝ පාඩු ශුද්ධ පදනමට ගැනේ.

සාමාන්‍යයෙන් භාණ්ඩ ප්‍රවාහනයෙන් භාණ්ඩ අයිතියේ අවදානම හා ප්‍රතිලාභ පැවරෙන පරිදි සුන්බුන් විකුණුමෙන් ආදායම් හඳුනා ගැනේ.

3.7.1.1.5 පොලී ආදායම

ක්‍රමක්ෂය පිරිවැයට අනුව මානනය කරන ලද සියලුම මූල්‍ය පිරිවැය ප්‍රමාණද, අලෙවිය සඳහා පවතින්නේය යනුවෙන් වර්ග කරන ලද පොලී දරන මූල්‍ය වත්කම් ප්‍රමාණද, පොලී ආදායම සහ වියදම් ද සඵල පොලී අනුපාතය යොදාගනිමින් සටහන් කරනු ලැබේ. එකී සඵල පොලී අනුපාතය වනුයේ, අදාළ මූල්‍ය වත්කමෙහි අපේක්ෂිත ආයු කාලය තුළ හෝ ඊට අඩු කාලයක් තුළ එහි ඇස්තමේන්තුගත අනාගත මුදල් ගෙවීම් හෝ ලැබීම් මත හෝ එසේ නොමැතිනම්, උචිත වන පරිදි අදාළ මූල්‍ය වත්කමෙහි හෝ බැරකමෙහි ඉදිරියට ගෙනයන ශුද්ධ වටිනාකම මත නියමාකාරවම වට්ටම්ගත කරනු ලබන අනුපාත ප්‍රමාණයයි.

3.7.2. වියදම් පිළිගැනුම

3.7.2.1. ඉදිකිරීම් කොන්ත්‍රාත්

අනාගතයේදී කොන්ත්‍රාත් ක්‍රියාවලිය සඳහා යම් වත්කම් ඇති කිරීමේදී හැර කොන්ත්‍රාත් වියදම් හඳුනාගැනෙනුයේ ඒවා දරනු ලැබ ඇතැයි යනුවෙන් සලකාය. කොන්ත්‍රාත්තුවක් මත අපේක්ෂිත වන්නා වූ පාඩුවක් ලාභ හෝ අලාභ තුළ වහා හඳුනා ගැනේ.

3.7.2.2.වෙනත් වියදම්

වර්ෂය සඳහා ලාභය තීරණය කිරීමේදී කාර්යක්ෂම තත්වයෙන් ව්‍යාපාරය පවත්වාගෙන යාමෙහිලා දරන ලද සහ දේපළ, පිරියත හා උපකරණ නඩත්තු කිරීමෙහිලා දරන ලද සියලුම වියදම් ආදායම වෙත අයගත කෙරේ. සර්වව්‍යාපී ආදායම් ප්‍රකාශය ඉදිරිපත් කිරීමේ කාර්යය සඳහා සංස්ථාවේ කාර්ය සාධනය පිළිබඳ මූලාංග යුක්ති සහගත ලෙස වියදම් ක්‍රමය ආශ්‍රිත කෘත්‍යතාව විෂයෙහි නියෝජනය වන බවත්, ඒ අනුව එම ඉදිරිපත් කිරීමේ ක්‍රමය අනුගමනය කරනු ලැබ ඇති බවත් අධ්‍යක්ෂ මණ්ඩලයේ මතය වන්නේය.

3.7.2.3. ණය ගැනුම් පිරිවැය

ඉදිකිරීම් හෝ ඉදිකිරීම් සංවර්ධනයේ කාල පරිච්ඡේදය තුළ කිසියම් වත්කමක පිරිවැයෙහි කොටසක් ලෙස ප්‍රාග්ධනය කරනු ලබන දේපළ, පිරියත හා උපකරණ වල ඉදිකිරීම් හා ඉදිකිරීම් සංවර්ධනය ආශ්‍රිත කටයුතුවලට සෘජුවම හේතු කාරක වන ණය ගැනුම් පිරිවැය හැර අනෙකුත් පිරිවැය ඒවා දරනු ලබන කාලපරිච්ඡේදයෙහි සිදුවූ වියදමක් ලෙස අදාළ ණය ගැනුම් පිරිවැය තුළ හඳුනා ගනු ලැබේ.

3.7.2.4. අපේක්ෂිත අලාභ

අපේක්ෂිත අලාභ වියදමක් ලෙස හඳුනා ගැනෙනුයේ, ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවලට අදාළ මුළු පිරිවැය එහි ආදායම ඉක්මවා යනු ඇතැයි අනුමාන කරනු ලබන කල්හිය.

3.7.3 බදුඅය කිරීම

3.7.3.1. පවතින බදු

දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ගෙවන අයකර ගැනීමට බලාපොරොත්තුවන මුදලට පවතින කාල සීමාව හා පෙර කාලසීමාව සඳහා ආදායම් බදු බැරකම් නිර්දේශ කෙරේ. වාර්තා කෙරෙන දිනට පනවා ඇති හෝ ප්‍රමාණවත් ලෙසට පනවා ඇති බදු වරිපනම් සහ බදු නීති භාවිතා කර බදු ප්‍රමාණය ආගණනය කෙරේ. මූල්‍ය ප්‍රකාශයේ වාර්තා කෙරෙන ආදායම් මූලාංගයන් හා වියදම් පදනම් වූ ආදායම් බදු සඳහා ප්‍රතිපාදන දේශීය ආදායම් පනතේ විධිවිධානයන් අනුව ආගණනය කෙරේ.

මූල්‍ය ප්‍රකාශයට කර ඇති සටහන් තුළ අදාළ තොරතුරු හෙලිදරව් කෙරේ.

3.7.3.2විලම්බිත බදුකරණය

විලම්බිත බදුකරණය සම්පාදනය කෙරෙනුයේ, වත්කම්වල හා බැරකම්වල බදු පදනම සහ මූල්‍ය වාර්තාකරණයේ කාර්යයන් සඳහා ඒවායේ ඉදිරියට ගෙන යනු ලබන මුදල් ප්‍රමාණ අතර රපෝර්තු දිනට පවත්නා තාවකාලික වෙනස්කම් මත බැරකම් ක්‍රමවේදය යොදා ගනිමිනි. සියලුම තාවකාලික වෙනස්කම් සඳහා විලම්බිත බදු වත්කම් සහ බැරකම් හඳුනා ගනු ලැබේ. සියලුම අවකරණය කළ හැකි තාවකාලික වෙනස්කම් ද, යොදා නොගැනුණු බදු බැර සහ යොදා නොගැනුණු බදු අලාභවල ඉදිරියට ගෙනයාම්ද, ඒවා අවකරණයකළ හැකි තාවකාලික වෙනස්කම් එල්ලේ බදු වන ලාභයක් පවතින්නේය යනුවෙන් සහ යොදා නොගැනුණු බදු බැර සහ යොදා නොගැනුණු බදු අලාභවල ඉදිරියට ගෙනයාම් උපයෝජනය කරගත හැකි වෙතැයි යනුවෙන් අනුමාන කෙරෙන තාක් දුරකට, විලම්බිත බදු වත්කම් හඳුනා ගැනේ.

විලම්බිත බදු වත්කම් හා බැරකම් මානනය කරනු ලබන්නේ, රපෝර්තු කාලපරිච්ඡේදයේ අවසානයට පනවා ඇති හෝ සැලකිය යුතු අයුරින් ප්‍රමාණවත් ලෙස පනවා ඇති බදු අනුප්‍රමාණ සහ බදු අණපනත් මත පදනම්ව අදාළ වත්කම් උපලබ්ධි වන හෝ බේරුම් කරනු ලබන කල්හී නියමිත වර්ෂයට අදාළ කර ගැනීමට අපේක්ෂා කරනු ලබන බදු අනුප්‍රමාණ අනුවය. ජංගම බදු බැරකම් එල්ලේ ජංගම බදු වත්කම් නිරාකරණය පිණිස නීතිමය වශයෙන් බලාත්මක කළ හැකි අයිතිවාසිකමක් පවතී නම් හා අදාළ විලම්බිත බදු, බදු බැඳියාව දරන එම ව්‍යාපාරයටම සහ බදුකරණ හා සම්බන්ධ එම අධිකාරී ආයතනයටම අදාළ වන්නේනම්, අදාළ බදු වත්කම් හා විලම්බිත බදු බැරකම් හිලවු කිරීමට කටයුතු කරනු ලැබේ. විලම්බිත බදුකරණය සම්පාදනය කෙරෙනුයේ, වත්කම්වල හා බැරකම්වල බදු පදනම සහ මූල්‍ය වාර්තාකරණයේ කාර්යයන් සඳහා ඒවායේ ඉදිරියට ගෙන යනු ලබන මුදල් ප්‍රමාණ අතර රපෝර්තු දිනට පවත්නා තාවකාලික වෙනස්කම් මත බදු බැරකම් ක්‍රමවේදය යොදා ගනිමිනි.

3.8. අදාළ පාර්ශව ආශ්‍රිත ගනුදෙනු

කිසියම් මිලක් අයකරනු ලබන්නේද, නොලබන්නේද යන කාරණය නොසලකා එක් පාර්ශවයක මූල්‍යමය සහ මෙහෙයුම් ප්‍රතිපත්ති/ තීරණ ඉක්මවා පාලන හැකියාවක් ලබා ගැනීමට හෝ සැලකිය යුතු බලපෑමක් ඇති කිරීමට අනෙක් පාර්ශවයට ඉඩ ලැබෙන ගනුදෙනු සම්බන්ධයෙන් හෙලිදරව් කිරීම් සපයනු ලැබ තිබේ. මූල්‍ය ප්‍රකාශයට කර ඇති අදාළ සටහන්හී ඒ හා සම්බන්ධ තොරතුරු අනාවරණය කර ඇත.

3.9. රපෝර්තු කාල පරිච්ඡේදයෙන් පසු උද්ගතවන සිදුවීම්

රපෝර්තු කාල පරිච්ඡේදය අවසානය හා නිකුත් කරනු ලැබීම සඳහා මුල්‍ය ප්‍රකාශ වලට බලය ලබා දෙන අවස්ථාව අතර සිදුවන්නාවූ හිතකර හා හිතකර නොවන සිදුවීම් රපෝර්තු කාල පරිච්ඡේදයෙන් පසු උද්ගත වන්නාවූ සිදුවීම් වන්නේය.

රපෝර්තු කාල පරිච්ඡේදයෙන් පසුව උද්ගත වන සිදුවීම් වල වැදගත්කම සම්බන්ධයෙන් සැලකිල්ල යොමු කෙරෙන අතර අවශ්‍ය අවස්ථාවන්හිදී මුල්‍ය ප්‍රකාශවලට අවශ්‍ය වන්නාවූ ගැළපුම් හෝ ඊට සිදුකළ යුතු සුදුසු හෙළිදරව් කිරීම් සැපයෙනු ඇත.

3.10. බණ්ඩමය වාර්තාකරණය

බණ්ඩයක් යනු අදාළ නිෂ්පාදන හෝ සේවා සැපයීම (ව්‍යාපාරික බණ්ඩය) සඳහා හෝ කිසියම් ආර්ථික පරිසරයක් තුළ නිෂ්පාදන හෝ සේවා සැපයීම (භූගෝලීය බණ්ඩය) සඳහා එකිනෙකට වෙනස්ව හඳුනාගත හැකි ව්‍යාපාර අංගයකි. ඒවා එම බණ්ඩවලින් එකිනෙකට වෙනස් වන්නාවූ අවදානම් හා ප්‍රතිලාභ වලට යටත්ව පවතින්නේය. බණ්ඩමය තොරතුරු ඉදිරිපත් කෙරෙනුයේ සංස්ථාවේ ව්‍යාපාරික හා භූගෝලීය බණ්ඩවලට අදාළ වන පරිදිය. බණ්ඩමය වාර්තාකරණය පිළිබඳ සංස්ථාවේ මූලාකෘතිය පදනම්ව ඇත්තේ ව්‍යාපාරික බණ්ඩ මතය.

ව්‍යාපාරික බණ්ඩ නිශ්චය කෙරෙනුයේ, සංස්ථාවේ කළමනාකරණය හා අභ්‍යන්තර වාර්තාකරණය පිළිබඳ ව්‍යුහය මත පදනම්වය.බණ්ඩ අතර මිල නියම කිරීම් තීරණය වනුයේ අතේ දුරින් පිහිටි පදනමක් මතය. බණ්ඩමය ප්‍රතිඵල වලට, වත්කම්වලට හා බැරකම්වලට යම් බණ්ඩයකට ඍජුවම හේතුකාරක වන්නාවූ විෂයාංග මෙන්ම යුක්ති සහගත පදනමක් මත වෙන්කර දිය හැකි විෂයාංගද අන්තර්ගත වන්නේය.

සංස්ථාවේ ක්‍රියාකාරකම් ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකාව තුළ ස්ථානගත වී ඇත. ඒ හේතුව නිසා සංස්ථාව ස්වකීය මෙහෙයුම් කටයුතු ඉටුකරන ආර්ථික වාතාවරණය භූගෝලීය පදනමක් මත සැලකිය යුතු අයුරින් වෙනස් වන්නාවූ අවදානම් හා ලැබුම් දීමනා වලට යටත් නොවේ. එහෙයින් භූගෝලීය වශයෙන් කෙරෙන හෙළිදරව් කිරීම් මෙහිලා නොසැපයේ.
මුල්‍ය ප්‍රකාශයට කර ඇති අදාළ සටහන්හි ඒ හා සම්බන්ධ තොරතුරු අනාවරණය කර ඇත.

3.11.මුදල් ප්‍රවාහය

මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කර ඇත්තේ මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති අංක 7 අනුව 'වක්‍ර ක්‍රමවේදය' යොදා ගනිමිනි. දන්නා මුදල් ප්‍රමාණවලට වහා පරිවර්තනය කළ හැකි හා වටිනාකමේ වෙනසෙහි සැලකිය යුතු නොවන අවදානමකට යටත් අතැති මුදල්, බැංකුවේ ඇති මුදල් හා කෙටි කාලීන ආයෝජන මුදල් හා මුදල් සාම්‍යයන්ට ඇතුළත් වේ. මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඉදිරිපත් කිරීමේ කාර්යය සඳහා ලත් පොළී හා ලත් ලාභාංශ ආයෝජනමය මුදල් ප්‍රවාහ යටතේ වර්ගීකරණය කරනු ලබන අතර ගෙවූ ලාභාංශ මූල්‍යමය මුදල් ප්‍රවාහ වශයෙනුත්, ගෙවූ පොළී මෙහෙයුම් මුදල් ප්‍රවාහ වශයෙනුත් ඒවා යටතේ වර්ගගත කෙරේ. ඉල්ලා සිටි විට ආපසු ගෙවනු ලැබිය යුතු හා සංස්ථාවේ මූල්‍ය කළමනාකරණය තුළ මුඛ්‍යාංගයක් වන්නාවූ බැංකු අයිරා සහ කෙටිකාලීන ණය ගැනුම් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාර්යයන් සඳහා මුදල් හා මුදල් සාම්‍යයන්හි අංගයක් ලෙස අන්තර්ගත කෙරේ.

4.1. සංසන්දනාත්මක තොරතුරු

ප්‍රවර්තන වර්ෂයේ තොරතුරු වඩා ක්‍රමවත්ව හා එකී තොරතුරු හා සංසන්දනාත්මකව ඉදිරිපත් කිරීම අදාළ වන්නාවූ අවස්ථාවන්හිදී ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශවලට අයත් ඉදිරිපත් කිරීම හා වර්ගීකරණය සංශෝධනයට හසුකර ඇත.

